















# වේගය සහ ප්‍රමිතිය




## වාර්ෂික වාර්තාව 2012

**සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම**

## දැක්ම

ආසියානු කලාපය තුළ කාර්යක්ෂම බවින් හා සුහදත්වයෙන් ප්‍රමුඛතම ගුවන් සේවා කේන්ද්‍රස්ථානය වීම.

## මෙහෙවර

හොඳම පරිචයන් තුලින් තරඟකාරී ගුවන් සේවා පහසුකම් සැපයීමට මෙන්ම අපගේ ආයතනය කෙරේ උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ තෘප්තිමත්භාවය තහවුරු කිරීමට අපි මහත් පරිශ්‍රමයක් දරන්නෙමු.



# වේගය සහ ප්‍රමිතිය

දැඩි තරඟකාරී පරිසරයකදී ජයග්‍රාහකයින් අතර රැඳීමට ගුවන් තොටුපල සභාපති / ප්‍රධාන විධායක නිලධාරි හට නව උපාය මාර්ග නිර්වචනය කිරීමට, නව ව්‍යාපාරික ආකෘති / යටිතල ව්‍යුහයන් සංවර්ධනය කිරීමට, නැවුම් අමිල සංකලනයන් යොදා ගැනීමට අවශ්‍ය වෙයි. එනමුත් එකී ක්‍රියාමාර්ගයන් පමණක් වුවද සුවිශේෂී "උපායමාර්ගික රහසක්" වූ " වේගය සහ ප්‍රමිතිය " සමග මනා ලෙස සංකලනය නොකළේ නම් සංධිස්ථානය කරා ළඟා වීමට සහ ඒවායෙහි ආධිපත්‍ය දරමින් රැඳී සිටීමට පිටිවහල් නොවේ.

ගු.ගු.සේ සමාගමේ ජයග්‍රහණය පිටුපස ඇති සාර්ථකත්වයේ කතාන්දරය එයයි. ගු.ගු.සේ සමාගමේ අපි ඉහළම ප්‍රමිතිය ආරක්ෂා කරන අතර සියලු දේ වේගයෙන් කරමු. ගු.ගු.සේ සමාගමේ ආධිපත්‍යය යටතේ සියලු අදහස් ක්ෂණිකව යථාර්ථයන් බවට පත් වේ. මූලාකෘතියක් ලෙස ඇති කළ එක් නිදර්ශනයක් නම් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලයි (MRIA). පහත සඳහන් සමීකරණය පැහැදිලිවම නිවැරදි බව MRIA විසින් ඔප්පු කර ඇත.

ගු.ගු.සේ සමාගම = වේගය සහ ඉහළ ප්‍රමිතිය

සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම



# අන්තර්ගතය


මූල්‍ය සුවිශේෂිතා 04
කාර්යසාධන සුවිශේෂිතා 05
සභාපතිතුමාගේ සමාලෝචනය 08
අධ්‍යක්ෂ මණ්ඩලය 16
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව 18
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය 24
කළමනාකාරීත්ව සාකච්ඡාව සහ විශ්ලේෂණය 28
මූල්‍ය සමාලෝචනය 40
මානව සම්පත් කළමනාකරණය 50
තිරසාර පැවැත්ම පිළිබඳ කළමනාකරණය 58
යහ පාලනය 66
අවදානම් කළමනාකරණය 72
සමාගමේ ගිණුම් 79
විගණකවරුන්ගේ වාර්තාව 81
ආදායම් ප්‍රකාශනය 82
ශේෂ පත්‍රය 83
ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය 84
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 85
මූල්‍ය ප්‍රකාශන සටහන් 86
ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රකාශනවලට හුවමාරුවීම පැහැදිලි කිරීම 112

වැය ශීර්ෂ අරමුදල් ගිණුම් 118
විගණකාධිපතිතුමාගේ වාර්තාව 119
ආදායම් ප්‍රකාශනය 122
ශේෂ පත්‍රය 123
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 124
මූල්‍ය ප්‍රකාශන සටහන් 125
විගණකාධිපති තුමාගේ වාර්තාව සම්බන්ධව පැහැදිලි කිරීමේ සටහන් 132
ආයතනික තොරතුරු 136


27



# මූල්‍ය සහ කාර්යසාධන සුවිශේෂිතා

“ඔව්, එම සියල්ල ජයග්‍රාහකයින්ගේ කථාන්තරය පිළිබඳවය ....”

# මූල්‍ය සුවිශේෂිතා

| 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | 2012 රු. මිලි. | 2011 රු. මිලි. | +/- %* | 2011 රු. මිලි. | 2010 රු. මිලි. | +/- %* |
|---|---|---|---|---|---|---|
| පිරිවැටුම | 11,114 | 9,290 | 19.6% | 9,290 | 8,272 | 12.3% |
| ක්ෂයකිරීම් වලට පෙර මෙහෙයුම් වියදම් | 5,214 | 4,599 | -13.4% | 4,599 | 3,669 | -25.3% |
| ක්ෂයකිරීම්/බදු/පොළී පෙර වියදම් | 5,899 | 4,692 | 25.7% | 4,692 | 4,603 | 1.9% |
| ස්ථාවර වත්කම් ක්ෂයකිරීම් | 1,011 | 1,135 | 10.9% | 1,135 | (3,024) | -137.5% |
| මූල්‍ය පිරිවැය | 1,030 | 1,417 | 27.3% | 1,417 | 2,018 | 29.8% |
| බදු පෙර ලාභය | 3,859 | 2,140 | 80.3% | 2,140 | 5,609 | -61.8% |
| ආදායම් බදු | 1,121 | 751 | -49.3% | 751 | 721 | -4.2% |
| බදු පසු ලාභය | 2,738 | 1,389 | 97.1% | 1,389 | 4,888 | -71.6% |
| කොටස් හිමියන් අතර බෙදිය හැකි ලාභය | 2,738 | 1,389 | 97.1% | 1,389 | 4,888 | -71.6% |
| ලාභාංශ | - | 2,106 | 100% | 2,106 | 600 | -251% |
| දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමාන ශේෂය | 4,425 | 4,203 | 5.3% | 4,203 | 3,514 | 19.6% |

ජංගම වර්ෂයේ ඉදිරිපත් කිරීම් වලට ගැලපුම් කිරීමට පූර්ව වර්ෂයේ ඉලක්කම් අවශ්‍ය තන්හිදී නැවත සකස් කොට ඇත.

# කාර්ය සාධන සුවිශේෂිතා

| | | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| **මූල්‍ය සුවිශේෂිතා** | | | | |
| මුළු ආදායම | රු. මිලි. | 11,114 | 9,290 | 8,272 |
| බදු පෙර ශුද්ධ ලාභය | රු. මිලි. | 3,859 | 2,140 | 5,609 |
| දෙසැම්බර් 31 දිනට කොටස් හිමියන්ගේ අරමුදල | රු. මිලි. | 4,217 | 1,274 | 1,877 |
| දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල මුළු ධාරන අගය | රු. මිලි. | 42,044 | 25,647 | 15,607 |
| දෙසැම්බර් 31 දිනට මුළු ජංගම වත්කම් | රු. මිලි. | 7,488 | 10,625 | 14,345 |
| දෙසැම්බර් 31 දිනට මුළු ජංගම වගකීම් | රු. මිලි. | 4,181 | 4,011 | 2,953 |
| වර්ෂයේ මුළු ප්‍රාග්ධන වියදම | රු. මිලි. | 17,449 | 9,165 | 544 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන | රු. මිලි. | 4,425 | 4,203 | 7,020 |
| **මෙහෙයුම් සුවිශේෂිතා** | | | | |
| ජාත්‍යන්තර ගුවන්යානා සංචලනය | සංඛ්‍යාව | 48,416 | 43,454 | 34,088 |
| මගී සංචලනය* | සංඛ්‍යාව | 7,079,920 | 6,145,532 | 5,259,648 |
| ගුවන් භාණ්ඩ සංචලනය** | මෙ.ටො. | 186,618 | 168,577 | 167,130 |
| දෙසැම්බර් 31 දිනට මුළු සේවක ගණන | සංඛ්‍යාව | 3,445 | 3,306 | 3,179 |
| **අනුපාත සුවිශේෂිතාවන්** | | | | |
| මුළු ආදායමට බදු පෙර ශුද්ධ ලාභය | % | 34.7 | 23 | 67.8 |
| කොටස්හිමි අරමුදලට බදු පෙර ශුද්ධ ලාභය | % | 91.5 | 167.9 | 298.9 |
| මුළු වත්කම් වලට මුළු ආදායම | වාර | 0.2 | 0.3 | 0.3 |
| ජංගම වගකීම් වලට ජංගම වත්කම් | වාර | 1.8 | 2.6 | 4.9 |
| සේවකයකුට මුළු වත්කම් | රු.'000 | 14,378 | 10,972 | 9,422 |
| සේවකයකුට මුළු කාර්ය මණ්ඩල පිරිවැය | රු.'000 | 1,020.2 | 942.0 | 887.8 |
| මගියකුට ආදායම | රු. | 1,570 | 1,512 | 1,573 |
| මගියකුට බදු පසු ලාභය | රු. | 387 | 226 | 929 |
| සේවකයකුට ගුවන්යානා සංචලන | සංඛ්‍යාව | 14 | 13 | 11 |
| ගුවන්යානයකට මගීන් | සංඛ්‍යාව | 146 | 141 | 154 |
| සේවකයකුට මගීන් | සංඛ්‍යාව | 2,055 | 1,859 | 1,654 |
| හැසිරවූ ගුවන් ගමනකට මුළු පිරිවැය | රු.'000 | 164.4 | 176.4 | 123.1 |
| ශුද්ධ වත්කම් මත ප්‍රතිලාභ | % | 65 | 109 | 260 |
| මුළු වත්කම් මත ප්‍රතිලාභ | % | 6 | 4 | 16 |
| කොටසක ඉපැයුම | රු. | 13,688 | 6,943 | 24,441 |
| ලාභදායිතා අනුපාතය | % | 25 | 15 | 59 |
| ක්ෂණික වත්කම් අනුපාතය | වාර | 1.7 | 2.6 | 4.8 |
| මුළු වියදමට මුළු ආදායම | වාර | 1.5 | 1.3 | 3.1 |

* මගී සංචලතාවල පැමිණීම, පිටත්වීම, මාරුවීම සහ මාර්ගස්ථ මගීන් ඇතුලත් වේ. මාරුවීම් සහ මාර්ගස්ථ මගීන් දෙවරක් ගනනය කොට ඇත.

** ගුවන් භාණ්ඩ සංචලතා වලට නිර්යාත, ආයාත සහ හුවමාරු භාණ්ඩ (දෙවරක් ගනනය කොට ඇත) ඇතුලත් වේ. ගුවන් ලිපි ඇතුලත් නොවේ.



# සභාපතිතුමාගේ සමාලෝචනය

“නායකත්ව භූමිකාව ... අභ්‍යන්තර කාර්යසාධනය පිළිබඳව දැඩි සෝදිසියක් පවත්වා ගෙන යන අතරම පැහැදිලි උපාය මාර්ගික මාවතක ඉදිරියෙන් සංතරණය ...”


4R-ALA

# සභාපතිතුමාගේ සමාලෝචනය



**ප්‍රසන්න ජේ වික්‍රමසූරිය** *ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී*
**සභාපති**

**අපි මෙරට භාරකරුවන් වෙමු. තරුණ ජනයා සඳහා තිරසාර සහ සංවර්ධනය පාදක කොට ගත් ප්‍රගතිශීලී රටක් ගොඩ නැගීම අපට පැවරී ඇත. එය අප බරපතල ලෙස සිතට ගත යුතුය. අප වෙත පවරනු ලැබ ඇති වගකීම එය වන අතර ගු ගු සේ සමාගමේ අප විසින් කරනු ලබන සියලු දෙයෙහි හරය ලෙස එම වගකීම රැඳී පවතී.**

### මුළු ආදායම

රු. 11.11 බිලි. 20% කින්

### මුළු වියදම

රු. 7.9 බිලි. 1% කින්

### බදු පෙර ලාභය

රු. 3.9 බිලි. 80% කින්

### බදු පසු ලාභය

රු. 2.7 බිලි. 97% කින්

### මුළු ස්කන්ධ

රු. 4.21 බිලි. 231% කින්

### මුළු වත්කම්

රු. 49.5 බිලි. 37% කින්

### කොටසක ඉපැයුම

රු. 13,688 97% කින්

**හිතවත් කොටස් හිමියනි**

රටක් ලෙස ශ්‍රී ලංකාව තුල අප දකින පරිවර්තනය නම් ශ්‍රී ලංකාව 2015 දී දකුණු ආසියානු කලාපයේ ගුවන් කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමේ ජාතික දැක්ම දෙසට ගමන් කරවීමයි. මෙම තත්වය යටතේ අප සී/ස ගුවන් තොටුපල සහ ගුවන් සේවා ( ශ්‍රී ලංකා) සමාගම ලෙස ජාතික දැක්ම සමග ප්‍රශස්ථ ලෙස සමගාමී වන නමුත් ආසියානු කලාපයේ ගුවන් කේන්ද්‍රස්ථානයේ නියමුවා ලෙස ඉහළ ස්ථාවරයකට ළඟා වීම පිළිබඳ අපේම වූ දැක්මක්ද ගොඩ නගා ගෙන ඇත. ගෝලීය කුඩා කොටසක් ලෙස අපගේ අභියෝග විශාල වන බවත් ජයග්‍රහණයට ඇති බාධක බොහෝ බවත් අපි දනිමු. නමුත් අප නිතරම විශ්වාස කරන පරිදි අහස පවා අපව සීමා නොකරනු ඇත. අපි විසල් ලෙස සිහින දැකිය යුතුය. අපි පුළුල් ලෙස සිහින දැකිය යුතුය. අපේ දෘෂ්ඨි රේඛාවට ඔබ්බෙන් ඇති ක්ෂිතිජය අප දැකිය යුතුය. අප නිතරම අපගේ දැක්ම අත්පත් කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව සර්වශුභවාදී සහ ආධානග්‍රාහී විය යුතුය.

අපගේ සැලසුම් බාහිර තර්ජන සැලකිල්ලට ලක් කරමින් හොඳින් හිතා බැලූ සහ ක්‍රියාත්මක කළ හැකි ඒවා විය යුතු අතර අපගේ දුර්වලතා පිළිබඳ අවබෝධයක් අපට තිබිය යුතුය. ඒ සමගම අප වටා නිතරම පවතින අවස්ථා අප විසින් ප්‍රසස්ථ ලෙස ප්‍රයෝජනයට ගත යුතු අතර ඒවා උපරිමයෙන් ප්‍රයෝජනයට ගන්නා බව සහතික කළ යුතුය. මන්ද අද අප තබන මුල් ගල් සහ තනන සැකිලි අප වෙනුවෙන් නොව අනාගත පරම්පරාවන් සඳහා අප ඉතිරි කර තබන උරුමයන් බැවිනි. අපි මෙරට භාරකරුවන් වෙමු. අපගේ තරුණ ජනයා වෙනුවෙන් තිරසාර පැවැත්ම සහ සංවර්ධනය පාදක කොට ගත් ප්‍රගතිශීලී රටක් ගොඩ නැගීම අපට පැවරී ඇත. එය අප විසින් දැඩි ලෙස ග්‍රහණය කර ගත යුතුය. අප වෙත පවරනු ලැබ ඇති වගකීම එය වන අතර සී/ස ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම තුල අප විසින් කරනු ලබන සියලු දෙයෙහි හරය ලෙස එම වගකීම රැඳී පවතී.

මෙම පසුබිම යටතේ හිතවත් කොටස් හිමියනි, මම සී/ස ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඔබ වෙත ඉදිරිපත් කරමි.

**2012 දෙස ආපසු බැලීම**

එය සහතික ලෙසම ගෝලීය ආර්ථිකය තුල පහසු වසරක් නොවුනි. මහත් ව්‍යසනකාරී මූල්‍ය කඩා වැටීමක ආරම්භයකින් වසර හතරකට පසු බොහෝ සංවර්ධිත රටවල් නොසන්සුන් අස්ථාවර බව, ද්විත්ව ආර්ථික අවපාත, රැකියාවලින් පිටමං කිරීම් සහ සමහර විට බුන්වත් වීම් වැනි අගාධයන්ට හසුව පැවති නිසා ඉන් ගොඩ ඒම සඳහා අරගල කරන්නට විය. සංවර්ධිත ආර්ථිකයන් සැලකිය යුතු ගණනක් ඉහළ සේවා වියුක්තිය, දුර්වල දේශීය ඉල්ලුම මධ්‍යයේ කෙටිකාලීන මූල්‍යමය අවහිරතා වල අවදානම, ඉහළ රාජ්‍ය ණය බර, රන් පවුම් අවදානම වැඩිවීම සහ මූල්‍යමය අංශයේ වැටීම වැනි හේතු නිසා සර්පිලාකාර ලෙස පහත වැටුනු ගතිකත්වයක් අත්දකින ලදී. බ්‍රිතාන්‍ය, රුසියාව, ඉන්දියාව, චීන ආර්ථික (BRIC) හා ආසියා, මැද පෙරදිග, අප්‍රිකා සහ අනෙකුත් දියුණු වෙමින් පවත්නා ආර්ථිකයන් උච්චාවචනයන් ආරක්ෂා කර ගනිමින් ඉහළ අපේක්ෂා පවත්වා ගත් නමුත් දියුණු ආර්ථිකයන්හි දැඩි බලපෑම විශේෂයෙන්ම විදේශ වෙළඳ අනුපාතය මගින් එම රටවල ආර්ථික වර්ධනයක් පෙන්නුම් කළද අපේක්ෂිත මට්ටම

**මෙම වාර්තාවේ ඉදිරිපත් කරනු ලබන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ගු ගු සේ සමාගම අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන් (IFRS) යොදා ගත් තැන් සිට පළමු වරට ඉදිරිපත් කරනු ලබන ඒවා වන අතර එම පැහැදිලි අනුකූලතාවය පවත්වා ගැනීමට අපගේ කැපවීම තිරසාර ලෙස තහවුරු කරයි.**

දක්වා නැගීම අවහිර කරන ලදී. අඩු ආදායම් ආර්ථිකයන් මෙම අහිතකර කාල පරිච්ඡේදය තුල යහපත් කාර්යසාධනයක් අත් කර ගත් බව පෙන්වුවද බාහිර අවදානම් තත්වයන් තදින් ප්‍රත්‍යක්ෂ කර ගන්නා ලදී.

**අර්බුදකාරී අවධියකදී ගු ගු සේ සමාගම කාර්යභාරය**

ගු.ගු.සේ සමාගමෙහි අපි "නොහැක්කක් නොමැත" යන හරයාත්මක අදිටන අපේම කර ගත්තෙමු. පසු ගිය දශක තුන තුලදී සමහර සීමාන්තික අභියෝග ජය ගත් ගු ගු සේ සමාගමෙහි ආදර්ශ පාඨය වූ සියලු කල්හි සර්වශුභවාදී විය යුතුය යන්න අපගේ දියුණුවෙහි සාර්ථකත්වයෙහි සහ ජයග්‍රාහිකත්වයෙහි මහෞෂධය විය. අපගේ දුර්වලතා නිවැරදි කිරීම සහ පවත්නා පරතරයන් සවිඥ්ඥණක ලෙස සොයා බලා ඒවා නැති කිරීම කෙරේ අවධානය යොමු කරමින් අපගේ ගැටලු සහ අභියෝග ආධානග්‍රාහී ලෙස ප්‍රත්‍යක්ෂ කොට ගත් බැව් අපි නිතර විශ්වාස කළෙමු. එමනිසා මෙම පසුබිම සාම්ප්‍රදායික වෙළඳපල තවදුරටත් ගෙන යා නොහැකි සීමාවන් විනිවිද දැක්වූ ගෝලීය ආර්ථික කඩා වැටීම දෙස සර්වශුභවාදී ලෙස බැලීමට මග පෙන්වන ලදී. අපගේ විශාලතම වෙළඳ සහ සංචාරක වෙළඳ පල වූ යුරෝපය ගෝලීය මූල්‍යමය පහත වැටීම මගින් ඇතිවූ සෘණාත්මක බලපෑම් නිසා බලවත් ලෙස පීඩා විඳි බව සහ එක තැන පල් වූ ගෝලීය වටපිටාව මගින් අවුරනු ලැබ කල් තබා පැමිණි ගැටළු නිසැක ලෙස සංචාරක කර්මාන්තය වෙළඳාම හා ගුවන් සේවා අංශ වෙත සැලකිය යුතු ලෙස බලපෑ බව සඳහන් කිරීම උචිතය.

ගු.ගු.සේ සමාගම පසු ගිය වර්ෂයේ වාර්තාගත ලාභ මත ගොඩ නැගෙමින් පසු ගිය වසරේ රු බිලියන 1 . 38 ට සන්සන්දනාත්මකව 2012 වර්ෂයේ බදු පසු ලාභය රු බිලියන 2.73 ක් එනම් 97% ක වැඩිවීමක් දක්වා වූ ගතික වර්ධනයක් පවත්වා ගැනීම අතිශයින්ම ප්‍රශංසාත්මකය. මෙම වාර්තාවේ පසුව එන පිටුවල දැක්වෙන මූල්‍ය සමාලෝචනයෙන් සවිස්තරාත්මක විස්තරයක් ඉදිරිපත් කරන අතරම මම අපගේ මූල්‍ය කාර්යසාධනය සංක්ෂිප්තව පහතින් දක්වමි.

ගු.ගු.සේ සමාගම එහි ආදායම, ලාභය සහ ජාතික ආර්ථිකයට බදු මගින් කළ දායකත්වයේ සුවිශේෂී වර්ධන රේඛාවන් වාර්තා කළ බවද සඳහන් කළ යුතුය.

මුළු ආදායම 19.6% කින් එනම් රු බිලියන 11.1 කින් වැඩි වී ඇති අතර බදු වලට පෙර ලාභය රු බිලියන 3.9 ක් ලෙස එනම් 80.3% ක සැලකිය යුතු වර්ධනයක් පෙන්වයි. ජාතික සංවර්ධන සැලසුම් සමග සමගාමී වූ ව්‍යාපාරික ක්ෂේත්‍ර සංවර්ධනය හේතුවෙන් රු බිලියන 7.9 ක් ලෙස සටහන් වූ මුළු වියදමෙහි 4% ක ආන්තික වැඩි වීමක් පෙන්නුම් කරයි. ශේෂ පත්‍රයෙහි මුළු වත්කම් රු බිලියන 49.5 ක් එනම් 37% ක වැඩිවීමක් පෙන්නුම් කරන අතර රු බිලියන 4.2 ක් වූ ස්කන්ධ ප්‍රාග්ධනයේ 231% ක වර්ධනයක් සටහන්ව ඇත. රු 13,687.57 ක් ලෙස සටහන් වූ කොටසක ඉපැයුම සැලකිය යුතු වර්ධනයක් එනම් 97.1ක් ලෙස පෙන්වීම පිළිබඳව අප කොටස් හිමියන් බොහෝ සෙයින් සතුටු වනු ඇත.

ආදායම් ධාරාවෙහි අංශ ගත් කළ ගුවන් තොටුපල මුළු ආදායම 2011 වර්ෂයේ රු බිලියන 9.3 සමග සැසඳීමේදී 19.6% කින් එනම් රු බිලියන 11.11 ක් දක්වා වැඩිවී ඇත. ඒ අතර ගගන නාවික ආදායම රු බිලියන 2.7 ක එනම් 26% ක වර්ධනයක් පෙන්වයි. ගගන නාවික නොවන ආදායම් ද රු බිලියන 8 ක් දක්වා 17% කින් වැඩිවී ඇත. 2011 වර්ෂයේ රු මිලියන 331 ක් වූ අනෙකුත් ආදායම් ද රු මිලියන 426 ක් දක්වා එනම් 29% ක ඉහළට නැඹුරුවක් පෙන්වයි. මෙහිදී රු මිලියන 704 ක පොලී ආදායමෙහි රුපියල ක්ෂය කිරීමෙන් ලද රු මිලියන 255 ක විනිමය වාසිය මූලික හේතුවවී ඇත.

සමාගමෙහි මූල්‍ය කළමනාකරනය නිතරම අවදානමට එරෙහි ප්‍රතිලාභ ආධානග්‍රාහී ලෙස කළමනාකරණය කල විචක්ෂණ එකක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස ස්ථාවර තැන්පතු වල ආයෝජන ආදායම රු මිලියන 74 සිට රු මිලියන 99 දක්වා 32% කින්ද ණයකර රු මිලියන 40 සිට 266 දක්වා 563% කින් ද වැඩිවී ඇත.

ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී සංචාරක සංවර්ධන ධාවකයෙහි ප්‍රතිඵලයක් ලෙස 15% ක වැඩි වීමක් පෙන්වන මගී සංඛ්‍යාවෙහි වර්ධනය මගින් මූල්‍ය වර්ධන ප්‍රතිඵල තියුණු ලෙස ආලෝකවත් කොට ඇත. ජාතික ඉලක්කය වන්නේ 2016 වන විට රටට පැමිණෙන සංචාරකයින්ගේ ගණන මිලියන 2. 5 දක්වා වර්ධනය කිරීමයි. 2012 වර්ෂයේදී පිහිටුවා ගත් ඉලක්කයන්ටත් වඩා මගීන්ගේ පැමිණීමෙහි මිලියන එකක වැඩි වීමක් පෙන්නුම් කරයි. මුළු මගී සංචරනය 2011 දී 6,145,532 සිට 2012 දී 7,079,920 ක් දක්වා එනම් 15% කින් වැඩිවී ඇති අතර ඉලක්කම් දෙකම බ ජා ගු තොටුපලෙහි ධාරිතාවය ඉක්මවන්නක් වෙයි.

මගී ජනගහණයේ මූලික වෙනස ශ්‍රී ලංකා සංචාරක ආදර්ශය හරහා ප්‍රත්‍යක්ෂ වෙයි. මැද පෙරදිග කලාපයේ සුළු පහත වැටීමක් නිරීක්ෂණය කළද 2011 වසරට සන්සන්දනාත්මකව නැගෙනහිර යුරෝපය (43.6%), අප්‍රිකාව (39.6%), නැගෙනහිර ආසියාව (38%), ලතින් ඇමරිකා සහ කැරිබියන් (56%) යන රටවලින් ශක්තිමත් වර්ධනයක් හට ගෙන ඇත. රටක සාපේක්ෂය ගත් කළ යුක්රේනය 124% ක බලවත් වර්ධනයක්ද පිලිපීනය 178% ක සිත් ඇද ගන්නා සුළු වර්ධනයක්ද, තායිවානය 81% ක වර්ධනයක්ද සටහන් කොට ඇත. ධනාත්මක අන්තර්ජාතික සංචාරක සමාලෝචනයන් ගෙන් දිරිමත් වෙමින් ශ්‍රී ලංකාව ලෝකයේ උස් උද්යෝගිමත් සංචාරක ගමනාන්තයන් සහිත ස්ථාන අතරට තිර ලෙසම පිවිස ඇත.

ලෝකයේ තාක්ෂණික තත්වයන්ගෙන් වඩාත් විශිෂ්ඨත්වයට පත්වූ වාණිජමය ගුවන් යානා වන A 380 ගුවන් බස් ඉන්ධන පිරවීම සඳහා බ.ජා.ගු තොටුපලට ගොඩ බැස්සවීම සහ A 320 ගුවන් බස් 32 ක පද්ධතියක් ඇති ටයිගර් ගුවන් සේවාවේ ගුවන් බස් බ.ජා.ගු වෙත ළඟා වීම මගින් මෙම තත්වය තවදුරටත් අවධාරණය කරනු ලබයි. සමාලෝචනයට පාත්‍ර වූ වර්ෂය තුල බ.ජා.ගු තොටුපලෙහි ගුවන් යානාවල මුළු සංචලනය 2011 වාර්තා වූ 43,454 සිට 2012 වර්ෂයේ 48,416 ක් දක්වා 12% කින් වැඩිවී ඇත. එසේම ගුවන් නාවික භාණ්ඩ තොගය මෙ. ටො. 168,577 සිට 186,618 දක්වා 11% කින් වැඩිවී ඇත.

**ගු.ගු.සේ සමාගමෙහි උපායමාර්ගය වූ 4ජී වර්ධන ආකෘතිය සංවර්ධනය කිරීම**

අප විසින් පිහිටුවා ගනු ලැබූ 4ජී වර්ධන ආකෘතිය අප ව්‍යාපාරය වේගයෙන් වර්ධනය වීමට පටන් ගත් අවධියෙහි කාර්යක්ෂම සහ ඵලදායි ලෙස සමාජමය වගකීමක් සහිත පසු බිමක නිසැක ලෙස

ගොඩ නැගුමක් විය. ඉහතින් සඳහන් කළ පරිදි ගුවන් සේවා අංශය වර්ධනයක් දැකිය නොහැකි තරමේ වියවුලකට මුහුණ පා තිබුනි. උද්ඝෝෂණික ක්‍රියාමාර්ග දෛනික සිදුවීම් වූ අතර විදිශාවටම හැමූ වාසුලියක් විය. කර්මාන්තය ස්ථිර අර්බුදයකට පත්ව තිබූ නිසාම ක්ෂණික පැනය වූයේ 'අර්බුද ස්වභාවය අඩුවන තුරු රැඳී සිටිනවාද නැතහොත් වඩා හොඳ අවධියකට පත්වීම සඳහා අප විසින් මෙහෙයුමක් ක්‍රියාත්මක කරනවාද' යන්නයි. පිළිතුර සරල එකක් විය. පියාසර කරන්න! අවස්ථා සහ තර්ජන වර්ධනයේ මංමාවත් ලෙස සලකා අපි අභියෝග නිරීක්ෂණය කිරීමට පටන් ගතිමු.

එමගින් 4පී වර්ධන ආකෘතිය අප කේන්ද්‍රයේ පූර්ණ පරිවර්තනයක් පෙන්නුම් කරන්නක් විය. එනම් ප්‍රතික්‍රියාකාරක යටිතල පහසුකම් තනන්නෙකුගේ සහ සේවා සපයන්නෙකුගේ සිට ගු ගු සේ සමාගම උනන්දුකාර පාර්ශවයන්, අලෙවිකරණය, පුහුණුව සහ සංවර්ධනය සහ තොරතුරු තාක්ෂණය සඳහාවූ ප්‍රගාමී උපායමාර්ගික වර්ධන යාන්ත්‍රණයක් බවට පත් විය. 4පී වර්ධන ආකෘතිය අපගේ ව්‍යාපාර වර්ධනය පෝෂණය කරන සහ ජවය සපයන අත්‍යවශ්‍ය මූලධර්මයක් එකතු කරන මෙන්ම ආයතනය උදෙසා වූ මහින්ද චින්තන දැක්මේ මතුකර දක්වා ඇති පරිදි කලාපීය ගුවන් සේවා කේන්ද්‍රස්ථානය දෙසට ගු.ගු.සේ සමාගම ගෙන යාමේ උත්තේජකයක් වන අතර අපි දැන් රටෙහි සංවර්ධන න්‍යාය පත්‍රයෙහි අනුල්ලංඝනීය එකතු කළ වටිනාකමක් බවට හොඳින් තහවුරු වී ඇත.

2013 - 2017 දක්වාවූ අපගේ උපායමාර්ගික සැලැසුම පිළිබඳව 2013 ජනවාරියේදී උද්‍යෝගී පාර්ශවයන් සමග පැවැත්වූ ප්‍රගාමී සාකච්ඡා අතිශයින්ම අවබෝධාත්මක විය. ඔබ අප අනාගත සැලසුම් වල කොටස් කරුවන් කිරීමට අපගේ තේමාව වූ හොඳම ගුවන් සේවා සූත්‍රය ඔබ සමග බෙදා ගැනීම සභාපති ලෙස මට මහත් සතුටක් ගෙන දෙන්නක් වේ. මෙම සාකච්ඡාවේදී අපගේ බාහිර උනන්දු පාර්ශවයන් විසින් ඉදිරිපත් කළ තවත් ධනාත්මක අංගයක් වූයේ ප්‍රමුඛ සැලසුම් උපාය මාර්ග හඳුනා ගැනීමට සහ පොදු ක්‍රියාකාරකම් මත බලපෑම් කරනු වස් මිනුම් අවිලනය කිරීමට අපට ඇති හැකියාවයි. අප රටෙහි සංවර්ධනය දෙසට සාමූහිකව දායක වන්නේ නම් මෙම සාකච්ඡා මණ්ඩපය ප්‍රගතිශීලී ද්වීපාර්ශවික සංවාද සඳහා මං විවර කරන්නක් විය. සහභාගි වූ කොටස් හිමියන් අතර සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, ශ්‍රී ලංකන් ගුවන් සමාගම , මහා භාණ්ඩාගාරය, සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, SLAITO,SLAAR, TAASL, SLFFA, STING consultants සහ පද්ධති විසඳුම් සපයන්නා වූ e-wis ද වූහ.

**සංධිස්ථාන නිර්ඛනය, ඒවායේ රැඳෙමින් ආධිපත්‍ය පැතිරවීම**

රටෙහි වඩාත්ම සුවිශේෂී අවස්ථාවක් වූයේ 2013 මාර්තුවේදී එහි මුල් සැලසුම් අනුව ආරම්භ කළ ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල වන හම්බන්තොට මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපල සම්පූර්ණ කිරීම වෙනුවෙන් වූ ප්‍රගතියයි. මෙම වාර්ෂික වාර්තාව තුල 2012 දෙසැම්බර් අවසානය දක්වාවූ මෙහෙයුම් කාර්යසාධන පමණක් ආවරණය වුවත් මගේ පණිවුඩය දෙනු ලබන්නේ 2013 ජුනි 18 බැවින් මෙම ජයග්‍රාහී අත්පත් කරගැනීම පිළිබඳව මෙම වාර්තාවේ සටහන් කිරීම උචිත වේ. පාකිස්ථානයේ සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් සුපර් කිංග් 200 විශේෂ වෙරළ ගුවන් යානා පාවිච්චි කරමින් ක්‍රියාත්මත කරන ලද ගුවන් යාත්‍රා ආධාරක සහ අනෙකුත් අදාල උපකරණ නිමානය කිරීම සඳහා වූ පළමු පරීක්ෂණ ගුවන් යානය 2012 ඔක්තෝබර් මාසයේදී මෙහි ගොඩ බස්සවන ලදී. ගුවන්යාත්‍රා ආධාරක සහ සියළු උපකරණ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලබව ස්ථිර කරමින් සත්‍යාපනය කරන ලදී.

මහින්ද චින්තන සංවර්ධන දැක්ම යටතේ ශ්‍රී ලංකා සීඝ්‍ර සංවර්ධන වැඩ සටහනෙහි ප්‍රධාන අංගයක් වූ මෙම ගුවන් තොටුපල වැඩිවන සංචාරක සංඛ්‍යාව පෝෂණය කිරීම පමණක් නොව ශ්‍රී ලංකාවේ අහස සහ මුහුද යන දෙකෙහිම වූ භූගෝලීය වාසි උකහා ගනිමින් අපේක්ෂිත ගෝලීය වෙළඳාමේ සහ වාණිජ්‍යයේ වේගවත් වර්ධනය වෙනුවෙන් දෙවන අන්තර්ජාතික ගුවන් තොටුපලක අවශ්‍යතාවය සපුරාලයි. හම්බන්තොට වරාය සම්පූර්ණ වීමත් සමග ගුවන් තොටුපල වෙළඳ කලාප සඳහාවූ සියලු අවශ්‍යතා සපයන මධ්‍යස්ථානයක් මෙන්ම ගුවන් නැව් භාණ්ඩ සහ මගී කේන්ද්‍රස්ථානයක් සහ සැලකිය යුතු ආකාරයක සෘජු සහ වක්‍ර රැකියා උත්පාදනය කරන්නක් වෙයි.

ගු.ගු.සේ සමාගම මෙම ව්‍යාපෘතියෙහි පෙර ගමන්කරු වීම ආඩම්බරයට කරුණකි. ව්‍යාපෘතියේ පළවන අදියර වූ ඇ. ඩොලර් මිලියන 209 ක ඇස්තමේන්තුගත ආයෝජනයෙන් දේශීය ආයෝජනය ඇ. ඩොලර් මිලියන 19 ක් සහ සහනදායි ණය යටතේ චීනයේ එක්සිම් බැංකුව මගින් ඇ. ඩොලර් මිලියන 190 ක ආයේජනයක් එයින් පෙන්වයි. මෙය තවදුරටත් අවධාරණය කරන්නේ රටෙහි සංවර්ධන සැලසුමෙහි ප්‍රධාන දායකයා ලෙස අපගේ කැපවීමයි. අනාගත පරපුරට සහතික ලෙසම ගොඩනැගිය හැකි සැකිලි සහ යටිතල ව්‍යුහයන් ආරම්භ කරන සහ ගොඩ නගන අතරම ශ්‍රී ලංකාව කලාපීය ගුවන් සේවා නියමුවා බවට පත්කිරීම සඳහාවූ සංවර්ධන සැලසුමෙහි ප්‍රධාන දායකයා ලෙස අපගේ කැපවීම මෙයින් තවදුරටත් අවධාරණය කෙරෙයි.

දූරදර්ශී ගුවන් සේවා පහසුකම් සපයන්නෙක් බවට පත් වීමේ අපගේ කැපවීම සලකුණු කරන ගු.ගු.සේ සමාගම විසින් අත්කර ගත් තවත් සංධිස්ථානයක් වූයේ ජපන් යෙන් බිලියන 28 ක් සහන ණයක් ප්‍රදානය කිරීම සඳහා ජපාන අන්තර්ජාතික සහයෝගිතා පදනම (JICA) සමග අත්සන් කළ සුවිශේෂී ගිවිසුමයි. මෙම ණය බ.ජා.ගු තොටුපල සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන අවධියේ දෙවන පියවර සඳහා දෙනු ලබයි. එය අවසන් වූ පසුව බ.ජා.ගු නවීකරණය වූ ධාරිතාවක් සහ නිපුණතා සහිත පරිසර හිතකාමී ගුවන් තොටුපලක් ලෙස වටිනාකමක් එක් කරයි.

අපි රාජ්‍යය සතු ආයතනයක් බවත් අපගේ ක්‍රියාවන් සහ තීරණ සම්බන්ධව ජාතියට වගකිවයුතු බවත් දනිමු. යහ පාලනය සහ ආචාර ධර්ම අපගේ ව්‍යාපාරික කටයුතු වල ශක්තිමත් පදනමක් වන අතර අපි නිතරම අනුකූලතාවයේ සහ විනිවිද භාවයේ සංස්කෘතිය පවත්වා ගන්නෙමු. එම නිසා වඩා හොඳ පරිචය වන්නේ අප මෙම සංස්කෘතිය පවත්වා ගෙන යන බව සහතික කිරීමයි. එසේම විශිෂ්ඨත්වයේ වේදිකාව මත ගොඩ නැගුන ව්‍යාපාරයේ සියළු මෙහෙයුම් ක්ෂේත්‍ර වසා පැතිර පවත්නා පාලනයේ ශක්තිමත් පදනමක් අපගේ 4පී වර්ධන ආකෘතිය ට තිබේ. මෙම වාර්තාවේ ඇතුලත් මූල්‍ය ප්‍රකාශන ගු ගු සේ සමාගම අන්තර්ජාතික වාර්තාකරණ ප්‍රමිතීන් යොදා ගැනීම පටන් ගත් තැන් සිට පළමුවරට ඉදිරිපත් කළ ඒවා වන අතර එකී අනුකූලත්වය පවත්වා ගැනීම සඳහා අපගේ කැපවීම තිර ලෙස සහතික කරමු. අපගේ තොරතුරු තාක්ෂණ ක්‍රියාවලියට හඳුන්වා දුන් සංවර්ධන අවශ්‍යතා සහ අපගේ ERP පද්ධතියේ ක්‍රියාත්මක වීම් සමග තවත් වාර්ෂික මංසලකුණක් ලෙස මෙම තත්වය තවදුරටත් වර්ධනය කරනු ලබයි. ERP පද්ධතිය අපගේ වගකීම සහතික කිරීමට විනිවිද භාවයට සහ ගුණාත්මක තීරණ සහ ඒ හා බැඳුනු කාලීන තොරතුරු ප්‍රවාහය වර්ධනය කරයි.

මෙම වර්ෂයේ ගු.ගු.සේ සමාගමට ඉදිරිපත් වූ පැසසුම් ගණන විශාලය. බලශක්ති අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය විසින් මහා පරිමාණ රාජ්‍ය අංශයේ ගොඩ නැගීම් සම්බන්ධයෙන් සංවිධානය කරනු ලැබූ 2012 ශ්‍රී ලංකා ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන උළෙලේදී අපට කුසලතා සහතිකයක් පිරිනමනු ලැබීම ඇත්ත වශයෙන්ම ආඩම්බර මොහොතක් වේ. කාර්යක්ෂම බලශක්ති කළමනාකරණ පද්ධතියක් සහ විචක්ෂණශීලී බලශක්ති කළමනාකරණයක් වෙනුවෙන් නිපුන අවශ්‍යතා අවිලනය කිරීමට වූ අපගේ කැපවීම මෙම සම්මාන

ප්‍රදානය විසින් තහවුරු කරනු ලබයි. එසේම අපව ශ්‍රී ලංකාවේ ඉහළම රාජ්‍ය සංවිධාන 20 තුල තැබුනු අතර එම තත්වය අවුරුදු ගණනක් තිස්සේ අඛණ්ඩව පවතී. ව්‍යාපාර සංවිධාන වල ගුණාත්මක සහ ප්‍රමාණාත්මක කාර්යසාධන සහ ප්‍රථිඵල අවධාරණය කරනු ලැබූ ජාතික වාණිජ මණ්ඩලය (NBEA) විසින් රාජ්‍ය සේවා අංශය සඳහා 2012 දී පවත්වන ලද ජාතික ව්‍යාපාර විශිෂ්ඨත්වය සම්මාන උළෙලේදී ඒකාබද්ධ රන් පදක්කමක් ගු.ගු.සේ සමාගමට පිරිනමන ලදී. එසේම දෙසැම්බරයේදී පැවැත්වූ ගෝලීය වාණිජමය නිපුනතා සම්මාන උළෙලේදී කොළඹ නාවික ඇකඩමිය විසින් ගු.ගු.සේ සමාගමට වාණිජ අංශයේ විශිෂ්ඨ දායකත්වය උදෙසා පදක්කමක් ප්‍රදානය කරන ලදී.

මෙම වර්ෂයේ අපගේ වඩා උත්කර්ශවත් සහ සිහිකටයුතු පරිච්ඡේදය තුල කැපී පෙනුන එකක් වූයේ අන්තර්ජාතික ගුවන් සේවා සංවිධානය විසින් පවත්වන ලද ජයග්‍රාහී පියවරක් වූ විශ්ව සුරැකුම් විගණන වැඩසටහනයි. මෙම විගණනය තුලින් අන්තර්ජාතික ගුවන් සේවා සංවිධානයේ 17 ඇමුණුම, ජාතික සිවිල් ගුවන් සේවා ආරක්‍ෂණ වැඩසටහන (NCASP) සහ ගුවන් තොටුපල ආරක්‍ෂණ වැඩසටහන මත වූ ප්‍රමිත සහ නිර්දේශිත පරිචයන් ක්‍රියාත්මක කිරීමේදී දක්වා ඇති අනුකූලතාවයේ ප්‍රමාණය සහතික කරන ලදී. රටවල් 145 ක විගණන ප්‍රතිඵල මත ගෝලීය සාමාන්‍යය වූ 67.8% ඉක්මවමින් අපගේ කැපවීම 85.6% ක් ලෙස තීරණය විය. එම විගණන ප්‍රතිඵල අනුව 'ශ්‍රී ලංකා අහස සුරක්‍ෂිතය' යන්න තහවුරු වී ඇත.

කොළඹ ගුවන් තොරතුරු කලාපයේ (FIR) අනතුරු රහිත පරිසරයක් අඛණ්ඩව පවත්වා ගැනීම තුල ගු.ගු.සේ සමාගම බිඳිය නොහැකි ආරක්‍ෂාවක් පවත්වා ගෙන ඇතැයි යන්න මේ නිසා තවත් වැඩි වෙයි. සියයට සියයක් පූර්ණ ආරක්‍ෂාවක් සහ අනතුරු විරහිත වාර්තාවක් පවත්වා ගැනීම සහතික කරමින් ගුවන් සේවා කර්මාන්තයේ සියලු උනන්දු පාර්ශවයන් දැක්වූ මෙම අප්‍රතිහත උද්යෝගයට මම ප්‍රශංසා කරමි. ගු.ගු.සේ සමාගම මත්තල රාජපක්‍ෂ අන්තර්ජාතික ගුවන් තොටුපල වෙත පියාසර කිරීමට හැකි ගුවන් සමාගම් නියෝජිතයින් සමග ප්‍රවර්ධනාත්මක හමුවීම් පැවැත්වූ 2012 අබුඩාබියේ පැවති ලෝක මාර්ග සංවර්ධන වැඩසටහනෙහි සක්‍රීය සහභාගි වන්නකු විය.

පළමු ගුවන් යානය 1912 දෙසැම්බර් 7 දින කොළඹ තුරඟ තරග පිටියෙන් එහි සාර්ථක පියාසැරීම ආරම්භ කළ දා සිට 2012 දෙසැම්බරයේ දී ගුවන් සේවා අංශයේ වසර 100 ක් සම්පූර්ණ වීම සිහිපත් කිරීම මහත් සතුටක් වෙයි. සියලුම උනන්දු පාර්ශවයන් එක්වුනු සියවස් සැමරුම මහින්ද රාජපක්‍ෂ ජනාධිපති තුමාගේ අනුග්‍රාහකත්වයෙන් අරලිය ගහ මන්දිරයේදී පවත්වන ලදී.

**තටු ගසා ඉගිල්ලෙන්න**

ඔබ දන්නා පරිදි අපි සුවිසල් ලෙස සැලසුම් කරමු. මක් නිසාද අපට අහසෙහි පවා සීමාවක් නොමැති බැවිනි. අපගේ දැක්ම අතපත් කර ගත හැකි උපක්‍රමික පියවරක් වන ආසියා පැසිපික් කලාපයේ සංචාරක කර්මාන්තයේ සුවිසල් පංගුකරුවෙක් වීමට අප බලාපොරොත්තු තබා ඇත. මෙය සංචාරක කර්මාන්තයක් සහ ගුවන් සේවා කර්මාන්තයට ඉන්ධන සපයන ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව ජනප්‍රිය කරවීමේ ප්‍රශස්ථ පියවරක් වේ. ඉහතින් විස්තර කර ඇති පරිදි ඊළඟ දශකය තුල මගී සංචරණයේ පරිමාව වූ මිලියන 6 ක ප්‍රමාණය දෙගුණ වන බව පුරෝකථනය වී ඇත. ගු ගු සේ සමාගම 2012 දී අත්පත් කර ගත් මුලු මගී සංඛ්‍යාව 7,079,920 ක් වූ අතර එය දශකය තුල වූ පුරෝකථනය සත්‍ය ලෙසම අභිබවා යාමක් බව පෙන්නුම් කර ඇත.

ආසියාව, ඕස්ට්‍රේලියාව සහ ඇමරිකාව අනුගමනය කරමින් වර්ධනයේ නව ගෝලීය යාන්ත්‍රණයක් බවට පත්වීමේ තැනට පැමිණ ඇත. මෙය ස්වභාවයෙන්ම ගුවන් සේවා ඇතුලු සියලු අංශයන්ගේ යටිතල ව්‍යුහයක් සංවර්ධනය කිරීමට පොළඹවයි. ඒ අනුව යටිතල ව්‍යුහයන් පිලිබඳ ආයෝජන තීරණ ප්‍රවණතා සහ අවස්ථා පිළිබඳ සුපරීක්ෂාකාරී විශ්ලේෂණයකින් පසුව කළ යුතු වීම අත්‍යාවශ්‍ය වේ. විවේකය සහ ව්‍යාපාරික කටයුතු



*ගුවන්සේවා සියවස් සැමරුම - අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ සමග සියළු පරදුභාරකරුවන්ගේ එකතුව අරලියගහ මන්දිරයේදී*

**රටෙහි වඩාත්ම සුවිශේෂි අවස්ථාවක් වූයේ ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල වන හම්බන්තොට මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපල 2013 මාර්තුවේදී එහි මුල් සැලසුම් ගත දින වකවානු තුලම සම්පූර්ණ කිරීම වෙනුවෙන් වූ ප්‍රගතියයි.**

සඳහා ගමන් කරන්නන්ගේ වැඩිවීමක් පෙන්වන කලාපීය ගුවන් සේවා වෙළඳපලෙහි ශක්තිමත් වර්ධනයක් නිරීක්ෂණය වීම මින් එකක් වෙයි. බටහිර යුරෝපයේ සහ දකුණු අප්‍රිකාවේ සිදුවන ජාත්‍යන්තර සංචාරයන් බොහොමයක් ගුවන් ගමන් මගින් සිදු වීම සමග කලාපය තුල සහ ඉන් පිට අන්තර්ජාතික සංචාරයන්හි වැඩිවීමක් සිදුවී තිබේ. ගු.ගු.සේ සමාගමද දේශීය ගුවන් ගමන් ධෛර්යමත් කරමින් සිටී. මෙමගින් පුලුල් යටිතල පහසුකම් සහ සාර්ථක රාමුවක් ඇති වීම නිසා ශ්‍රී ලංකාව තුල මාර්ග ව්‍යාප්තිය වැඩි වනු ඇත. තාක්ෂණික දියුණුව සහ පුලුල් තරඟකාරීත්වය මගින් දිරි ගන්වමින් ගෝලීය වෙළඳාමේ ව්‍යාපෘතියක් බලා පොරොත්තු වන අතර විශේෂ ප්‍රාගුණ්‍යය වූ ක්ෂේත්‍ර සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වනු ඇත. පාරවල්, ගුවන සහ සාගරය මෙන්ම සම්බන්ධිත එකතු කල අගයන් සහ උපකාරක සේවා ඇතුලු අවශ්‍යතා සැපයීම මගින් පුලුල් භූගෝලීය පාරිසරික කේන්ද්‍රස්ථානයක් පිළිබඳ නැඹුරුවක් මෙහි පවතී. මෙම පුරෝකථනයන් සහ අනෙකුත් දර්ශකයන් මත පදනම් වෙමින් බ.ජා.ගු තොටුපල සංවර්ධනයේ 2 අවධියේ දෙවන පියවර තුලින් බ.ජා.ගු තොටුපල වර්ථමාන ධාරිතාව මෙන් එක හමාර ගුණයකින් වැඩි කිරීමේ අරමුණින් නව පර්යන්තයක් ඉදි කිරීමට නියමිතය. කෙසේ වුවද මෙම වැඩි කිරීම සමග ඇති වන ගුවන් සහ ගොඩබිම තදබදය නැති කිරීමට කෙටිකාලීන විසඳුමක් ලෙස අඩු පිරිවැය දරන අන්තර්ජාතික සහ දේශීය වාහකයින් සඳහා දේශීය පර්යන්තයක් භාවිතා කිරීමට අපි අපේක්ෂා කරමු. පෞද්ගලික ගුවන් ගමනාගමනය, ගුවන් තොටුපල හෝටල් ව්‍යාපෘතිය, දේශීය පර්යන්ත ගොඩනැගිල්ල, ධාවන පථය නැවත පිරවීම සහ පුලුල් කිරීම සහ තීරු බදු රහිත ජාත්‍යන්තර වෙළඳ කලාප අවශෝෂණය කිරීම සඳහා රත්මලාන ගුවන් තොටුපල සංවර්ධනය කිරීමේ සැලසුම්ද මෙහි ඇතුලත්ව ඇත.

අපගේ 4පී වර්ධන ආකෘතිය මෙම කටයුතු වල ප්‍රගාමී සහායකයකු ලෙස සම්බන්ධ කරමින් රටෙහි ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයේ ප්‍රධාන ධාවකයා ලෙස ගු.ගු.සේ සමාගම තම දැක්ම සමග අඛණ්ඩව කටයුතු කරයි. පැහැදිලි ලෙසම අත්පත් කර ගතහැකි කලාපීය ගුවන් කේන්ද්‍ර ස්ථානය බවට පත්වීමේ ශ්‍රී ලංකා සිතුවමට නව හවුල් කරුවන් සහ අවස්ථා සෙවීම නිසා මෙයට වැඩි අගයක් එකතු කරයි. මෙහිදී සියලුම තීරණ වලට අත්‍යාවශ්‍ය ආකාර තුන වූ ආර්ථික පිළිවෙත, සමාජ හා පාරිසරික තිරසාර පැවැත්ම විචක්ෂණශීලීව අපි ඒකාබද්ධ කර ගත්තෙමු. වඩා සමබර සාධාරණ ව්‍යාපාරයක් නිරතුරුවම අපේක්ෂිත ප්‍රතිඵල ලබා දෙන බවත් දිගුකාලයේදී රටෙහි සහ එහි වැසියන්ගේ සම්පතක් ලෙස නිර්මාණාත්මක, අචල සහ තිරසාර අඛණ්ඩ ව්‍යාපාරයක් ගොඩ නැගෙන බවත් අපි විශ්වාස කරමු.

**මාගේ අවංක ඇගයීම්**

වඩා හොඳ කාර්යසාධනයක් ඇති ජාතීන්ට පවා බලපෑම් ඇති කරමින් සියලුම රටවල් හරහා ව්‍යාප්ත වූ ගෝලීය ආර්ථික කඩා වැටීමට එරෙහිව සටන් වැදීම නිසා මෙම වසර බහුල ලෙස අභියෝගාත්මක විය. කෙසේ වුවද මෙම වර්ෂයේ ගු.ගු.සේ සමාගම ගෙන හැර දැක්වූ ප්‍රශංසා කටයුතු කාර්යසාධනයන් පිළිබඳව ඔබ දැනටමත් දනී. එය අපගේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගනු වස් අඛණ්ඩව නැගී සිටීමට අපව දිරිගැන්වූ සියලු උනන්දු පාර්ශවයන්ගේ අසාමාන්‍ය කැපවීමේ ප්‍රතිඵලයක් වෙයි. අපගේ ගමනෙහි මධ්‍ය ධාවකයන් වූ ඔබ සැමට ස්තුති කරන අතර අපගේ දැක්ම සමග බද්ධව සිටින ලෙසත් එකී ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා අපට සහාය වන ලෙසත් මම ඔබෙන් ඕනෑකමෙන් යුතුව ඉල්ලා සිටිමි.

බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපල හරහා ගමන් කළ සියලුම මගීන්ට මෙන්ම අපගේ ව්‍යාපාරයේ තිරසාර බවට ආරක්ෂිත ගමන ප්‍රධාන වේ යන්න සහතික කිරීමේ අපගේ හැකියාවන් මත විශ්වාසීව සහ පක්ෂපාතීව අප සමග රැඳී සිටි අනෙකුත් උපායමාර්ගික හවුල්කරුවන්ට මාගේ කෘතඥතාවය පිරිනමමි.

සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ, එම අමාත්‍යාංශ ලේකම්ගේ, සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සහ එම ආයතන වල සියලුම නිලධාරීන්ගේ නායකත්වය සහ නොමසුරු සහයෝගය අපට නොලැබුනේ නම් අපගේ සාර්ථකත්වය තහවුරු කර ගැනීමට අපට නොහැකි වනු ඇත.

මෙම ප්‍රගාමී සංවිධානය මෙහෙයවීම සඳහා මට සහාය දෙමින් ධෛර්යවන්තභාවයේ මනා සම්පතක් ලෙස අඛණ්ඩව සිටියාවූ මාගේ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුද කරමි. එසේම ගු.ගු.සේ කණ්ඩායමෙහි විශේෂයෙන් අංශ ප්‍රධානීන්ගේ වෘත්තීයභාවය, අවංකත්වය, නිර්මාණාත්මක ගුණය සහ ගු ගු සේ සමාගම කලාපීය ගුවන් සේවා කර්මාන්තයේ නියමුවා සහ ශූරයා බවට පත් කිරීම සහතික කරනු වස් අසීමිතව වැඩ කිරීමේ ගුණය සත්‍ය ලෙසම ප්‍රශංසා කටයුතුය.



**ප්‍රසන්න ජේ වික්‍රමසූරිය** ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී
**සභාපති**
2013 ජූනි 18





# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

"අධ්‍යක්ෂ මණ්ඩලය කෙසේද යත්; ඔවුහු අපේක්ෂිත දිශාවට යාත්‍රා කිරීමට සුළඟේ වෙනස්වීම අනුව රුවල පිහිටුවන්නාසේය..."

# අධ්‍යක්ෂ මණ්ඩලය



වමේ සිට දකුණට ඃ එම්.සී.පී මහීපාල මහත්මිය - සමාගමේ ලේකම්, කෝසල ආර් වික්‍රමනායක මහතා - අධ්‍යක්ෂ, යෝගා පෙරේරා මහතා - අධ්‍යක්ෂ, ජොහාන් ජයරත්න මහතා - විධායක අධ්‍යක්ෂ



වමේ සිට දකුණට ඃ ප්‍රසන්න ජේ. වික්‍රමසූරිය මහතා - සභාපති, කමල් එස්. රත්වත්ත මහතා - උපසභාපති, ජේ.ආර්.යූ. ද සිල්වා මහතා - අධ්‍යක්ෂ, එස්.එන්. ගොපල්ලව මෙනවිය - අධ්‍යක්ෂිකා
නොසිටී - ආචාර්ය ඩී.එස්. ජයවීර - අධ්‍යක්ෂ, ආනන්ද ගුණතිලක මහතා - අධ්‍යක්ෂ

# සමාගමේ කටයුතු පිළිබඳ
## අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

ගු.ගු.සේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමග සමාගමේ කටයුතු පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරනුයේ මහත් සතුටිනි. මෙහි ඇතුලත් කර ඇති තොරතුරු 2007 අංක 7 දරන සමාගම් පණතේ අවශ්‍යතා අනුව සහ ප්‍රශස්ථ ගිණුම්කරණ පරිචයන්ට අනුව ඉදිරිපත් කර ඇත.

**සමාලෝචිත වර්ෂය තුල ගු.ගු.සේ සමාගමේ අධීක්ෂණය යටතේ උද්යෝගිමත් වේගයකින් අඛණ්ඩව ඉදිකිරීම් කටයුතු සිදුකල හම්බන්තොට මත්තල දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපති තුමා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.**

**මූලික ක්‍රියාකාරකම්**

වසර තුලදී සමාගමේ මූලික මෙහෙයුම් ක්‍රියාකාරකම් නොවෙනස්ව පැවතුනි. 2010 නොවැම්බර් 4 දිනැති ගැසට් පත්‍රයට අනුව නිකුත් කරන ලද 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පණතින් නියම කර ඇති පරිදි ගුගුසේ සමාගම ශ්‍රී ලංකාවේ එකම ජාත්‍යන්තර ගුවන් තොටුපල වන බණ්ඩාරණායක ගුවන් තොටුපල වෙත එකම ව්‍යවස්ථාපිත සේවා සපයන්නා වශයෙන් තම භූමිකාව අඛණ්ඩව පවත්වා ගෙන ගොස් ඇත.

සමාගම විසින් ශ්‍රී ලංකා ගුවන් ගමන් තොරතුරු කලාපය තුල ගුවන් යානා හා මගීන්ගේ ආරක්ෂාවත් සුරක්ෂිතතාවයත් තහවුරු කරමින් සියලු ගගන නාවික සහ අනෙකුත් සේවා සැපයීම් ඉතා සාර්ථකව ඉටු කර ඇත. ගු.ගු.සේ සමාගම උපයෝගී මගී පහසුකම් ද ඇතුලුව බ.ජා.ගු තොටුපලට අදාල සියලු නඩත්තු කටයුතු අතීතයේදී මෙන්ම නොවෙනස්ව ඉටු කර ඇත. ඒ සමගම බ.ජා.ගු සහ රත්මලාන ගුවන් තොටුපලේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතුද සොයා බලන ලදී. මෙම ව්‍යාපෘතීන් බොහොමයක් සඳහා අරමුදල් සපයා ඇත්තේ ශ්‍රී ලංකා රජය විසින් සහ විදේශ ණය සහ ප්‍රදානයන් මගිනි.

සමාලෝචිත වර්ෂය තුල ගු.ගු.සේ සමාගමේ අධීක්ෂණය යටතේ උද්යෝගිමත් වේගයකින් අඛණ්ඩව ඉදිකිරීම් කටයුතු සිදුකල හම්බන්තොට මත්තල දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපති තුමා විසින් 2013 මාර්තු 18 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම**

2007 අංක 7 දරන සමාගම් ආඥා පණතට අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම ඔවුන් හොඳින් තේරුම් ගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ 2007 අංක 7 දරන සමාගම් ආඥා පණතේ විධිවිධාන වලට අනුකූලව නිරවද්‍ය/සත්‍ය ලෙස මූල්‍ය වාර්තා පවත්වා ගෙන යන බව සහතික කිරීම ඔවුන්ගේ වගකීම බව ඔවුන් අවබෝධ කර ගෙන සිටියි.

වාර්තාවේ 82 සිට 117 දක්වා පිටු වල ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වලින් සමාගමේ කටයුතු පිළිබඳව සත්‍ය සහ සාධාරණ දැක්මක් ගෙන දෙන බවට අධ්‍යක්ෂවරුන් සෑහීමට පත්වෙයි.

**මූල්‍ය ප්‍රකාශන**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ 82 සිට 117 දක්වා පිටුවල ඉදිරිපත් කෙරෙන අතර අරමුදල් ගිණුම් ශීර්ෂ 122 සිට 131 දක්වා පිටු වල ඉදිරිපත් කර තිබේ.

**විගණකවරුන්ගේ වාර්තාව**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකවරුන්ගේ වාර්තාව 81 පිටුවේ දක්වා ඇත. අරමුදල් ශීර්ෂ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කළ අතර එම වාර්තාව වාර්ෂික වාර්තාවේ 119 පිටුවේ දක්වා තිබේ.

**සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකවරුන්ගේ වාර්තාව 81 පිටුවේ දක්වා ඇත. අරමුදල් ශීර්ෂ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කළ අතර එම වාර්තාව වාර්ෂික වාර්තාවේ 119 පිටුවේ දක්වා තිබේ.**

**සුවිශේෂි ගිණුම්කරණ ප්‍රතිපත්තීන්**

සමාගම 2012 වර්ෂයේදී සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත යොදා ගත් අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පළමුවරට යොදා ගැනීම නම් වූ ශ්‍රී ලංකා වාර්තා කරන ප්‍රමිත අංක 1 හි සඳහන් ආකාරයට ගැලපෙන සේ පසුගිය වර්ෂ සඳහා අදාල පරිවර්තන වෙනස් කම් කරන ලදී.

සුවිශේෂි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් 81 සිට 93 දක්වා පිටුවල ඉදිරිපත් කර ඇත.

**සංයුක්ත සමාජමය වගකීම්**

සංයුක්ත සමාජමය වගකීම් යටතේ වර්ෂය තුල ගුගුසේ සමාගම දරනලද දායකත්වය රු මිලියන 14.2 ක් විය. මෙහි ප්‍රදාන ලෙස රු මිලියන 0.5 ක් ද මහජන සම්බන්ධතා මත රු මිලියන 1.6 ක් ද ඉතිරිය සංයුක්ත සමාජමය වගකීම් මතද දරා ඇත.

### අභ්‍යන්තර පාලන පද්ධතිය

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතීන්හි ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. සමාගමේ උපාය මාර්ගික ඉලක්ක සහ අරමුණු අත්පත් කර ගැනීමේ අරමුණින් පද්ධතීන්හි ඵලදායි බව සමාලෝචනය කිරීමද ඇතුළුව සියලු මූල්‍ය සහ අවදානම් කළමනාකරන කටයුතු මෙම කාර්ය පථය මගින් ආවරණයවේ. අංක 66 සිට 69 දක්වා වූ පිටුවල පෙන්වා ඇති පරිදි යහ පාලනය පිළිබඳ ආකෘති රාමුව යටතේ වූ ප්‍රතිපාදන මත මෙය සිදු කර ඇත.

### අනාගත සංවර්ධනයන්

මගීන් හැසිරවීමේ ධාරිතාවය තවත් මිලියන 9 න් වැඩි කරමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල පුළුල් කිරීමේ යෝජිත සැලසුම් සහ යටිතල පහසුකම් නංවාලීමේ ක්‍රියාවලිය හා ඒ සමගම දිවයිනේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල ඉදිකොට අවසන් කිරීම අනිවාර්යයෙන්ම රටෙහි ගුවන් කර්මාන්තය ඉහළට එසවීමක් වනු ඇත. ඊට අමතරව රටේ දේශීය ගුවන් ගමන් පහසුකම් වැඩිකිරීමේ සැලසුම් ද පවතී. එසේම දේශීය ගුවන් තොටුපල ජාලය වැඩි දියුණු කිරීම මෙන්ම බ.ජා.ගු ගුවන් ධාවන පථය පුළුල් කිරීම සහ ඒ මතුපිට නැවත ඇතිරීම පිළිබඳ සැලසුම් ද ක්‍රියාත්මක වෙමින් පවතී.

### පිරිවැටුම

සමාගමේ මෙතෙක් වූ ඉහළම දළ පිරිවැටුම රු.බිලියන 11.1 ක අගයක් වාර්තා කොට ඇත. පිරිවැටුම සහ ලාභය පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් මූල්‍ය සමාලෝචනය යටතේ ඉදිරිපත් කර තිබේ.

### මෙහෙයුම් ප්‍රතිඵල

සමාගම 2012 වර්ෂය සඳහා පිළිවෙලින් බදු පෙර ලාභය සහ බදු පසු ලාභය ලෙස රු.බිලියන 3.9 ක සහ රු බිලියන 2.7 ක අගයක් වාර්තා කොට ඇති අතර එය පසු ගිය වර්ෂයට සාපේක්ෂව ගත් කළ 80% ක සහ 97% ක වර්ධනයකි.

| | 2012 රු. මිලි. | 2011 රු. මිලි. |
|---|---|---|
| සියලුම මෙහෙයුම් වියදම් සහ ක්ෂය වෙන්කිරීමෙන් පසු 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය | 3,858.7 | 2,139.7 |
| අඩුකළා: බදු | 1,121.1 | 751.1 |
| වර්ෂයේ ලාභය | 2,737.5 | 1,388.6 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | |
| **අවදානම් උපකල්පන වෙනස් වීම් මත ඇති වන වාසි හෝ පාඩු** | 205.0 | 115.6 |
| **මුළු විස්තීර්ණ ආදායම** | **2,942.6** | **1,504.2** |

### ආදායම් සංචිත

වත්කම් සහ වගකීම් ඒකාබද්ධ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2011 වර්ෂයේ රු.මිලියන 361 ක් වූ සංචිත 2012 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 3304 දක්වා වර්ධනය වී ඇත. සමාගමේ සංචිත වෙනස් වීම 84 පිටුවේ දැක්වෙන ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ දක්වා ඇත.

## සමාගම 2012 වර්ෂය තුලදි මෙතෙක් වාර්තා කළ ඉහළම බදු පෙර ලාභය සහ බදු පසු ලාභය ලෙස පිළිවෙලින් රු බිලියන 3.9 ක් සහ 2.7 ක් වාර්තා කරන ලදී.

### දේපල, පිරියත සහ උපකරණ

2011 දෙසැම්බර් 31 දිනට වූ රු බිලියන 22.8 සමග සසඳන කළ 2012 දෙසැම්බර් 31 දිනට ගු.ගු.සේ සමාගමේ දේපල පිරියත සහ උපකරණ වල ශුද්ධ පොත් අගය රු බිලියන 39.2 ක් වේ.

සමාලෝචිත වර්ෂය තුල සමාගමේ ප්‍රාග්ධන වියදම රු මිලියන 17,449 ක් විය. (2011 දී එය රු මිලියන 9,165 කි) දේපල පිරියත සහ උපකරණ වල වෙනස් වීම් මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 5 යටතේ පැහැදිලි කර ඇත.

### කොටස් ප්‍රාග්ධනය

සමාගමෙහි කොටස් ප්‍රාග්ධනය ගිණුම් වල දක්වා ඇති අතර එය එකක් රු 100 බැගින් වූ සාමාන්‍ය කොටස් වලින් යුක්තවේ. 2012 දෙසැම්බර් 31 දිනට කොටස් හිමිකාරීත්වය පහත සඳහන් පරිදි වේ.

| කොටස් ගණන | වටිනාකම (රු.) | දරන්නේ |
|---|---|---|
| 200,000 | 20,000,000 | මහා භාණ්ඩාගාර ලේකම් |
| 1 | 100 | ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් |
| 1 | 100 | සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| 200,002 | 20,000,200 | |

### අධ්‍යක්ෂවරු

මූල්‍ය වර්ෂය අවසන් දිනට අධ්‍යක්ෂ ධූර දැරූ 9 ගේ නම් පහතින් දැක්වේ. ගුගුසේ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ විධිවිධානයන්ට අනුකූලව සභාපති (89 වගන්තිය) උප සභාපති/ විධායක අධ්‍යක්ෂවරුන් (79 වගන්තිය) සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් (82 වගන්තිය) යන තනතුරු වල පත්වීම් සිදු කොට ඇත.

| | |
|---|---|
| ප්‍රසන්න ජේ වික්‍රමසූරිය මහතා | සභාපති |
| කමල් එස් රත්වත්ත මහතා | උප සභාපති |
| යොහාන් ජයරත්න මහතා | විධායක අධ්‍යක්ෂ |
| කෝශල ආර් වික්‍රමනායක මහතා | අධ්‍යක්ෂ |
| ආනන්ද ගුණතිලක මහතා | අධ්‍යක්ෂ |
| යෝගා පෙරේරා මහතා | අධ්‍යක්ෂ |
| ශානිකා ගොපල්ලව මෙනවිය | අධ්‍යක්ෂිකා |
| ආචාර්ය ඩී එස් ජයවීර මහතා | අධ්‍යක්ෂ |
| ජේ ආර් යූ ද සිල්වා මහතා | අධ්‍යක්ෂ |

**සමාගමේ කටයුතු පිළිබඳ** *අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව ඉදිරියට.*

**අධ්‍යක්ෂ මණ්ඩල කමිටු**

මෙහෙයුම් සහ අභ්‍යන්තර පාලනය සඳහා වඩා හොඳ මඟ පෙන්වීමක් සහ අධීක්ෂණයක් ඇති කරනු වස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන සහ කළමනාකරන කමිටුව පිහිටුවා තිබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබූ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් මෙය සමන්විත වූ අතර ඩී.එස් ජයවීර, ජේ.ආර්.යූ ද සිල්වා සහ යෝගා පෙරේරා යන මහත් වරුන් සමාලෝචිත වර්ෂය තුල මෙම කමිටුවේ සේවය කරන ලදී.

සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී සහ අභ්‍යන්තර විගණන සහ තත්ව සහතික ප්‍රධානී අනෙකුත් සාමාජිකයෝ වූහ.

**කොටස් සහ ණයකර සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ ගනුදෙනු හෙළිදරව් කිරීම**

කිසිදු අධ්‍යක්ෂවරයෙකු කොටස් සහ ණයකර හිමිකම් දරන්නේ නැත.

**කොන්ත්‍රාත්තු සහ යෝජිත කොන්ත්‍රාත්තු සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ හිමිකම්**

2012 දෙසැම්බර් 31 දිනට හෝ එම වසර තුල සමාගමේ ව්‍යාපාරික කටයුතු වලට අදාල කොන්ත්‍රාත්තු හෝ යෝජිත කොන්ත්‍රාත්තුවලට කිසිදු අධ්‍යක්ෂවරයෙක් සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වී නොමැත.

**අධ්‍යක්ෂවරුන්ගේ දීමනා හා අනෙකුත් ප්‍රතිලාභ**

විධායක අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුට සහ විධායක නොවන අධ්‍යක්ෂවරියකට (සමාගම් ව්‍යවස්ථාවලියේ 77 වගන්තිය අනුව) රු.මිලියන 11.6 ක් දීමනා ලෙස මෙම වර්ෂය තුල ගෙවා ඇත. මෙයට සේවක අර්ථ සාධක, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්, සංග්‍රහ දීමනා ප්‍රතිපූරණය කිරීම, දුරකථන, නිවාඩු, අනෙකුත් දීමනා සහ ප්‍රසාද ගෙවීම් ආදී වශයෙන් වූ සියලු මූල්‍ය ප්‍රතිලාභ ඇතුලත් වේ. විධායක අධ්‍යක්ෂවරුන් නොවන අනෙකුත් අයට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් සහ ගාස්තු ලෙස රු.574,300 ක් ගෙවා ඇත.

**සමාජයීය සහ පාරිසරික වගකීම**

ආචාර ධර්මානුකූලව සහ පරිසර හිතකාමී ලෙස මෙහෙයුම් කටයුතු කර ගෙන යාමට සමාගම කැප වී සිටී. මෙම ප්‍රවේශය සඳහා සමාගමේ කැප වීම, ප්‍රජා සහභාගිත්වය සහ පුණ්‍යමය පරිත්‍යාග පිළිබඳ විස්තර තිරසාර පැවැත්ම උදෙසා කළමනාකාරිත්වය පිළිබඳ සමාලෝචනයෙහි දක්වා ඇත.

**යහ පාලනය**

සියලු උනන්දු පාර්ශවයන් සමග දීර්ඝ කාලීන සම්බන්ධතාවයක් පවත්වා එය වැඩි දියුණු කිරීම සඳහා සමාගමෙහි සමස්ථ පාලන ක්‍රියාවලියේ ඵලදායිතාවය සහතික කිරීමේ වගකීම අධ්‍යක්ෂවරුන් දරයි.

සාමූහික පාලන ආකෘතිය සහ එය යොදා ගැනීම පිළිබඳව සාමූහික පාලනය සමාලෝචනය යටතේ විස්තර කර ඇත.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට, වෙනත් නියාමක ආයතනවලට හා සේවකයින්ට කළ යුතු සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත කාලය තුල ගෙවූ බවට හෝ ප්‍රතිපාදන සැලසූ බවට තමන්ගේ උපරිම දැනුමට හා විශ්වාසයට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කර ඇත.

**ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශන වල ගැලපිලි කළ යුතු ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනට පසුව සිදුවී නොමැත.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල 2013 මාර්තු 18 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

**අඛණ්ඩ පැවැත්ම**

සාමාන්‍ය පුරෝකථන ක්‍රම අනුගමනය කිරීම සහ අනාගත කටයුතු හා අවදානම් තත්වයන් සැලකිල්ලට ලක් කරමින් යෝග්‍ය විමර්ශන කටයුතු කිරීමෙන් අනතුරුව ඉදිරි කාලය තුල තම මෙහෙයුම් කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් තරම් සම්පත් සහ ණය ලබා ගැනීමේ හැකියාව සමාගම සතු බව අධ්‍යක්ෂ මණ්ඩලයය තරයේ විශ්වාස කරයි. ඒ අනුව සියලුම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කර ඇත.

**විගණකවරු**

2007 අංක 7 දරන සමාගම් ආඥා පණතේ 158 වගන්තිය ප්‍රකාරව සමාගමේ විගණකවරුන් ලෙස ප්‍රයිස් වෝටර්හවුස්කූපර්ස් වරලත් ගණකාධිකාරීවරු පත් කරන ලදී.

ජංගම වර්ෂයේ විගණන ගාස්තුව රු.600,000 කි. (2011 එය රු.660,610 කි) විගණන නොවන සේවා සඳහා විගණක වරුන් වෙත ගෙවීම රු.552,450 කි. (2011 දී රු 384,500 කි)

**වාර්ෂික මහා සභා රැස්වීම**

වාර්ෂික මහා සභා රැස්වීම 2013 ජූනි 28 දින ප.ව.3.00 ට ගුගුසේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේදී පැවැත්වීමට නියමිතය.

**කෘතඥතාවය පළකිරීම**

අධ්‍යක්ෂ මණ්ඩලය තම කළමනාකරන කණ්ඩායමට සමාගමට ඉමහත් ජයග්‍රහණ ලබා ගැනීමට ඉවහල් වූ ඔවුන්ගේ වෘත්තීය භාවයට, නිර්මාණාත්මක විවේචන වලට සහ ඥාණාන්විත භාවයට සිය කෘතඥතාවය පලකරයි.

එසේම සමාගමේ කටයුතු සාර්ථක කර ගැනීමෙහි ලා අඛණ්ඩව සහයෝගය ලබා දුන් ශ්‍රී ලංකා ආණ්ඩුවට, ගුවන් සේවා අමාත්‍යාංශයට, මුදල් අමාත්‍යාංශයට, සිවිල් ගුවන් සේවා අධිකාරියට සහ අනෙකුත් ආයතන වලටද අධ්‍යක්ෂ මණ්ඩලය තම කෘතඥතාවය පළකරයි.

අධ්‍යක්‍ෂ මණ්ඩලය අවසාන වශයෙන් නමුත් තම සුළු නොවන කෘතඥතාවය පළ කරනුයේ තම කැපවීමේ පූර්ණ කණ්ඩායම් හැඟීම, අවංකභාවය, පරිකල්පනය, ඉවසීම, වෙහෙසී වැඩ කිරීම සහිත මෙන්ම වටිනාම අශ්පෘශ්‍ය වත්කම බවට පත්වූ ගු.ගු.සේ සමාගමේ කාර්යමණ්ඩලය වෙතය.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි



**ප්‍රසන්න ජේ** වික්‍රමසූරිය
සභාපති

2013 ජූනි 18 දින





# ජ්‍යේෂ්ඨ කළමනාකරණය කෙසේද යත්;

“එක්ව කටයුතු කිරීම, වෙහෙසී වැඩ කිරීම, ඒකාබද්ධ බව, සුහදශීලී බව, ඉලක්ක සහභාගිත්වය, කණ්ඩායම් හැඟීම, මිත්‍රශීලී බව ... ඔවුන් හඳුනා ගැනීමට තවත් සමාන පද සමුදායකි...”



# **ජ්‍යෙෂ්ඨ** කළමනාකාරිත්වය



**සිටගෙන (වමේ සිට දකුණට)** එස්.එම්.ආර්. රෆීක් මහතා - *ව්‍යාපෘති ප්‍රධානී*, පී. විතානගේ මහතා - *සිවිල් ඉංජිනේරු (සැලසුම් සහ නිර්මාණ) ප්‍රධානී*, යූ.ජේ.ලොකුආරච්චි මහතා-*තොරතුරු තාක්ෂණ ප්‍රධානී*
**වාඩිවී -(වමේ සිට දකුණට)** ජේ.එම්.ඒ.යු. ජයමාන්න මහතා - *විදුලි ඉංජිනේරු ප්‍රධානි*, ඩබ්ලිව්.සි තිසේරා මිය - *ගුවන් සංතරණ සේවා ප්‍රධානි*, ඩබ්ලිව්. විමලශාන්ති මහතා - *ඉලෙක්ට්‍රොනික් සහ ගුවන් සංතරණ ඉංජිනේරු ප්‍රධානී(නොසිටී)*



**සිටගෙන (වමේ සිට දකුණට)** ඩබ්ලිව්. එම්. පී.  කරුණාරත්න මහතා - *වාණිජ හා දේපළ ප්‍රධානී*
**වාඩිවී (වමේ සිට දකුණට)** එච්.ඒ.ඒ.කේ.එම්. සෙනවිරත්න මහතා - *සිවිල් ගුවන්සේවා පුහුණු ආයතන ප්‍රධානි*, එල්. දහනායක මහතා - *මුදල් ප්‍රධානි*, එච්.පී.එල්. සිරිමාන්න මහතා - *සැපයුම් දාම කළමනාකරණ වැඩබලන ප්‍රධානි*, එම්.සී.පී. මහීපාල මහත්මිය - *මානව සම්පත් සංවර්ධන ප්‍රධානී/සමාගමේ ලේකම්*, එම්. රත්නසිංහ මහත්මිය - *නීති ප්‍රධානී (නොසිටී).*



**(වමේ සිට දකුණට)** වෛද්‍ය එස්. ඩී.ඒ.එස්. නිශාන්ත - *සමාගමේ වෛද්‍ය නිලධාරී,* කේ මුණසිංහ මහත්මිය - *අලෙවිකරණ ප්‍රධානී,* එච්.එස් හෙට්ටිආරච්චි මහතා - *ගුවන්තොටුපල කළමනාකරණ ප්‍රධානී,* ඒ.ඩී.එන්.ආර්. ද අල්විස් මහතා - *ගිනි සහ මුදවාගැනීම් ප්‍රධානී,* කේ.එච්.සී. කුමාරසිංහ මහතා - *ආරක්ෂක සේවා ප්‍රධානී*



**සිටගෙන (වමේ සිට දකුණට)** ඩී. විජේසූරිය මහතා - *ආරක්ෂණ වැඩබලන ප්‍රධානි,* සිරිල් වන්නිගම මහතා - *අභ්‍යන්තර විගණන හා තත්ව සහතික ප්‍රධානී*
**වාඩිවී (වමේ සිට දකුණට)** ඩී.එන්.ඒ.ජයමහ මහතා - *සිවිල් ඉංජිනේරු (නඩත්තු) ප්‍රධානී,* මනෝජ් ද කෲස් මහතා - *වාස්තුවිද්‍යා, භූමි අලංකරණ හා අභ්‍යන්තර නිර්මාණකරන නියෝජ්‍ය ප්‍රධානී,* ආර්.ඩබ්ලිව්. විජේසිංහ මහතා - *කාර්මික ඉංජිනේරු වැඩ බලන ප්‍රධානී*

# කළමනාකාරිත්ව සාකච්ඡාව සහ විශ්ලේෂණය

කෙසේද යත්;

“අද ඊයේ දැමූ බිත්තරය වන අතර එහි කටුව තුළ හෙට ගැබ්ව ඇත...”





# කළමනාකාරිත්ව සාකච්ඡාව සහ විශ්ලේෂණය

**ගෝලීය චාරිකාව - පුළුල් දැක්ම**

**2012 වර්ෂයේදී මගී ප්‍රවාහනය 4% කින් වර්ධනය වූ අතර ගුවන් භාණ්ඩ ප්‍රවාහනය නොවෙනස්ව පැවතුනි.**

**2013 පෙබරවාරි 7 මොන්ට්‍රියෙල්, ක්විබෙක්, කැනඩා** කලින් වර්ෂය හා සන්සන්දනාත්මකව බලන විට 2012 දී ගෝලීය මගී ප්‍රවාහනයේ මූලික ප්‍රතිඵල වල සමස්ථ වැඩි වීම +3.9% කි. උතුරු ඇමරිකා සහ යුරෝපයේ සුපිරි ගුවන් තොටුපල වල මගී ප්‍රවාහනයේ අති නවීන වාසි සටහන් වූ අතර වර්ධනය වෙමින් පවතින රටවල අපේක්ෂා සහගත ක්‍රියාකාරකම් කොටසක් නිරතුරුව පෙන්වන ලදී. 2012 වසරේදී ඉලක්කම් දෙකක වර්ධනයක් ඉස්තාන්බුල් (+20.2%) ජකාර්තා (+14.4%) ඩුබායි (+13.2%) සහ බැංකොක් (+10.6%) වල දක්නට ලැබුනි. යුරෝපයේ ලතින් ඇමරිකාවේ අප්‍රිකාවේ සහ උතුරු ඇමරිකාවේ දේශීය මගී වෙළඳපල හැකිලී යාම නිසා 2012 දෙසැම්බරයේ දී +2.5% වැදගත් වර්ධනයක් දක්නට ලැබුනි. ප්‍රති විරුද්ධ ලෙස මැද පෙරදිග සහ ආසියා පැසිපික් හි දෙසැම්බර් මාසයේ පිළිවෙලින් +12.3% සහ +9.0% ලෙස නොකඩවා වර්ධනයක් අත්පත් කර ගන්නා ලදී.

දෙසැම්බර් මාසයේ ගුවන් බඩු ප්‍රවාහනයේ සමස්ථ පහත වැටීම -1.3% කි. යුරෝපය, ලතින් ඇමරිකාව, කැරිබියන්, උතුරු ඇමරිකාව සහ ආසියා පැසිපික්හි පහත වැටීම පිළිවෙලින් -2.7% -2.6% -1.5% සහ -1.2% විය. ඉහළම ගුවන් භාණ්ඩ කේන්ද්‍රස්ථානය වන හොංකොං සහ මෙම්පිස් පිළිවෙලින් 2.2% සහ 2.5% ක වර්ධනයක් අත්පත් කර ගත් අතර 2012දී ඉහළම ගුවන් තොටුපල 30 ක 57% ක් වූ ගුවන් භාණ්ඩ ප්‍රවාහන පරිමාව පහත වැටී තිබේ.

ජාත්‍යන්තර ගුවන් තොටුපල කවුන්සිලයේ අධ්‍යක්ෂ රෆායෙල් එඩ්වර්ඩ් අදහස් දක්වමින් “2011 වර්ෂයේ මාසයෙන් මාසය සසඳන විට 2012 දී වාර්ෂික මගී ප්‍රවාහනයේ අඩු වර්ධනයක් දුටුවත් සමස්ථ ප්‍රතිඵලය සමහර යුරෝපීය සහ උතුරු අමරිකානු වෙළඳපල වල පහත වැටීමක් පෙන්වූ ACI පුරෝකථන සමග සමගාමී විය. 2012 සමහර මාස වල විශාල වාසි සහ අනෙකුත් මාස වල පහත වැටීම් වශයෙන් ගුවන් භාණ්ඩ ප්‍රවාහනයේ මිශ්‍ර ප්‍රතිඵල දක්නට ලැබුනි. යුරෝපා කලාපයේ අවදානම් අඩුවීම සහ ඇමරිකා එක්සත් ජනපදයේ වර්ෂය පුරා වූ මූල්‍ය අවහිරතා මධ්‍යයේ 2012 වර්ෂයේදී ගුවන් භාණ්ඩ ප්‍රවාහනයේ වර්ධනය නැවතුනි. ගෝලීය ආර්ථිකය සහ අන්තර්ජාතික වෙළඳාම යහපත් අතට හැරීම නිසා 2013 දී මගී සහ භාණ්ඩ යන දෙකෙහිම වැඩි වර්ධනයක් දෙස අපි සර්වශුභවාදීව බලා සිටිමු” යයි ප්‍රකාශ කළේය.

මූලාශ්‍රය - අන්තර්ජාතික ගුවන් තොටුපල කවුන්සිලය

**සියල්ල පාරිභෝගිකයා වටා භ්‍රමණය වෙයි**

**තුලනයෙහි අවශ්‍යතාව**

පහත දැක්වෙන සටහන රඳා පැවැත්මේ විවිධ බලවේග අවසානයේ එක් උනන්දු පාර්ශවයක් වටා භ්‍රමණය වන සැටි පෙන්වයි. එනම් පාරිභෝගිකයා වේ. මගී අපේක්ෂා පුළුල් චාරිකා අත්දැකීම්, තාක්‍ෂණ දියුණුව, ඉහළ මට්ටමේ ප්‍රමිතීන්ට සහ සංවර්ධනයන්ට ඇති ඉල්ලුම වැනි කරුණු සමග ස්වභාවයෙන්ම වැඩි වන නිසා ගුවන් තොටුපල ව්‍යාපාරයට යටිතල පහසුකම් පිළිබඳ වැඩි ඉල්ලුම, ඉහළ පහසුකම් සඳහා වූ තාක්‍ෂණික දියුණුව, ආරක්ෂාව සහ කාර්යක්‍ෂමතාව වැනි කරුණු සමග රඳා පැවැත්මට සිදු වෙයි.

ඉහත සඳහන් සාධක විවිධ දිශාවන්ට යොමු වන බැවින් “අඛණ්ඩ සංවර්ධනය” සහ “තරඟකාරී ඉම”යන දෙකම වැටී ඇත්තේ එම සාධක වලින් ඇති කරනු ලබන විවිධ අභිරුචීන් කෙලෙස කළමනාකරණය කරන්නේද යන්න මත බව අපි විශ්වාස කරමු. අපගේ සියලු උපායමාර්ග සහ ක්‍රියාවන් තෝරා ගැනීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී අප යොදා ගනු ලබන පිරික්සුම් යාන්ත්‍රණය එය වෙයි.

## රඳාපැවැත්මේ බලවේග



### සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව
**පළමුව ආරක්ෂාව**

මගියාගේ පළමු ප්‍රමුඛතාවය ආරක්ෂාවයි. එමනිසා ගුගුසේ සමාගම ගුවන් ගමනාගමනය සම්බන්ධ තම මූලික ව්‍යාපාර කටයුතු ආරක්ෂාව පළමුතැනෙහි ලා සලකා ක්‍රියාත්මක කරයි. ICAO ආරක්ෂාව පිළිබඳ විගණන වැඩ සටහන (USOAP) මගින් ආසියා පැසිපික් කලාපයේ රටවල් 34 ක් තුලින් ශ්‍රී ලංකාව 4 වන ස්ථානයේ ලා සැලකීම නිසා 2011 වර්ෂය ආරක්ෂාව පිළිබඳ අපගේ වාර්තා වල විශිෂ්ඨ වර්ෂයක් විය. අපව ඉක්මවා සිටියේ රටවල් තුනක් පමණි. ඔවුන් අතර පළමුව කොරියානු සමූහාණ්ඩුව, දෙවනුව සිංගප්පූරුව, තෙවනුව ජපානය විය. ICAO වට සම්බන්ධ පාර්ශව 191 ක් අතුරෙන් අපගේ ගෝලීය ශ්‍රේණි ගත කිරීම 19 වන ස්ථානයේ විය. කොළඹ FIR එකම ගුවන් නාවික සේවා සපයන්නා ලෙස අප සුරක්ෂිතභාවය පිළිබඳ ඉහළ ප්‍රධාන කාර්යසාධක දර්ශක (KPI) ඉලක්කයන් සපුරා ගත් බැවින් 2012 වර්ෂය තවදුරටත් වැදගත් වේ. එය අප කාර්යයන්ගේ තීරණාත්මක ජයග්‍රහණයක් වේ.

වර්ෂය තුල ගුවන්ගමන් ප්‍රමාණයේ කැපී පෙනෙන වැඩි වීමක් තිබියදීත් ගොඩබිම හෝ ගුවනේ සුවිශේෂී සිදුවීම් වාර්තා වූයේ නැත. සුරක්ෂිතභාවය නිර්වචනය කළ ප්‍රධාන කාර්යසාධක දර්ශක හොඳින් අත්පත් කර ගන්නා ලදී. ගුවන්ගමන් 100,000 කට ගුවන් ගමන් පාලන (ATC) සම්බන්ධ සිදුවීම් ගණන 2011 සහ 2012 වර්ෂ වල 100,000 කට 4 කට අඩුවෙන් ලෙසට නොවෙනස්ව පැවතුනි. (2012 -2/52,090 × 100,000 - 3.84) (2011 - 4/50,199 × 100,000 - 3.98)

### ICAO විශ්ව සුරක්ෂා විගණනය 2012

ICAO ඇමුණුම් 17 ජාතික සිවිල් ගුවන් සේවා සුරක්ෂිත වැඩසටහන (NCASP) සහ ගුවන් තොටුපල ආරක්ෂිත වැඩසටහන (ASP) අනුව ක්‍රියාත්මක කල ප්‍රමිතීන් සහ නිර්දේශිත පරිචයන් පිළිබඳ අනුකූලතාවය සහතික කිරීම සඳහා ICAO 2012 මැයි 24 - 30 තුල විශ්ව සුරක්ෂා විගණන වැඩසටහන (USAP) පවත්වන ලදී. ගෝලීය රාජ්‍ය 145 ක විගණනයෙන් වාර්තාවූ 67.9% ක ප්‍රතිඵලයට එරෙහිව 85.06% සුවිශේෂී කාර්යසාධනයක් අත්කර ගෙන ඇති බව එම විගණන ප්‍රතිඵල වලින් පෙන්වන ලදී. එමගින් ශ්‍රී ලංකා අහස වඩා සුරක්ෂිතය යන සහතිකය සංචාරක ජනතාව වෙත දෙන ලදී.

ආරක්ෂාව අතපසු වීම සම්බන්ධ තීරණාත්මක කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ ශ්‍රී ලංකා හැකියාව පිළිබඳව මෙම විගණනයෙන් පරීක්ෂා කරන ලදී. තීරණාත්මක කරුණු ලෙස සඳහන් වූයේ ශ්‍රී ලංකා ගුවන් සේවා ව්‍යවස්ථාව, ගුවන් සේවා සුරක්ෂණ වැඩසටහන සහ නීතිරීති, ගුවන් සේවා ආරක්ෂණය පිළිබඳ සුදුසු අධිකාරියක්, පුද්ගල සුදුසු කම් සහ පුහුණු කිරීම්, තාක්ෂණික මග පෙන්වීම් සඳහා ප්‍රතිපාදන, උපකරණ සහ ආරක්ෂාව පිලිබඳ වැදගත් තොරතුරු අනුමත කිරීමේ සහ සහතික කිරීමේ වගකීම, තත්ව පාලන වගකීම සහ ආරක්ෂාව සම්බන්ධයෙන් වන යෝජනා ආදී කරුණු වේ.

### ගුවන් සේවා ආරක්ෂණ නිවාරකය

2012 මැයි සිට නිවාරක කටයුතු ක්‍රියාත්මක කරන AVSEC පුද්ගලයෙකුගේ සහතික කිරීමේ අවශ්‍යතාවය
ICAO ඇමුණුම් 17 සම්මතයන් සහ ජාතික ආරක්ෂාව පිළිබඳ විධිවිධාන විසින් අවධාරණය කරන ලදී.

මෙම ප්‍රමිතියට අනුකූලව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් මගින් සහතික ලත් උපදේශකයින් ලෙස ජ්‍යෙෂ්ඨ සම්පත් දායකයින් ලබා ගැනීමට ගුවන් සේවා ආරක්ෂණ නිවාරක අංශයට හැකි විය.

## ---- ඉහළ ප්‍රමිතීන් සහ වර්ධනයන් සඳහා ඉල්ලුම ගුවන් තොටුපල ව්‍යාපාරයට ඉහළ යටිතල පහසුකම් සහ තාක්ෂණික වර්ධනයන් සඳහා ආයාචනා කිරීමට බලකරයි

එම උපදේශකවරු නිවාරන අංශයේ පුද්ගලයින් ගේ කුසලතා දැනුම සහ ආකල්ප වර්ධනය කිරීම තුලින් අවශ්‍ය ප්‍රමිතියට අනුව නිවාරන සහතිකයක් ලබාගැනීමට හැකි තත්වයට ඔවුන්ව පත් කරන ලදී. 2012 මැයි වලදී මෙම වැඩ සටහන තුලින් පුද්ගලයින් 370 ක් සහතික ලබා ගන්නා ලදී. විශ්ව ගුවන්සේවා ආරක්ෂණ වැඩ කටයුතු වලදී ඉහළ ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීමට මෙම සාර්ථකත්වය විශාල වශයෙන් බලපාන ලදී.

**ආරක්ෂණ පහසුකම් පුළුල් කිරීම: ගමන් මලු නිවාරකය වැඩි දියුණු කිරීම**

වැඩිවන මගී පරිමාවට සරිලන පරිදි ගුවන් සේවා ආරක්ෂණ අංශය බ.ජා.ගු තොටුපලේ මගී පහසු කම් සැලකිල්ලට ලක් කරමින් ප්‍රමිත සහ නිර්දේශිත පරිචයන්ට අනුකූල වන සේ කවුන්ටර් ප්‍රදේශයේ එක්ස් කිරණ යන්ත්‍ර 4 ක් සවිකරන ලදී. මෙමගින් මගී තදබදය සහ අපහසුතාව නැතිකරන ලදී.

මීට අමතරව ආරක්ෂාව හා සුරක්ෂිතභාවය තහවුරු කිරීම පිණිස ශ්‍රී ලන්කන් ගුවන් සමාගම සමග ඒකාබද්ධව 100% ක මගී ගමන් මලු නිවාරන ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී.

### කාර්යක්ෂමතාවය සහ පිරිවැය අවම කිරීම
**ගුවන් නාවික සේවා - ඵලදායි කාර්යක්ෂම සහ පිරිමැසුම්දායි ප්‍රයත්න තුලින් වටිනාකම් එකතු කිරීම**

මහින්ද රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපල සහ බ.ජා.ගු තොටුපල සඳහා සැලසුම් කළ ATC ක්‍රියාපටිපාටින් - විදේශ විනිමය මිලියන ගණනින් ඉතිරිකිරීම.

2013 ම.රා.ජා.ගු තොටුපලේ පූර්ව ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීමේ කොටසක් ලෙස ගුවන් ගමන් පටිපාටින් සඳහා උපකරණ සැලසුම් කිරීම වියදම් අධික ක්‍රියාවක් විය. මෙම ක්ෂේත්‍රයේ විශේෂඥයින් වූ ඇමරිකාව සහ ප්‍රංශයේ විවිධ විදේශ ආයතන ව්‍යාපෘතිය සඳහා අධික මිල ඉදිරිපත් කොට තිබුනි. අවසානයේදී මෙය ICAO සෘජුව පුහුණුව ලැබූ ගුවන් මගී පාලක කණ්ඩායමක් විසින් සාර්ථකව නිම කරන ලදී.

මෙය අප රටට මිලියන සහ බිලියන ගණනින් ඉතුරුවක් පමණක් නොව 'එය අපි කළෙමු'යන වෘත්තීයමය ආඩම්බරයක්ද විය.

අපගේ කණ්ඩායම විසින් සැලසුම් කරන ලද ක්‍රියා පටිපාටින් ජාත්‍යන්තර මිනුම් කණ්ඩායම් මූලික වශයෙන් අගය කළ අතර අද දක්වා එය පරිශීලනය කරන්නන් විසින් ද ගෞරව පූර්වකව පිළි ගෙන ඇත.

PBN - කාර්යසාධන මත පදනම් වූ ගුවන් නාවික කටයුතු
RNAV - ක්ෂේත්‍ර ගුවන් නාවික කටයුතු
SIDs - ප්‍රමිතකරණ පිටත්වයාමේ පටිපාටිය
STARs - ප්‍රමිත පර්යන්ත ළඟාවීම් මං
PANS OPS - ගුවන් නාවික සේවා සඳහා ගුවන් යානා මෙහෙයුම්
මෙම සියලුම ATC ක්‍රියාපටිපාටින් 2013 අවසානයට පෙර සම්පූර්ණ කිරීමට නියමිතය.

### ANS අංශයේ AIS දෙපාර්තමේන්තුව ICAO හි නව ගුවන් සැලසුම් ආකෘතිය 2012 නොවැම්බර් 15 වන දින දියත් කරන ලදී.

ICAO FPL - 2012 නමින් වූ මෙම ආකෘතිය යටතේ ගුවන් නියමුවන් හට පිටත්වීමේ ඇස්තමේන්තු ගත කාලයට පැය 120 කට පෙර ගුවන් ගමන් සැලසුම ඉදිරිපත් කිරීමට ඉඩ දෙන ලදී. කලින් ආකෘතිය යටතේ ලැබුනේ පැය 24 ක කාලයකි.

මෙසේ කල් තියා දැන්වීම මගින් ATC අනුමතිය ලබා ගැනීමට එය මහත් රුකුලක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අඩු ඉන්ධන දහනයක් සහ පරිසරයට කාබන් මුදා හැරීම අවම වීමත් සිදුවිය.

තවදුරටත් මෙම නව ආකෘතිය මගින් ගුවන් නැව් සැලසුම් සම්බන්ධ නූතන යුගයේ ගුවන් ගමන් කළමනාකරනයේ අත්‍යාවශ්‍ය අංග වන සංනිවේදන, නාවික කටයුතු, සහ අධීක්ෂණය සම්බන්ධයෙන් චන්ද්‍රිකා භාවිතය සඳහා අවශ්‍ය දෑ පැහැදිලි කරන ලදී.

ICAO ගුවන් සැලසුම් ආකෘතිය මත වූ මෙම කාලීන පරිවර්තනය විශේෂයෙන්ම ප්‍රතිලාභී ගුවන් මගී ජනතාවටත් පොදුවේ මහජනයාටත් ආරක්ෂාව සහ කාර්යක්ෂමතාවය වඩවන්නක් විය

### ගුවන් නාවික පණිවුඩ හුවමාරු පද්ධතියක් හඳුන්වා දීම - සියලුම ග්‍රාහකයින් වෙත පරිශීලක හිතවාදී පණිවුඩ බෙදා හැරීම.

සාම්ප්‍රදායික AFTN තත්වයේ සිට නූතන පරිශීලක හිතවාදී ගුවන් ගමන් පණිවුඩ හුවමාරු පද්ධතියක සිට AMHS දක්වා වූ ගෝලීය හුවමාරුව සමග ගුවන් පණිවුඩ ක්‍රමය නිශ්චිත ලෙසම 2012 වර්ෂය තුල ඉදිරි පිම්මක් පෙන්වන ලදී.

ගුවන් නාවික සේවා අංශයේ ගුවන් පරිඝණක දෙපාර්තමේන්තුව ද අදාල නවීන උපකරණ ස්ථාපිත කරමින් මෙම හුවමාරුව කාලීනව ක්‍රියාත්මක කරන ලදී.

මෙය ඕනෑම දුරස්ථ පර්යන්තයක සිට වඩා හොඳ ඒකාග්‍රතාවයකින් සහ විශ්වාසයකින් යුතුව වඩාත් පරිශීලක හිතවාදී ලෙස පණිවුඩ මගින් අන්තර් ක්‍රියා කිරීම අවසන් පරිශීලකයාට පහසු කළේය.

### AIM වෙත මාරුවීම සම්පූර්ණ කිරීම - ගුවන් තොරතුරු පිළිබඳ e ආකෘතිය මගින් සැපයීම

ගුවන් ගමන් තොරතුරු e ආකෘතියේ ඉදිරිපත් කිරීම හඳුන්වා දීම සමග හුවමාරු ක්‍රියාවලිය AIS සිට AIM දක්වා පරිවර්තනය වීම 2012 වර්ෂයේ අප පසුකළ තවත් එක් සැතපුම් කණුවකි.

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු සඳහා මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල 2013 දී විවෘත කිරීමට නියමිතව තිබියදී ආසියා ගුවන් නාවික සේවා අංශයේ ගුවන් තොරතුරු දෙපාර්තමේන්තුව සියලුම අදාල ලියවිලි කාලීනව ප්‍රසිද්ධ කිරීමට දායක වන ලදී.

### ISO 9001 - 2008 පිළිබඳ වාර්ෂික සුපරීක්ෂාකාරී විගණනය

2010 දී ජාත්‍යන්තරව පිළිගත් නෙදර්ලන්තයේ (Det Norske Veritas) DNV ආයතනය විසින් සහතික කරන ලද ISO 9001 - 2008 තත්ව සහතිකයට ආවරණය වන පරිදි ගු.ගු.සේ සමාගම එහි තත්ව කළමනාකරන පද්ධතිය සැකසුම් කර ඇත.

ගුවන් තොටුපල පහසුකම් සහ ගුවන් නාවික සේවා පිළිබඳ ප්‍රධාන ක්‍රියාවලීන් ආවරණය කරමින් 2012 ජුනි වලදී මෙම ආයතනය වාර්ෂික ආවේක්ෂණ විගණනයක් පවත්වන ලදී. සාර්ථක සමාලෝචනයකින් පසුව ISO 9001 - 2008 සමග අනුකූල වීම ස්ථිර කරමින් ගු.ගු.සේ සමාගම වෙත තත්ව සහතිකයක් පිරිනමන ලදී.

### පහසුකම් සැලසීම

**කටුනායකදී ඕස්ට්‍රේලියානු ඩොලර් 2500 ක නැතිවීම සහ හමුවීම**

2012 දෙසැම්බර් 18 දින මම මගේ පවුලේ උදවිය සමග මැල්බෝර්න් වල සිටින මාගේ දියණිය බැලීම සඳහා සිංගප්පූරු ගුවන් සේවාවට හරහා ඕස්ට්‍රේලියාවට ගියෙමි. ඒ යන ගමනේ දී ඕස්ට්‍රේලියානු ඩොලර් 2500 ක් (එවකට රු.340,000 කට සමාන) මම රැගෙන ගියෙමි. ඕස්ට්‍රේලියාව දකවා පැමිණි විට මගේ මුදල් පසුම්බිය කටුනායකදී නැතිවී ඇති බ වමට අවබෝධ විය.

මම ආපසු පැමිණි විට මෙය නිකමට මෙන් කොළඹ මගේ මිත්‍රයෙකුට කීවෙමි. ඔහු ගුවන් තොටුපල ඔහුගේ මිතුරෙක් සම්බන්ධ කර ගත් අතර එම නිලධාරියාට නැතිවුන මුදල සොයා ගැනීමට හැකි විය. එම මුදල මට අයත් බව ඔප්පු කිරීමට අවශ්‍ය ලියවිලි රැගෙන ගුවන් තොටුපල සහ ගුවන් සේවා සමාගමේ දෛනික පිටවීම් කාර්යාලය වෙත පැමිණෙන ලෙස පසුව මට දන්වන ලදී. මා එම කාර්යාලයට ගිය අතර මාගේ ලියවිලි පරීක්ෂා කිරීමෙන් සහ නීතිමය කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව අදාල මුදල මා වෙත භාර දෙන ලදී.

මට අයත් සියලු ඩොලර් නෝට්ටු වටිනාකම් සහ අනුක්‍රමික අංක සහිතව ඔවුන්ගේ වාර්තාවල සටහන් කොට තිබෙනු දැකීමෙන් මම මවිතයට පත් වීමි.

එම මුදල් පසුම්බිය ලැබීමෙන් පසු තම අවංකභාවය නිසා එය ආරක්ෂක අංශයට භාර දී ඇති එසෑඵ තාසිම් මහතා සම්බන්ධව විශේෂ සඳහනක් කිරීමට මම කැමති වෙමි. ගුවන් තොටුපල සහකාර කළමනාකාර සේන නන්දිවීර මහතා ටී ඩී ප්‍රනාන්දු මහතා එම් ආර් ඩී එස් මැණිකේ මෙනෙවිය ඇතුලු කාර්ය මණ්ඩලය බොහෝ සෙයින් සුහදශීලීව උපකාරී වූහ. ඔවුන් ගේ අවංක භාවය සහ රාජකාරිමය කැපවීම නොවන්නට මට මගේ මුදල් ආපසු නොලැබෙනු ඇත. මෙවැනි කරුණු මහජනතාවගේ ප්‍රශංසාව ලැබියයුතු මිනිසුන් සිටින බව විශ්වාස කිරීමට අපව පොළඹවයි.

(එස් සමරජීව - නුවර )

**ගුවන් තොට මෙහෙයුම් ජයග්‍රහණ**

ශ්‍රී ලංකාවට පැමිණි A380 විශාලම ගුවන් බසය පළමු වරට බණ්ඩාරනායක තොටුපලට ගොඩ බස්වන ලදී.

එමිරේට් ගුවන් සේවාවට අයත් මෙම යානය සිඩ්නි වල සිට ඩුබායි දක්වා යන ගමනේදී 2012 ජනවාරි 9 දින ඉන්ධන ලබා ගැනීම පිණිස මෙහි ළඟා විය.

**මගී සංතෘප්තිය ඉලක්ක කර ගනිමින් යටිතල සහ අනෙකුත් පහසුකම් වර්ධනය කිරීම**

බස් රථ ප්‍රවේශ කවුලු ගණන වැඩි කිරීම

2011 සහ 2012 වසර වල මගී සංචරනය වැඩිවී පර්යන්ත ධාරිතාවය ඉක්මවන විට තදබදය පවතින කාලය තුල බස් රථ සඳහා කවුලු ගණන වැඩිකිරීමේ අවශ්‍යතාවයක් ඇතිවිය. බස් කවුලු දෙකක් සහ සම්බන්ධිත කවුලු අටක් බණ්ඩාරනායක තොටුපලෙහි තිබුනත් එය ප්‍රමානවත් නොවූ අතර අමතර කවුලු සඳහා ඉල්ලුම වැඩි විය. ඒ අනුව මෙම අවශ්‍යතාවය සැපිරීම සඳහා 2012 වසරේදී අමතර බස් කවුලු දෙකක් ගොඩ නගන ලදී.

**ආගමන විගමන දෙපාර්තමේන්තුව මගින් "පැමිණීම් වීසා කවුන්ටරයක්" විවෘත කිරීම**

2012 ජනවාරි සිට නව වීසා සැකසුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් සමග පැමිණීම් වීසා ලබා ගන්නා අය සැලකිය යුතු සංඛ්‍යාවක් බව පෙනී ගියේය. මේ අනුව බණ්ඩාරනායක තොටුපලෙහි දැනට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලය සහිත කවුන්ටර් තුනක් පිහිටුවා ඇති අතර විනාඩි පහක් වැනි කෙටිකාලයකදී සේවය ලබා දෙයි. 2011 ඔක්තෝබරයේදී විද්‍යුත් සංචාරක අධිකාරිත්ව (ETA) පද්ධතිය ආරම්භ කරන ලදී.

මූලිකව වීසා සැකසුම් ගාස්තුව ලෙස ඇ.ඩො 50 ක් අය කරන ලදී. බජාගු තොටුපලේ කවුන්ටරයට ඇ ඩො වලින් පමණක් ගෙවන ලෙස අමුත්තන්ගෙන් ඉල්ලා සිටින ලදී.

පසුව සංචාරකයන්ගේ පහසුව පිණිස බලධාරීන් වීසා සැකසුම් ගාස්තුව සාර්ක් රටවල් සඳහා ඇ. ඩොලර් 10 දක්වාද, සාර්ක් නොවන රටවල් සඳහා ඩොලර් 20 දක්වාද අඩු කරන ලදී. ETA පද්ධතිය සම්බන්ධ අනෙකුත් ගැටළුද බලධාරීන් විසින් විසඳන ලදී.

ශ්‍රී ලංකා බලධාරීන් සාර්ක් රටවල් අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීමටත් එම රටවලින් සංචාරකයින් පැමිණීම වැඩිකිරීමටත් මෙවැනි විශේෂ අනුපාත තීරණය කරන ලදී.

**පරීක්ෂණ කවුන්ටර් 5කින් වැඩි කිරීම**
මගී පරීක්ෂණ කවුලු සීමා වීම නිසා පර්යන්තයේ පවතින තදබදය ලිහිල් කිරීම සඳහා බජාගු තොටුපලේ පරීක්ෂණ කවුලු ගණන 50 සිට 55 දක්වා වැඩි කරන ලදී.

**තවදුරටත් පහසුකම් පුළුල් කිරීම**
**මගීන්ගේ පහසුව**
මාර්ගස්ථ ප්‍රදේශයේ ලංකා බැංකු ශාඛාවක් පිහිටුවීම

මගී ගමන් මළු ඉවත් කරන ප්‍රදේශයේ නව ගමන් මළු තෝරීමේ පටියක් සවිකිරීම

පැමිණීම් ප්‍රදේශයේ වැසිකිලි යලි සකස් කිරීම, ළමා ආරක්ෂක කාමරයක් සකස් කිරීම, පැමිණීමේ ලොබි කවුන්ටර් නැවත සකස් කිරීම සහ ඔපවත් කිරීම සහ පිටත බරාඳ සහ සේවා මාවත් සැකසුම් කිරීම සහ ඔපවත් කිරීම

ශ්‍රී ලංකා ව්‍යාපාරික මගී ප්‍රජාව සඳහා පිටත්වීමේ සේද මාවත් පහසුකම් විවෘත කිරීම.

**මගී සෞඛ්‍යය**
නැගෙනහිර අප්‍රිකානු රටවල මාරක වෛරස උණ පැතුරුනු මෑත කාලයේ එම රටවලින් මෙරටට පැමිණෙන මගීන්ගේ සෞඛ්‍ය තත්වය පරීක්ෂා කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව මාර්ගස්ථ ප්‍රදේශයේ පරීක්ෂණ ස්ථානයක් සකස් කරන ලදී.

2012 දෙසැම්බරයේ දී තායිලන්තයේ පැවැත්වූ වැඩමුලුවකදී ශ්‍රී ලංකාව ගුවන් ගමන් මගින් පැතිරිය හැකි සංක්‍රමණීය රෝග වැළැක්වීම සඳහා වූ සාමූහික වැඩසටහන (CAPSCA) පිළිගන්නා ලදී.

වඩාත් මෑත කාලීන සංවර්ධනයක් ලෙස ගුවන් යානා වෛද්‍ය පහසුකම් කීප ගුණයකින් වැඩි කිරීම නිසා ගුවන් ගමන් කාලය තුල මගීන්ගේ සෞඛ්‍යය සුරැකීම සම්බන්ධව කොළඹට හැකියාව ඇතැයි යන විශ්වාසය කලාපීය ගුවන් සේවා තුල වර්ධනය වී ඇත.

**රත්මලාන ගුවන් තොටුපල ජාත්‍යන්තර ඒකාබද්ධ ජෙට් මෙහෙයුම් සඳහා වර්ධනය කිරීම**
සමාගම 2012 වසරේදී නාගරික ගුවන් තොටුපලක් සේ රත්මලාන ගුවන් තොටුපල උසස් කිරීමට සාර්ථක ජාත්‍යන්තර මෙහෙයුම් ආරම්භ කරන ලදී. මේ සඳහා ගුවන් ධාවන පථය යලි සකස් කළ අතර රත්මලාන සිට එහි මෙහි යාමට කැමැත්ත දැක්වූ විවිධ ගුවන් සේවාවන්ගේ අවශ්‍යතා සැපිරෙන පරිදි ගුවන්යානා හැසිරවීමේ කොටස ටැක්සි මං ඇතුලත් කරමින් යලි සකස් කරන ලදී.

**සිල්ලර සහ දේපල අංශ අවස්ථා**
පසුගිය වර්ෂයේ සිල්ලර වෙළඳාම වූ රු.බිලියන 12 පසු කරමින් ඉතිහාසයේ ප්‍රථම වරට බජාගු තොටුපලෙහි සිල්ලර වෙළඳාම 2012 දී රු.බිලියන 15 ඉක්ම විය. එය පසුගිය වර්ෂයට වඩා 20% ක වර්ධනයකි. ගුගුසේ සමාගමෙහි ආදායම් ව්‍යුහයේ විශාලතම පංගුව වූයේ තීරු බදු රහිත වෙළඳ අංශයයි. මෙහි විශාලතම අංශ වූයේ මත්පැන්, දුම්කොළ, රසකැවිලි සහ සුවඳ විලවුන්ය. එය මුලු පිරිවැටුමේ 40% ක් පමණ වූ දෙවන විශාලම දායකය වන විදුලි ඉලෙක්ට්‍රොනික සහ ගෘහ උපකරණ අංශයේ 5.6% ක පහත වැටීමත් නොසලකා 40% ක වර්ධනයක් විය.

බ.ජා.ගු තීරු බදු රහිත වෙළඳ පලෙහි ඊළඟ විශාලතම දායකයන් 2011 ට සාපේක්ෂව 2012 දී ස්වකීය ස්ථාන වෙනස් කර ගෙන ඇත. පිරිවැටුමේ 167% ක වේගවත් වර්ධනයක් පෙන්නුම් කරන තේ අංශය ඉහළම කාර්යසාධනයකට පත්ව ඇත. (2011 දී රු.මිලියන 112 ක පිරිවැටුමට එරෙහිව 2012 දී රු.මිලියන 301 ක පිරිවැටුමක්) මෙයට හේතුව වූයේ තේ විකුණුම් හල් 9 ක් බවට පත් කරමින් නව තේ මෙහෙයුම්කරුවන් තිදෙනෙකු තම මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමයි.

රෙදි සහ අනෙකුත් උපාංග අංශ 36% ක වර්ධනයක් වාර්තා කළ අතර ඔර්ලෝසු, තෑගි භාණ්ඩ සහ ලිවීමේ උපකරණ අංශ 2% ක වර්ධනයක් අත්පත් කර ගෙන ඇත. මැණික් සහ ස්වර්ණාභරණ අංශය 20% ක වර්ධනයක් අත්පත් කර ගෙන ඇත. ශ්‍රී ලංකා මැණික්, ස්වර්ණාභරණ, තේ සහ අත්කම් භාණ්ඩ ගැනීමට අවස්ථාව ලැබෙන බැවින් මාර්ගස්ථ මගීන් බ.ජා.ගු හරහා තම සංචාර කිරීමට කැමති බව දැන ගන්නට ලැබී ඇත. වෙස් මුහුණු, බතික් සහ අත්කම් භාණ්ඩ වැනි දේශීයත්වය පරාවර්තනය වන භාණ්ඩ වල පිරිවැටුම 60% කින් වැඩි වී ඇත. එය පසුගිය වර්ෂයට වඩා 15% ක වැඩි වීමකි.

Timex, Rolex, Citizen, Montbloc, Cross, Rayban සහ Envoy වෙළඳනාම බ.ජා.ගු තොටුපලෙහි දක්නට ඇති පෙහොසත් වෙළඳ නාම අතර වෙයි. Roberto Cavalli ලෝකයේ තීරු බදු රහිත ගබඩා වල දක්නට ඇති නවතම සුවඳවිලවුන් වන අතර 2012 දී Autogrill Lanka Ltd හි කළමනාකරණය යටතේ තීරු බදු රහිත ගබඩාවක් මෙහි පිහිටුවන ලදී.

ගු.ගු.සේ සමාගමේ මගියකුට ශුද්ධ සිල්ලර වෙළඳ ආදායම 34% කින් එනම් රු.242 සිට රු.325 දක්වා වැඩිවී ඇත.

**උනන්දු පාර්ශව අගයන් පහදා දීම**

**පාරිභෝගිකයින්**

| පාරිභෝගික සේවා | 2012 | 2011 |
|---|---|---|
| ඉදිරි කාර්යාල සේවක ගණන | 312 | 251 |
| ගු.ගු.සේ සමාගමේ ඉදිරි කාර්ය මණ්ඩලය විසින් හසුරුවන පාරිභෝගික අන්තර්ක්‍රියා ස්ථාන ගණන | 21 | 22 |
| තීරු බදු රහිත සාප්පු ගණන | 105 | 102 |
| ආහාර වෙළඳ සැල් ගණන * | 05 | 05 |
| මගී විවේකාගාර ගණන | 10 | 05 |
| මාර්ගස්ථ හෝ හුවමාරු මගීන් සඳහා ඇති හෝටල් කාමර ගණන | 20 | 20 |

### සේවකයින්

| බල කාණ්ඩය | 2012 | 2011 |
|---|---|---|
| සේවකයින් ගණන | 3,570 | 3,306 |
| බඳවා ගැනීම් ගණන | 409 | 206 |
| **ලිංග ව්‍යාප්තිය අනුව** | | |
| කාන්තා සේවකයින් ගණන | 660 | 618 |
| **වයස් ව්‍යාප්තිය** | | |
| අවුරුදු 40 ට අඩු සේවක සංඛ්‍යාව | 1,808 | 1,782 |
| **සේවක හැකියා වර්ධනය** | | |
| පුහුණු පැය ගණන | 134,772 | 133,391 |
| **සේවකයෙකුට පුහුණු පැය ගණන** | | |
| - දේශීය | 114 | 112 |
| - විදේශීය | 31 | 19 |
| **රැකියා ප්‍රගමන ආරම්භයන්** | | |
| උසස්වීම් ගණන | 447 | 229 |
| රැකියා තෘප්තිය | | |
| රැකියා සංතෘප්ත මට්ටම (මුළු සේවකයින්ගෙන් තෘප්තිමත් සේවක ගණන % ට) | මිනුම් කර නොමැත | 62% |

### බ.ජා.ගු තොටුපලෙහි සුරක්ෂිතතාව

| | 2012 | 2011 |
|---|---|---|
| කැලැන්ඩර් වර්ෂයේ ගුවන් සේවා ආශ්‍රිත සිදුවීම් | 19 | 25 |
| සංචාර 100000 කට ගුවන් සේවා ආශ්‍රිත සිදුවීම් | 4 | 4 |
| ගුවන් සේවා ආශ්‍රිත අනතුරු | නැත | නැත |

### මගීන්ගේ /සේවකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව

| | 2012 | 2011 |
|---|---|---|
| මගී තුවාල වීම් අනුපාතය | නැත | නැත |
| වාර්තාවිය හැකි වැඩ අනතුරු | නැත | නැත |

### ව්‍යාපාරික සහකරුවන්

විධිමත් ගිවිසුම් අත්සන් කළ සම්බන්ධතා ගණන

| | 2012 | 2011 |
|---|---|---|
| ආයුකාලය වසර 20 ට වැඩි** | 53 | 50 |
| ආයුකාලය වසර 15 -20 අතර | 36 | 30 |
| ආයුකාලය වසර 10 - 15 අතර | 52 | 45 |
| ආයුකාලය වසර 10 ට අඩු | 138 | 96 |

### රජය

රජයට දායකත්වය

| | 2012 රු.මිලි. | 2011 රු.මිලි. |
|---|---|---|
| ගෙවූ බදු | 867 | 620 |
| ගෙවූ ලාභාංශ | 600 | 2,106 |

## ICAO විගණන ප්‍රතිඵල ශ්‍රී ලංකා අහස වඩා සුරක්ෂිතය යන සහතිකය මගී ජනතාව වෙත ලබා දෙයි.

### පරිසරය

| | 2012 | 2011 |
|---|---|---|
| මගියකුට බලශක්ති පරිභෝජනය | 5.27 | 5.99 |

### ප්‍රජාව

| | 2012 | 2011 |
|---|---|---|
| CATC ලියාපදිංචිකළ සිසුන් ගණන | 1,138 | 798 |
| බඳවා ගත් වෘත්තීය පුහුණු සිසුන් ගණන | 45 | 51 |
| CATC යටතේ පුහුණු කළ විදේශීය පුහුණුවන්නන් | 3 | 26 |

* *පර්යන්තයෙහි සීමිත ඉඩකඩ සිල්ලර සහ ආහාර බුදින ප්‍රදේශවලට බාධාකරයි. වාණිජ ඉඩකඩ නවීකරණය කිරීම වර්තමානයේ සිදුවෙමින් පවතී.*

** *භූමි පරිහරණය සහ අහර සැපයුම් සේවා සඳහා ශ්‍රී ලන්කන් ගුවන්සේවා සමග ඇති කරගත් ගිවිසුම්ද ඇතුලුව*

**වැදගත් සංවර්ධන අවස්ථා නිරේකනය කිරීම සහ ඔටුනු පැළඳවීම**

**ශ්‍රී ලංකා ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මානය** (SLNEEA) **- 2012**

විදුලි බල සහ බලශක්ති අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා බලශක්ති අධිකාරිය මගින් පිරිනමන ලද ශ්‍රී ලංකා බලශක්ති කාර්යක්ෂමතා සම්මානය සඳහා මහාපරිමාණ රාජ්‍ය අංශ ගොඩනැගිලි අංශය යටතේ කුසලතා සහතික ලාභියෙකු ලෙස ගුගුසේ සමාගම තෝරා ගන්නා ලදී. මෙය කාර්යක්ෂම බලශක්ති කළමනාකරන පද්ධතියක් සඳහා අපගේ කැපවීම සහ කළමනාකරන ප්‍රයත්න මගින් පසුගිය වසරේ බලශක්ති පාවිච්චිය අඩුකිරීම වෙනුවෙන් අපගේ දායකත්වය ඇගයීමක් විය.

**ගු.ගු.සේ සමාගම 2012 දී ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මානය ලබා ගනී**

ජාතේක වාණිජ මණ්ඩලය විසින් 2012 දෙසැම්බර් 04 දින කොළඹ හිල්ටන් හෝටලයේදී පවත්වන්නට යෙදුනු ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන 2012 උළෙලේදී ගුගුසේ සමාගම වෙත රන් පදක්කමක් පිරිනැමූ බව අපි මහත් ආඩම්බරයෙන් යුතුව ප්‍රකාශ කරන්නෙමු. රාජ්‍ය සේවා අංශය යටතේ අප තරඟ වැදුනු අතර මෙම තරඟයේදී NIBM සම සම්මාන ලබා ගන්නා ලදී.

**ගු.ගු.සේ සමාගමේ සභාපති වෙනුවෙන් ගෝලීය වාණිජ විශිෂ්ඨතා සම්මානය**

ගු.ගු.සේ සමාගමේ සභාපති ප්‍රසන්න ජේ වික්‍රමසූරිය මහතා හට 2012 දෙසැම්බර් 13 දින පැවැත්වූ ගෝලීය වාණිජ විශිෂ්ඨතා සම්මාන උළෙලේදී වාණිජ අංශයේ ඔහුගේ දායකත්වය වෙනුවෙන් පදක්කමක් පිරිනමන ලදී. මෙම අවස්ථාව ශ්‍රී ලංකා මහ බැංකුවේ නායකත්වය යටතේ කොළඹ නාවික ඇකඩමිය විසින් සංවිධානය කරන ලදී.

**ගු.ගු.සේ සමාගමෙහි වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ 48 වන වාර්ෂික වාර්තා සම්මාන උළෙලේදී නැවත වරක් ඇගයීමට පාත්‍ර කරන ලදී.**
මෑතකදී පවත්වන ලද ICASL වාර්ෂික වාර්තා තරඟයේදී ගුගුසේ සමාගම අනුකූලතා සහතිකයකින් පිදුම් ලැබුවේය. මෙම අවස්ථාව 2008 සිට අඛණ්ඩව ගු.ගු.සේ සමාගමේ වාර්ෂික වාර්තා ඇගයීමට ලක්වූ 5 වන අවස්ථාව වේ. 2009, 2010 වර්ෂ වල සමාගම සේවා අංශය යටතේ ලෝකඩ පදක්කම් ලබා ගන්නා ලදී.

**ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය සම්බන්ධ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම.**
මත්තල ඉදිකිරීම් වැඩ බිමේදී 2012 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් වූ ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය පිළිබඳ බොහෝ අභියෝග සාර්ථක ලෙස ජය ගන්නා ලදී.

**ICAO විගණනය 2012**
ICAO ඇමුනුම් 17 ජාතික සිවිල් ගුවන් සේවා සුරක්ෂිතතා වැඩසටහන (NCASP) සහ ගුවන් තොටුපල ආරක්ෂිත වැඩසටහන (ASP) අනුව ක්‍රියාත්මක කල ප්‍රමිතීන් සහ නිර්දේශිත පරිචයන් පිළිබඳ අනුකූලතාවය සහතික කිරීම සඳහා ICAO 2012 මැයි 24 - 30 තුල විශ්ව සුරක්ෂිතතා විගණන වැඩසටහන (USAP) පවත්වන ලදී. ගෝලීය රාජ්‍ය 145 ක විගණනයෙන් වාර්තාවූ 67.85% ක ප්‍රතිඵලයට එරෙහිව 85.06% සුවිශේෂී කාර්යසාධනයක් අත්කර ගෙන ඇති බව එම විගණන ප්‍රතිඵල වලින් පෙන්වන ලදී. එමගින් ශ්‍රී ලංකා අහස වඩා සුරක්ෂිතය යන සහතිකය සංචාරක ජනතාව වෙත දෙන ලදී.

ආරක්ෂාව අතපසු වීම සම්බන්ධ තීරණාත්මක කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ ශ්‍රී ලංකා හැකියාව පිළිබඳව මෙම විගණනයෙන් පරීක්ෂා කරන ලදී. තීරණාත්මක කරුණු ලෙස සඳහන් වූයේ ශ්‍රී ලංකා ගුවන් සේවා ව්‍යවස්ථාව, ගුවන් සේවා සුරක්ෂණ වැඩසටහන සහ නීතිරීති, ගුවන් සේවා ආරක්ෂණය පිළිබඳ සුදුසු අධිකාරියක්, පුද්ගල සුදුසු කම් සහ පුහුණු කිරීම්, තාක්ෂණික මග පෙන්වීම් සඳහා ප්‍රතිපාදන, උපකරණ සහ ආරක්ෂාව පිළිබඳ වැදගත් තොරතුරු අනුමත කිරීමේ සහ සහතික කිරීමේ වගකීම, තත්ව පාලන වගකීම සහ ආරක්ෂාව සම්බන්ධයෙන් වන යෝජනා ආදී කරුණු වේ.

ටී.එම්. බුරාහ් නියෝජ්‍ය ආරක්ෂක නිලධාරී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් උපදේශක සහතිකයක් ලබා ගැනීම.

**සිවිල් ගුවන් සේවා ඩිප්ලෝමා සම්මාන උළෙල**
සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානයේදී සිවිල් ගුවන් සේවා අධ්‍යයන සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලාව පළමුවරට හැදෑරූ සිසුන් 24 කු 2012 පෙබරවාරි 15 දින මවුන්ට් ලැවිනියා හෝටලයේ පවත්වන ලද උත්කර්ෂවත් සම්මාන උළෙලේදී සිය සහතික ලබා ගන්නා ලදී. මෙය රාජ්‍ය ආයතනයක් මගින් ගුවන් සේවා කර්මාන්තය වෙනුවෙන් ඩිප්ලෝමා මට්ටමේ සුදුසුකමක් ප්‍රදානය කළ පළමු අවස්ථාව වේ.

**උපායමාර්ගික සැලසුම**
**ගු.ගු.සේ සමාගමේ උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලිය**
ගු.ගු.සේ සමාගමේ උපාය මාර්ග පදනම් වී ඇත්තේ මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ ගුවන් සේවා සම්බන්ධ නිරන්තර වර්ධනයක් සහිත ඉල්ලුමක් ඇත යන්න සහ එම ඉල්ලුම සපුරා ලීමට ඉහළ ප්‍රමිතීන් සහිත නවීන සහ කාර්යක්ෂම යටිතල ව්‍යුහයක් ඇති සංවිධානයක් අවශ්‍යය යන්න මතය. ඉල්ලුම් පුරෝකථන විශ්ලේෂණ අනුව බ.ජා.ගු සහ මෑතදී නිම කළ ම.රා.ජා.ගු තොටුපලවල සංඛ්‍යාලේඛන සිත් ඇද ගන්නා සැලසුම් වේ.

තෙල් මිලෙහි වෙනස් වීම සහ අපගේ ප්‍රධාන පාරිභෝගිකයින් වන ගුවන්යානා කර්මාන්තයේ ලාභ ආන්තිකය අඩුවීම මගින් අපගේ කර්මාන්තය කෙරේ සෘණාත්මක බලපෑමක් ඇති කරයි.

අපගේ උපායමාර්ගික සැලසුම් තාර්කික ආකෘතියක් මත ගොඩ නැගෙන අතර එය අපගේ කෙටිකාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන ක්‍රියාකාරකම් පාලනය කරනු ලබන සැලසුම් කිහිපයක ඒකාබද්ධ ප්‍රතිඵලයක් වෙයි.



ජාතික බලශක්ති කාර්යක්ෂමතා සහතිකය

2012 - 16 දක්වාවූ සංයුක්ත සැලැස්මේ අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීම මෙම උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් විය.

**අපගේ උපායමාර්ගික සැලසුම් බුද්ධි කලම්බන සැසිවාර - අවශ්‍ය ගුවන් සේවා ව්‍යාපාර සැසිවාරය**
ගුවන් සේවා කර්මාන්තය රටෙහි ආර්ථික යාන්ත්‍රණයක් නිසා එහි උපායමාර්ග සැලසුම් කිරීම සහක්‍රියාවන් රැසක් අවශ්‍ය බරපතල



සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සහතිකය පිරිනැමීම

## 2012 ජනවාරි 9 දින සිඩ්නි වල සිට ඩුබායි දක්වා යන ගමනේ එමිරේට් ගුවන් සේවාවට අයත් A380 විශාලම ගුවන් බසය පළමු වරට බජාගු තොටුපලට ගොඩ බස්වන ලදී.




ගුගුසේ සමාගම ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා රන් සම්මානය ලබාගනියි



2012 ගෝලීය වාණිජ විශිෂ්ඨතා සම්මාන ප්‍රදානය



2012 ICASL වාර්ෂික වාර්තා තරගය -අනුකූලතා සම්මානය

කටයුත්තක් ලෙස සැලකේ. අපගේ උනන්දු පාර්ශවයන්ගේ සංයුතිය ගත් කළ හා අපගේ ක්‍රියාදාමය තුල ඔවුන් සම්බන්ධ වී ඇති ප්‍රමාණය විශ්ලේෂණය කරන විට ගුගුසේ සමාගමෙහි උපායමාර්ගික සැලසුම් හුදකලාව ගොඩනැගිය නොහැකිය. එමනිසා ප්‍රධාන උනන්දු පාර්ශවයන්ගේ නියෝජිතයින් සම්බන්ධ කොට ගෙන පළමු වරට බුද්ධි කලම්බන වැඩ සටහනක් ක්‍රියාත්මක කරමින් 2010 දී අපේ ප්‍රවේශයන්ගේ ප්‍රබල වෙනස්කමක් ඇති කරන ලදී. "එක් ජාතික දැක්මක් කරා" යන පොදු තේමාව යටතේ අපගේ උපායමාර්ගික උත්තේජකයන් බෙදාගත් අතර සියලුම පාර්ශව නියෝජිතයින් පොදු තේමාවට එකඟ වන ලදී. ඒ අනුව කර්මාන්තයට සුබදායක වූ තෝරාගත් මාතෘකා යටතේ සාර්ථක සාකච්ඡා පවත්වන ලදී.

ප්‍රබෝධමත් වාසි සහ වැඩි වූ උනන්දුව විසින් සමාන වර්ගයේ දෙවන බුද්ධි කලම්බන වැඩසටහනකට මග පෙන්වූ අතර 2013 - 17 සැලසුම් දැක්ම සඳහා "ගුවන් සේවාවේ හොඳම සූත්‍රයක් සඳහා එක්වීම" යන තේමාව යටතේ එම වැඩ සටහන 2013 ජනවාරියේ දී පවත්වන ලදී. අවශ්‍ය ගුවන් ව්‍යාපාර එකතු කිරීම සඳහා නව සංවාද මණ්ඩපයක් පිළියෙල කරනු වස් බුද්ධිමත් කණ්ඩායම් සාකච්ඡා මගින් නවෝත්පාදන ඇති කළෙමු.

**ගුවන් සේවා අලෙවිකරන සූත්‍රය වසරක් තුල මරාජාගු තොටුපල වෙතට**

අලෙවිකරණ අංශය පිහිටුවා වසරක් තුල ගුගුසේ සමාගම සිදුවීම් ගහණ කාල පරිච්ඡේදයක් පසු කළේය. තමන් විසින් ආරම්භ කොට සංවිධානය කළ සේ පෙනෙන මරාජාගු තොටුපල සියලු ප්‍රවර්ධන සංචාර පිළිබඳව එහි අනාගත සැලසුම් ද සමග විදේශ දූතමණ්ඩල ප්‍රධානීන්, සංවිධාන නියෝජිතයින් දැනුවත් කරන ලදී. වැඩබිම් සංචාර සිවිල් ඉංජිනේරුවරුන්ගේ ආධාරයෙන් පහසු කරන ලදී.

**ලෝක මාර්ග සංවර්ධන සංසදය (WRDF)**

ලෝක ප්‍රසිද්ධ ගුවන් සේවා සහ ගුවන් තොටුපල ජාලයක් ලෝක මාර්ග සංවර්ධන සංසදය මගින් සංවිධානය කරන ලදී. සෑම වර්ෂයකම ගෝලීය සිදුවීමක් සහ ආසියා, අප්‍රිකා යුරෝපය, ලතින් ඇමරිකා වැනි රටවල පිළිවෙලින් එක් කලාපීය සිදුවීමක් සිදුවුනි.

ගු.ගු.සේ සමාගම 2012 අප්‍රේල් 15-18 කාලය තුල චීනයේ චෙන්ග්ඩු නුවර පැවැති මාර්ග ආසියා සංසදයට දූත මණ්ඩලයක් ලෙස සහභාගි විය. ඒ අතර චීනය 2012 සැප්තැම්බර් මාසයේ දී අබුධාබිහි පැවැත්වෙන ලෝක මාර්ග සංසදයට ලියා පදිංචි වීම සඳහා සියලුම ගුවන් සේවා ආයතන වෙත ආරාධනා කරන ලදී.

ගු.ගු.සේ සමාගම මරාජාගු තොටුපල ප්‍රවර්ධනය කිරීම සඳහා 2012 සැප්තැම්බර් 29 සිට ඔක්තෝබර් 2 දක්වා පැවැත්වූ ලෝක මාර්ග සංවර්ධන සංසදයේ ප්‍රදර්ශනයට සහභාගි වන ලදී.

මෑතදී අවසන් වූ අලෙවිකරණ වැඩසටහනක් වූයේ 2012 බ.ජා.ගු තොටුපලේ පැවති නත්තල් සාප්පු සවාරි උත්සවයයි. වැඩසටහන 2012 දෙසැම්බර් සිට 2013 ජනවාරි දක්වා මාස දෙකක කාලයක් පැවැත්වුනි. වාර්තාගත සාප්පු ගණනාවක් මේ සඳහා සහභාගිවූ අතර මෝටර් වාහන ත්‍යාගවල සිට මුදල් ත්‍යාග දක්වා තෑගි, දෛනික ක්ෂණික තෑගිද විශාල සංඛ්‍යාවක් විය.




*CATC ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේදී සභාපතිතුමා සහභාගීවූවන් අමතමින්*



*CATC ඩිප්ලෝමාධාරීන් අධ්‍යක්ෂ මණ්ඩලය, සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් හා කළමනාකරුවන් සමඟ*

**මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල (MRIA) – ඉක්මණින් ආරම්භ කිරීමට සූදානම්**

**නව ගමන් මෙතැනින් ඇරඹෙයි**

ම.රා.ජා.ගු තොටුපල 2013 මාර්තු 18 දින අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

ම.රා.ජා.ගු තොටුපල තම කවුලු ලෝකයට විවෘත කරන ලදී. මෙම නව සහ විශිෂ්ඨ ජාත්‍යන්තර කේන්ද්‍රස්ථානය ශ්‍රී ලංකාවේ දකුණු සහ නැගෙනහිර කලාපයේ සංවර්ධන පහසුකම් ඇති කිරීමට පොරොන්දු දී තිබේ. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ගේ සිතිවිල්ලක්වූ විශිෂ්ඨ පාරිසරික ව්‍යාපෘතියක් ලෙස ඉදිවුනු ජාත්‍යන්තර ගුවන් තොටුපල දිවයිනේ දකුණු සහ නැගෙනහිර කලාපය වේගවත් පරිවර්තනයකට භාජනය කර ඇත.

නව සංචාරක කර්මාන්තය පෝෂණය කිරීමට ඉවහල් වන යාබද ප්‍රදේශයන්හි ආයෝජනය මගින් රැකියා අවස්ථා ගණනාවක් නිර්මාණය කරන ශ්‍රී ලංකාවේ ආර්ථික ආයෝජන සඳහා දොරටුවක් වූ ජාත්‍යන්තර මට්ටමේ ගුවන් තොටුපලක් හම්බන්තොට ඉදිකිරීම සඳහා ගු.ගු.සේ සමාගම වෙහෙස නොබලා වැඩ කරන ලදී.

උපායමාර්ගික ලෙස ලෝකයේ 60% ප්‍රමාණයක් පැය 8 ක් ඇතුලත සම්බන්ධ කර ගත හැකි වන පරිදි පිහිටවූ ම.රා.ජා.ගු තොටුපල A380 ගුවන්යානා පහසුකම් සහිත පළවන ගුවන් තොටුපල වේ. ගුවන් තොටුපලේ නව ආකාරය වර්ග මීටර් 12,000 ක අන්තර්ජාතික පර්යන්තයකින් සහ වර්ග අඩි මිලියන එකක තීරු බදු රහිත සංකීර්ණයකින් සමන්විත වීම ආඩම්බරය විය හැකි දෙයකි. එහි අන්තර්ජාතික පරීක්ෂණ කවුලු 10 ක් දේශීය පරීක්ෂණ කවුලු 2 ක් සම්බන්ධිත දොරටු 2 ක් සහ මගීන් ඇතුලු කර ගන්නා දොරටු 2 ක් තිබේ. අදියර දෙක සංවර්ධනයත් සමග අන්තර්ජාතික පරීක්ෂණ කවුලු 26 ක් දේශිය පරීක්ෂණ කවුලු 8 ක් සහ මගීන් ඇතුලත් කර ගන්නා කවුලු 28 ක් පර්යන්තයට එක් වෙනු ඇත.

සැලසුම් ඉලක්කය වී ඇත්තේ පරිසරහිතකාමී ගුවන් තොටුපලක් නිර්මාණය කිරීමයි. අසල්වාසී පාරිසරික තත්වයන්ට බාධා ඇති



*අලෙවිකරණ ව්‍යාපාරය - 2012 ලෝක මාර්ග සංවර්ධන සංසද ප්‍රදර්ශනයේදී*




*2012 බ.ජා.ගු.නත්තල් සාප්පු සැණකෙළිය - ජයග්‍රාහකයින්*



*ෆෙයිට් ෆෝවර්ඩර්ස් සංගමය මත්තල සංචාරය කරයි*



*එක්සත් ජනපද පත්‍රකලාවේදීන් එක්සත් ජනපද තානාපතිතුමා සමග මත්තල සංචාරයේදී*



*බ්‍රිතාන්‍ය මන්ත්‍රීමණ්ඩල සාමජිකයන් මත්තල ගුවන්තොටුපලේ ප්‍රගතිය පිළිබඳව සංචාරයේ*



*ගුවන් ප්‍රවාහන සමාගම් මෙහෙයුම් කමිටුවේ සාමාජිකයින් මත්තල සංචාරය කරයි*




*ගුවන් ප්‍රවාහන සමාගම් නියෝජිතයින් මත්තල සංචාරය කරයි*

නොවීමටත් ඉදිකිරීම් කාලය තුල පාරිසරික අසමතුලිතතාවක් සිදු නොවීමටත් ප්‍රවේශම්කාරී විය.

ගොඩනැගිලි සහ ගුවන් තොටුපල යටිතල ව්‍යුහයන් පරිසරය සමග මිශ්‍ර නොවන ආකාරයට සැලසුම් කරන ලදී. බලශක්ති පරිභෝජනයෙන් 1/4 ක් ස්වාභාවික බලශක්ති මගින් සිදුවන ආකාරයට සැලසුම් කරන ලදී. පවත්නා ජල මූලාශ්‍ර ආරක්ෂා කළ අතර පාරිසරික සමතුලිතතාවය සුරැකීම සඳහා නව ජල මූලාශ්‍ර ඉදිකරන ලදී.

මරාජාගු තොටුපල ශ්‍රී ලංකාවට විකල්ප ගුවන් ප්‍රවාහන ජාලයක් සපයයි. එය විවෘත වීමත් සමග කොටසක් මෙහි හැරවීම නිසා බජාගු තොටුපලේ පැවති මාර්ග තදබදය වැලකී යනු ඇත. ගුවන් තොටුපලේ එලිමහන් නැවතුම් අංගන දෙකක් ඇති අතර පර්යන්ත ගොඩනැගිල්ලේ වාහන 400 ක් සඳහා ඉඩකඩ ඇත. පර්යන්ත ගොඩනැගිල්ලේ සිට මීටර් 300 ක් ඔබ්බෙන් නැවතුම් ස්ථානයක් ඇති අතර පහසු ගාස්තු යටතේ එහි වාහන නවතා තැබිය හැකිය.

ගුවන් තොටුපලෙහි මීටර් 3500 ක් දිග මීටර් 60 ක් පලල එක් ගුවන් ධාවන පථයක් (05/23) ඇත. එහි A380 වැනි විශාල ගුවන් යානා හැසිරවිය හැකිය. ගුවන් පථය ඉදි කිරීම 2011 ජුලි මාසයේ අවසන් කරන ලදී. TWY A සහ TWY B වශයෙන් ටැක්සි ධාවන මාර්ග දෙකක් ද ඉදි කෙරේ.

මරාජාගු තොටුපල රටෙහි යටිතල ව්‍යුහයන් සහ සංචාරක කර්මාන්තය දියුණු කිරීමට බලාපොරොත්තු වන අතර අවට සංචාරය සඳහා මිනිසුන් දිරිමත් කිරීමටද බලාපොරොත්තු වෙයි.

අඩු පිරිවැය සහිත ඉඩම් විශාල වශයෙන් ලබා ගැනීමට හැකි නිසා එය ගුවන් සේවා සහ ගුවන් සේවා නඩත්තු කිරීම් කර්මාන්ත සඳහා ප්‍රශස්ථ ස්ථානයක් වෙයි. යාබද ප්‍රදේශ විශාල කෘෂිකාර්මික කලාපයක් නිසා ගුවන් තොටුපලේ භාණ්ඩ ප්‍රවාහන පහසුකම් රටෙහි නිර්යාත ධාරිතාව වැඩි දියුණු කිරීමටත් ඒ මගින් ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීමටත් ඉවහල් වෙයි.

ගුවන් නාවික මිනුම් ආධාරක පිළිබඳ ගුවන් සමීක්ෂණ 2012 ඔක්තෝබර් 16 වන විට නව ගුවන් තොටුපලේ සාර්ථක ලෙස සවිකර අවසන් කරන ලදී. ඒ මගින් ගුවන් තොටුපලේ පළමු පරීක්ෂණ ගොඩ බැසීමද කරන ලදී. පළමු අදියර වාර්ෂික මගී සංචරනය මිලියන 1ක්ද ගුවන් භාණ්ඩ ප්‍රමාණය මෙ ටොන් 45,000 ක්ද වේ. මෙම අවධිය සම්පූර්ණ වන විට ගුවන් තොටුපල පහත දේ වලින් සමන්විත වේ.

- මීටර් 3,500 ක් දිග මීටර් 75 පලල කෝඩ් එෆ් වර්ගයේ ගුවන් යානා රැඳවිය හැකි ගුවන් පථයක්
- කොටස් දෙකකින් යුතු ටැක්සි ධාවන මාර්ග දෙකක්
- 9-11 දක්වා වූ ගුවන් යානා රැඳවිය හැකි අංගනයක්
- - වර්ග මීටර් 10,000 ක භූමි ප්‍රදේශයක් සහිත පර්යන්ත ගොඩනැගිල්ලක්
- නවීන පහසු කම් වලින් සමන්විත වර්ග මීටර් 5,000 ක නවීන තත්වයේ භාණ්ඩ පර්යන්තයක්
- ගොඩබිම ගුවන් නාවික කටයුතු සේවා
- ගිනි සහ මුදා ගැනීමේ පහසුකම්

## නව සහ විශිෂ්ඨ ජාත්‍යන්තර කේන්ද්‍රස්ථානය වූ මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොල ශ්‍රී ලංකාවේ දකුණු සහ නැගෙනහිර කලාපයේ සංවර්ධනය වෙනුවෙන් මුල්වීමට සහ පහසුකම් සැපයීමට පොරොන්දු වෙයි.



අතිගරු ජනාධිපතිතුමාගේ මත්තල ගුවන්තොටුපල සංචාරය -පාලන කුළුණ

**කාර්යසාධන සමාලෝචන චාරිකා**

**අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ 2012 ඔක්තෝබර් 19 දින මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල වෙත පරීක්ෂණ චාරිකාවක් සඳහා පැමිණුනි.**

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ 2012 ඔක්තෝබර් 19 දින මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල වෙත පරීක්ෂණ චාරිකාවක් සඳහා පැමිණි අතර ඉදිවෙමින් තිබූ ගුවන් තොටුපලෙහි සුවිසල් ඉදිකිරීම් වල තත්වය අධීක්ෂණය කරන ලදී. තම නිරීක්ෂණ චාරිකාව අතරතුර ජනාධිපතිතුමා ගුවන් පථය, ගුවන් යානා රැඳවුම් ස්ථානය, පර්යන්ත ගොඩනැගිල්ල සහ පාලන කුළුණ හොඳින් පරීක්ෂා කරන ලදී. එසේම දැනට පාකිස්ථාන සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ක්‍රියාත්මක කෙරෙන මිනුම් ක්‍රියාවලිය පිළිබඳව විශේෂ ගුවන් යානයක් යොදා ගනිමින් ජනාධිපති තුමා හට කරුණු පැහැදිලි කරන ලදී.



අතිගරු ජනාධිපතිතුමාගේ මත්තල ගුවන්තොටුපල සංචාරය -ප්‍රගති සමාලෝචනය

ගුවන් සේවා ගරු අමාත්‍ය ප්‍රියංකර ජයරත්න ඇතුලු ඇමතිවරු කිහිපදෙනෙක් සහ පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ යන මහත්වරුන් මෙම අවස්ථාවට සහභාගි වූහ.

**ශ්‍රී ලංකා මහ බැංකු අධිපති මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල නරඹයි**

2012 ජූලි මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල නැරඹීම සඳහා පැමිණියේය.




මහබැංකු අධිපතිතුමාගේ මත්තල සංචාරය

# මූල්‍ය සමාලෝචනය

“කොහේද ඉලක්කම් හඬ නගන්නේ...”





# **මූල්‍ය** සමාලෝචනය

**මූල්‍ය විග්‍රහය**

ගු.ගු.සේ සමාගම ශ්‍රී ලංකාව තුල පවත්වා ගෙන යන සම්පූර්ණයෙන්ම රජයට අයත් සංස්ථාපිත සමාගමක් වන අතර අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා ආයතනයේ (ICAO) සාමාජිකයෙක්ද වෙයි. එහි ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත වන්නේ බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපල (BIA) පරිපාලනය කිරීමයි. එයට අමතරව රත්මලාන ගුවන් තොටුපලේ දේශීය මෙහෙයුම් සහ මත්තල හම්බන්තොට මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ (MRIA) ඉදිකිරීම් කටයුතු ද සමාලෝචිත වර්ෂය තුලදී එමගින් සිදු කරන ලදී.

සමාගමේ මූල්‍ය කාර්යසාධනය අපගේ ස්ථාවරත්වය, තිරසාර පැවැත්ම සහ අඛණ්ඩ වර්ධන දර්ශකයන් සම්බන්ධ බොහෝ කරුණු ඉදිරිපත් කරයි. අපගේ නොසැලෙන උපායමාර්ගික කේන්ද්‍රගත කිරීම්, නිපුණ කළමනාකරන පරිචයන් සහ යහ පාලන මූලධර්ම අනුගමනය කිරීම නිසා ගුගුසේ සමාගමෙහි යහපත් මූල්‍ය තත්වයක් වාර්තා කරමින් මෙහෙයුම් කටයුතු වල වේගවත් සංවර්ධනයක් ආරක්ෂා කර ගැනීමට අපට හැකි විය.

### ගුවන් යානා චලනයන්




### ආදායම් ප්‍රකාශනය ප්‍රස්ථාරිකව ඉදිරිපත් කිරීම
### වර්ෂය මත වර්ෂය සැසඳීම




### ගුවන් මගී චලනයන්



## බ.ජා.ගු ගුවන් ගමන් වර්ධනය කලාපීය වර්ධනය සමග ගැලපීම




## ආදායම් වර්ගීකරණය




### මෙහෙයුම් ආදායම්

ආසියානු කලාපයේ අනෙකුත් ගුවන් තොටුපලවල් සමග තරඟයකට මුහුණදුන්නත් මුළු මෙහෙයුම් ආදායම රු.බිලියන 10.7 ක් එනම් පසුගිය වර්ෂය සමග සසඳන විට 19% ක වැඩිවීමක් තහවුරු කර ගැනීමට අපට හැකි විය. ගඟන නොවන ආදායම් රු.බිලියන 8 ක් වූ අතර එය මුළු මෙහෙයුම් ආදායමෙන් 75% ක් විය. එසේම ගඟන ආදායම් රු.බිලියන 2.7 ක් වූ අතර එය 25% ක් විය.

### ගඟන නාවික ආදායම්

සෘජුවම ගුවන්යානා සම්බන්ධ ආදායම් මෙම ගණයට වැටෙයි. මුළු ගුවන් ආදායම්වලින් ගොඩබැසීමේ සහ නැවතීමේ ගාස්තු ලෙස දායකත්වය 67% ක් වන අතර එය 2011 වර්ෂයට සන්සන්දනාත්මකව 29% ක වර්ධනයකි. මෙම වර්ධනය මූලික වශයෙන් ශක්තිමත් කර ගැනීමට අපට හැකි වූයේ 2011 දී 43,454 ක් වූ ගුවන් ගමන් වාර ගණන 2012 දී 48,416 දක්වා වැඩිවීම හේතුවෙනි. මෙය 11% ක වැඩිවීමකි. එසේම ගුවන් ගත කිරීමේ උපරිම බර (MTOW) 2011දී 3,074,640 සිට 2012 දී 3,316,795 දක්වා එනම් 8% ක වර්ධනය හේතුවෙනි. ඒ අනුව වර්ෂ පහක කාලයකට ගුවන් වාර ගණන සහ උපරිම ගුවන් ගත කිරීමේ බර පහත දැක්වෙන ලෙස ඉස්මතු කර දැක්විය හැකිය.

## බ.ජා.ගු හි මගී වර්ධනය කලාපීය වර්ධනය සමග ගැලපීම




## උපරිම ගුවන්ගත කිරීමේ බර




**විස්තරය** :

AFR - අප්‍රිකානු
ASP - ආසියා පැසිපික්
EUR - යුරෝපය
LAC - ලතින් අමරිකා -කැරිබියන්
MEA - මැද පෙරදිග
NAM - උතුරු අමරිකාව
BIA - බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපල කොළඹ

### ගොඩබැසීමේ ගාස්තු




2011 වර්ෂයට සන්සන්දනාත්මකව පියාසර ගුවන් යානා ගාස්තු ආදායම 21% ක ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි. පියාසර ගුවන්යානා ගාස්තු ආදායම වැඩි වූයේ 2011 වර්ෂයට සන්සන්දනාත්මකව පියාසර ගුවන් යානා සංචලතාවය 5% කින් වැඩිවීම හේතුවෙනි. එම නිසා පියාසර ගුවන් යානා ගාස්තු ගුවන් නාවික ආදායම් වලින් 22% ක් වී ඇත. වසර පහක පියාසර ගුවන් යානා ආදායම පහත දැක්වෙන අයුරු විග්‍රහ කළ හැකිය.

### පියාසර ගුවන්යානා ගාස්තු




ගුවන් මඟී පාලම් ගාස්තුද 22% ක වර්ධනයක් වාර්තා කරයි. මෙය ප්‍රධාන වශයෙන්ම ගුවන්යානා වර්ගය සහ මඟී පාලම් යොදා ගැනීමේ කාලය මත සිදුවෙයි. වසර පහක කාලය සඳහා ගුවන් මඟී පාලම් ආදායම පහතින් දැක්වේ.

### ගුවන් මඟී පාලම් ගාස්තු




**ගඟන නාවික නොවන ආදායම්**

මෙය ගොඩබිම ආශ්‍රිත වාණිජමය ආදායම්වලින් සමන්විත වේ. ගු.ගු.සේ සමගමේ තීරණාත්මක සාධකයට විශාල ලෙස දායක වන ගගන නාවික නොවන ආදායම 2011 ට සාපේක්ෂව 17% ක වර්ධනයක් පෙන්වයි. මුලු ගගන නාවික නොවන ආදායමෙන් 32% ක් වූ ප්‍රධාන ආදායම මෙහි ප්‍රධාන දායකය බවට පත් වෙමින් 24% ක් දක්වා වැඩිවී ඇත. ගොඩ බැසීමේ බදු 2011 වසරට සාපේක්ෂව 9% ක වර්ධනයක් වාර්තා කර ඇත. එය ගගන නාවීක නොවන ආදායමෙන් 24% ක් වේ. 2011 ට සාපේක්ෂව ගත් කළ එය 15% ක වැඩිවීමකි.

### අනුග්‍රාහක ආදායම්



## නැව්නැගීමේ බදු




## බදුකුළී




### මෙහෙයුම් නොවන ආදායම්

මෙයින් නියෝජනය වන්නේ සමාගමේ මූල්‍ය ආදායම් සහ අනෙකුත් ආදායම්ය. ඒ අනුව ආයෝජන මගින් ජනිතවන ආදායම් මූල්‍ය ආදායම් යටතේ වර්ග කරන අතර මෙහෙයුම් නොවන අනෙකුත් ආදායම් වෙනත් ආදායම් යටතේ වර්ග කර ඇත.

2011 දී රු මිලියන 331 ක් වූ වෙනත් ආදායම් 2012 දී රු.මිලියන 426 ක් විය. එය 29% ක වර්ධනයක් වාර්තා කරයි. මෙය විනිමය වෙනස් වීමේ වැඩි වීමක් නිසා සිදුවූවකි. එය රු.මිලියන 46 සිට රු.මිලියන 255 දක්වා 451% ක ඉහළ වර්ධනයකි. තවද ඉන්ධන සැපයුම් මධ්‍යස්ථාන වල ලාභය 52% ක වර්ධනයක් පෙන්නුම් කරමින් රු.මිලියන 8 සිට රු.මිලියන 12 දක්වා වැඩි වී ඇත.

මූල්‍ය ආදායම් කළින් වර්ෂයට සාපේක්ෂව 36% ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙය මූලික වශයෙන් ණයකර පොලිය රු.මිලියන 40 සිට රු.මිලියන 266 දක්වා 563% ක වර්ධනයක් නිසා සිදුවිය. එය මෙහෙයුම් නොවන ආදායමට ප්‍රබල බලපෑමක් සිදු කර ඇත. එසේම ස්ථාවර තැන්පතු මගින් ලැබූ පොළිය 2011 රු.මිලියන 74 ට එරෙහිව 2012 වසරේ දී රු.මිලියන 99 ක් විය. පොලී අනුපාත වැඩිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල 32% ක වැඩිවීමක් වාර්තා කරයි.

වසර දෙකක කාලය තුල ලැබූ මෙහෙයුම් නොවන ආදායම් (වෙනත් ආදායම් සහ මූල්‍ය ආදායම්) පහත සඳහන් ආකාරයට පෙන්වා දිය හැකිය.

## මෙහෙයුම් නොවන ආදායම්




## ආදායම් විශ්ලේෂණය




### මෙහෙයුම් වියදම්

මේ යටතේ පුලුල් වශයෙන් වර්ගීකරනය කරනු ලබන වියදම් වනුයේ පරිපාලන, ආයතන සහ අලෙවිකරන සහ මූල්‍ය පිරිවැය වේ. අපගේ අඛණ්ඩ උපාය මාර්ගය වනුයේ සියලුම පිරිවැය ආක්‍රමණශීලී ආකාරයට කළමනාකරණය කිරීමයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආදායමට පිරිවැය අනුපාතය කළින් වර්ෂයේ 84% සිට ජංගම වර්ෂයේ 74% දක්වා අඩු කිරීමට අපට හැකි විය. කෙසේ වුවද අපගේ මෙහෙයුම් වියදම් 2011 වර්ෂයේ රු.බිලියන 7.7 සිට 2012 දී රු.බිලියන 8 දක්වා වර්ධනය විය. එය 4% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. පිරිවැය වැඩිවීමක් පෙන්නුම් කළද මෙහෙයුම් ආදායම් 19% කින් වැඩි වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස 2012 වර්ෂයේදී ස්ථාවර ස්වරූපයේ වියදම් නොවෙනස්ව පැවතුනු නිසා

පිරිවැය ආදායම් අනුපාතය පහත වැටීමක් සිදුවී ඇත. වියදම් සංයුතිය සහ ආදායම් පහත දැක්වෙන ආකාරයට තවදුරටත් විග්‍රහ කර දැක්විය හැකිය.

ආදායම් විශ්ලේෂණය




**පරිපාලන, ආයතන සහ අලෙවිකරණ වියදම්**
මෙය පුද්ගල පිරිවැය, පරිපාලන සහ ආයතන, අලුත්වැඩියා සහ නඩත්තු යන වියදම් වලින් සමන්විත වේ. එමනිසා මූල්‍ය වියදම් හැර අනෙකුත් සියලු පිරිවැය මේ යටතේ වර්ගීකරණය වන බව කෙටියෙන් කිව හැකිය.

මේ යටතේ වන ප්‍රධාන වර්ගීකරණය පරිපාලන ආයතන සහ අලෙවිකරණ වියදම් වලින් 56% ක් වූ පුද්ගල පිරිවැය වේ. එනම් ගුගුසේ සමාගමේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම පවත්වා ගැනීම පුහුණු කිරීම සඳහා වූ පිරිවැයයි. අපගේ වියදම් ව්‍යුහයේ විශාලම අංගය වන පුද්ගල පිරිවැය සමාගමේ මුළු පිරිවැයෙන් 44% කි. පසුගිය වර්ෂය සමග සසඳන විට ජංගම වර්ෂයේ පුද්ගල පිරිවැය 13% ක වැඩි වීමක් පෙන්නුම් කරයි. සමාගමේ ඒකාබද්ධ වැටුප් ප්‍රමාණය රු බිලියන 1.7 සිට රු බිලියන 2 දක්වා 21% ක වැඩි වීමක් 2012 දී වාර්තා වී ඇත. මළු ගුවන් තොටුපල ආදායමට සාපේක්ෂව කාර්ය මණ්ඩල පිරිවැය අනුපාතය 33% ක් ලෙස පවතියි. එය පසුගිය වසරේ 35% ක් විය. අර්ථසාධක අරමුදල, සේවා නියුත්තයන්ගේ භාර අරමුදල, අතිකාල, නිවාඩු ගෙවීම් ආදී වියදම් ද පිළිවෙලින් 21%, 14% සහ 13% ක් ලෙස වර්ධනය වී ඇත. කෙසේ වුවද වට්ටම් අනුපාතයේ වැඩිවීම නිසා 2011 ට සාපේක්ෂව පාරිතෝෂික ප්‍රතිපාදනයන්හි 43% ක පහත වැටීමක් පෙන්නුම් කරයි.

විදුලිය වියදම් පරිපාලන ආයතන සහ අලෙවිකරණ වියදම් වලින් 12% ක් නියෝජනය කරයි. 2012 මාර්තු සිට අදාල වූ රු මිලියන 149 ක ඉන්ධන ගැලපුම් ගාස්තු හේතුවෙන් සමස්ථයක් ලෙස විදුලිය වියදම් අයකිරීම් වල 30% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

පසුගිය වර්ෂයට සන්සන්දනාත්මකව සමාලෝචිත වර්ෂය තුලදී වෙනත් වියදම් වල 22% ක වර්ධනයක් නිරූපනය කරයි. 2012 මිල වෙනස් කිරීම් අනුව ඉන්ධන පිරිවැය 47% කින් වැඩිවීම මෙයට ප්‍රධාන හේතුව වේ. අන්තර්ජාතික අලෙවිකරණ වියදම් වැනි සමහර පිරිවැය අංග 2011 වර්ෂය සමග සසඳන විට 154% ක් වූ අනුපාතයක පවතියි. මෙයට හේතුව වූයේ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ විශාල වශයෙන් සිදු කළ ප්‍රවර්ධනාත්මක කටයුතු වේ.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අනුව සංශෝධනය කිරීම හේතුවෙන් බොල් ණය සඳහා වූ ප්‍රතිපාදනය 80% කින් ඉහළ ගොස් ඇත.

මෙම පිරිවැය යටතේ වර්ගීකරණය කෙරෙන අලුත්වැඩියා සහ නඩත්තු වියදම් රු මිලියන 242 සිට රු.මිලියන 210 ක් දක්වා 14% ක පහත වැටීමක් 2012 දී පෙන්නුම් කරයි. සන්නිවේදන උපකරණ වල අලුත්වැඩියා සහ නඩත්තු වියදම් ද 2011 වර්ෂයේ රු.මිලියන 31 සිට 2012 වර්ෂයේ රු.මිලියන 16 දක්වා 49% ක සුවිසල් පහත වැටීමක් විදහා දක්වයි. එසේම කාර්යාල උපකරණ සඳහා අලුත් වැඩියා සහ නඩත්තු වියදම් ද රු.මි.11 සිට රු.මි. 7 ක් දක්වා පහත වැටී ඇත. එය ප්‍රතිශතයක් ලෙස 65% ක් වේ. තවදුරටත් සියලුම අලුත්වැඩියා සහ නඩත්තු වියදම් පහත වැටීමේ ප්‍රවණතාවයක් පවතී.

**මූල්‍ය වියදම්**
83% ක සුවිශේෂී අංගයක් නිරූපනය කරන මූල්‍ය පිරිවැය ණය පොලී සහ ණය පරිවර්තනයේදී වන විනිමය පාඩු වලින් යුක්ත වේ. 2011 වර්ෂයට සාපේක්ෂව විදේශ මුදල් මත විනිමය අලාභය 13% කින් පහත වැටීමක් වාර්තා කරයි.

**ලාභදායිතාවය**
2011 වර්ෂයේදී රු බිලියන 2.1 ක් ලෙස වාර්තාවූ බදු පෙර ලාභය සමග සසඳන කළ සමාගම 2012 වර්ෂයේදී එය රු.බිලියන 3.9 ක් ලෙස එනම් 80% ක සුවිශේෂී වර්ධනයක් වාර්තා කොට ඇත. 2011 වර්ෂයට සාපේක්ෂව ආදායම් බදු වැඩිවීම 49% කි. ගුගුසේ සමාගම 2011 වර්ෂයේ රු.බිලියන 1.4 ක බදු පසු ලාභය සමග සසඳන කළ 2012 දී රු.බිලියන 2.7 ක් වාර්තා කොට තිබේ. එය 97% ක කැපී පෙනෙන වැඩිවීමකි. මෙය සමාගමේ උපාය මාර්ගික දැක්ම සහ ගුවන් තොටුපල ව්‍යාපාරයේ තිරසාර පැවැත්ම පිළිබඳ වැදගත් සාක්ෂි වේ. එම නිසා රු.බිලියන 2.7 ක බදු පසු ලාභය වසර 29 ක ඉතිහාසය තුල අත්පත් කර ගත් ඉහළම ලාභය ලෙස වාර්තාගත වේ. සමාගමේ ලාභදායිත්වය පහත දැක්වෙන ප්‍රස්ථාරික සටහනෙන් සන්සන්දනාත්මකව ඉදිරිපත් කළ හැකිය.




## මුදල් ප්‍රවාහය

2011 වසරේදී රු.බිලියන 5.6 ක් වූ මෙහෙයුම් කටයුතු මගින් ජනිත මුදල් ප්‍රවාහය 2012 දී රු.බිලියන 8.6 ක් ලෙස එනම් 54% ක වර්ධනයක් වාර්තා කොට ඇත. මෙය ප්‍රධාන වශයෙන්ම 2011 වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂය තුල ශුද්ධ ලාභයේ සහ කාරක ප්‍රාග්ධනයේ වැඩිවීමකි.

ආයෝජන කටයුතු සඳහා භාවිත ශුද්ධ මුදල් ප්‍රවාහය දේපල පිරියත සහ උපකරණ වැඩි වශයෙන් අත්පත් කර ගැනීම හේතුවෙන් 51% කින් වැඩි වී ඇත.

2012 වර්ෂයේදී රු.බිලියන 5.8 සිට රු.බිලියන 10.2 දක්වා 74% ක වර්ධනයක් සහිත දිගු කාලීන ණය ලැබීම් වැඩි වීම නිසා මූල්‍ය කටයුතු මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය 273% ක විශිෂ්ඨ වර්ධනයක් පෙන්නුම් කරයි.

ඉහත සඳහන් කරුණු හේතුවෙන් පසුගිය වර්ෂයේ මෙන්ම මෙම වර්ෂයේද මුදල් සහ මුදල් සමාන ප්‍රවාහයන්හි හිතකර වර්ධනයක් පෙන්නුම් කර ඇත. වසර දෙකක කාලය තුල මුදල් ප්‍රවාහයන්හි හැසිරීම පහත සටහනින් පෙන්නුම් කර ඇත.

## ශේෂ පත්‍රය

### ප්‍රාග්ධන ව්‍යුහය

ශේෂ පත්‍රය ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.මිලියන 20 කින්ද සංචිත රු.මිලියන 893 කින්ද රඳවා ගත් ඉපයුම් රු.මිලියන 3,304 කින්ද සමන්විත වේ. රඳවා ගත් ඉපයුම් වූ රු.මිලියන 893 ගුගුසේ සමාගම සංස්ථාපනය කිරීමේදී ගුවන් තොටුපල අධිකාරිය වෙතින් කරනු ලැබූ මාරු කිරීම් වලින් සමන්විත වේ. රඳවා ගත් ඉපයුම් 2011 දි රු.බිලියන 0.36 ක සිට 2012 දී රු.බිලියන 3.3 ක් දක්වා 813% ක විශාල වර්ධනයක් පෙන්නුම් කරයි.

### කාරක ප්‍රාග්ධනය

කාරක ප්‍රාග්ධනය මගින් ගුගුසේ සමාගමේ ජංගම වගකීම් (කෙටිකාලීන වගකීම්) පියවීම සඳහා ජංගම වත්කම්හි ප්‍රමාණවත් බව පෙන්නුම් කරයි. 1.8 : 1 අනුපාතය පවත්වා ගැනීම මෙහෙයුම් කාර්යක්ෂමතාවය විදහා දක්වන මූල්‍යමය වශයෙන් හිතකර තත්වයක් ලෙස සැලකේ. වසර දෙකක කාලය තුල කාරක ප්‍රාග්ධන විශ්ලේෂණය පහත සඳහන් වගුවෙන් ඉදිරිපත් කර ඇත.




### වත්කම්

2011 වසරට සාපේක්ෂව අප සමාගමේ මුලු වත්කම් පදනම මත 37% ක වර්ධනයක් 2012 දී පෙන්නුම් කරයි. එය රු.බිලියන 36 සිට රු.බිලියන 50 දක්වා වූ වැඩි වීමකි. ජංගම වත්කම් හි 30% ක පහත වැටීමක් ඇති අතර ජංගම නොවන වතක්ම් හි 70% ක වර්ධනයක් පෙන්නුම් කිරීම මෙයට ප්‍රධානම හේතුව වේ. වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ගිණුම් යටතේ වර්ග කළ ජංගම අත්තිකාරම් රු.බිලියන 4.2 2012 වර්ෂයේදී ප්‍රාග්ධන ගත කිරීම මෙයට හේතු විය. අපගේ වත්කම් සංයුතිය පහත සටහනින් පෙන්වා ඇත.



**ස්කන්ධ සහ වගකීම්**

පසුගිය වර්ෂය සමග සසඳන කළ ජංගම නොවන වගකීම් සහ විලම්බිත ආදායම් 33% ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙයට




ප්‍රධාන වශයෙන් බජාගු සහ මරාජාගු සංවර්ධන කටයුතු සඳහා ගනු ලැබූ 2011 ට සාපේක්ෂව 38% කින් වැඩි වූ දිගු කාලීන ණය වල වර්ධනය හේතු වී ඇත. 2012 වර්ෂයේදී රු.බිලියන 4.2 ක් ලෙස පවතින ජංගම වත්කම් 2011 දී රු.බිලියන 4 ක් විය. එනම් 4% ක පහත වැටීමකි. මුළු ස්කන්ධය සහ වගකීම් පහත දැක්වෙන ආකාරයට පෙන්නුම් කළ හැකිය.



### එකතු කළ අගය ප්‍රකාශනය

| | | 2012<br>රු.000 | | 2011<br>රු.000 | |
|---|---|---|---|---|---|
| ආදායම් | | 10,687,381 | | 8,959,272 | |
| වෙනත් ආදායම් | | 426,332 | | 331,038 | |
| උපකල්පිත අවදානම් වෙනස් වීම මත ඇති වාසි | | 205,038 | | 115,632 | |
| | | **11,318,751** | | **9,405,941** | |
| පරිපාලන ආයතනික සහ අලෙවිකරන වියදම් | | (1,699,654) | | (1,484,132) | |
| එකතු කළ අගය | | **9,619,097** | | **7,921,809** | |
| එකතු කළ අගය බෙදා හැරීම | | | | | |
| සේවකයින්හට | පාරිශ්‍රමික සහ ප්‍රතිලාභ | 3,514,655 | 36% | 3,114,391 | 40% |
| රජයට | බදු | 1,121,112 | 12% | 751,113 | 9% |
| කොටස් හිමියන් හට | ලාභාංශ | - | 0% | 2,106,416 | 27% |
| ණය ප්‍රාග්ධනය සැපයුම් කරුවන්හට | ආපසු ගෙවීම් | 1,030,157 | 11% | 1,417,468 | 18% |
| ව්‍යාපාරය තුල රඳවා ගැනීම් | ක්‍ෂය කිරීම | 1,010,595 | 11% | 1,134,589 | 14% |
| - ව්‍යාපාරය තුල රඳවා ගැනීම් | සංචිත | 2,942,579 | 30% | (602,168) | -8% |
| | | **9,619,097** | **100%** | **7,921,809** | **100%** |

2011 එකතු කළ අගය බෙදාහැරීම




2012 එකතු කළ අගය බෙදාහැරීම



# මානව සම්පත් කළමනාකරණය

“කවුරුන්ද...?
පොදු අරමුණක් කරා විභවයන්
දෝලනය කරන්නේ...?





# **මානව** සම්පත් කළමනාකරණය

**මිනිස් බල ප්‍රභව**

2013 වර්ෂයේ විවෘත කිරීමට නියමිත මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල කටයුතු ඇරඹීමට යෝජනා කිරීම සමග 2012 වසරේදී ගුගුසේ සමාගමට නව අභියෝගයන්ට මුහුණ දෙන්නට සිදු විය. කළමනාකාරීත්වය සහ අංශ ප්‍රධානින් සමග සිදු කල සාකච්ඡා මගින් නව ගුවන් තොටුපල සඳහා අවශ්‍ය ප්‍රශස්ථ කාර්ය මණ්ඩලය ප්‍රවේශම්කාරී ලෙස තක්සේරු කළ යුතු විය. වඩා තීරණාත්මක කුසලතා අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනාගත් අතර එම අවශ්‍යතා අනුව මිනිස් බල සැපයීමට පියවර ගන්නා ලදී. මෙම ක්‍රියාවලියේදී තනතුරු සඳහා වන අනුමත බඳවා ගැනීම් පටිපාටි මත පදනම් වූ බඳවා ගැනීමේ විධික්‍රම භාවිතා කළ යුතු විය. 2012 වර්ෂය තුල බ.ජා.ගු සහ ම.රා.ජා.ගු තොටුපලවල නව තනතුරු සහ ඇබෑර්තු සඳහා 409 ක කාර්ය මණ්ඩලයක් බඳවා ගත්තෙමු.

නව ගුවන් තොටුපලේ නිපුන ශ්‍රමිකයින් අවශ්‍ය සමහර තනතුරු සඳහා බඳවා ගැනීමේදී පාර්ශවික උසස්වීම් ලබා ගැනීම සඳහා පවත්නා කාර්යමණ්ඩලයට ප්‍රමුඛතාවය දෙන ලදී. ඒ අනුව වර්ෂය තුල එවැනි උසස්වීම් 70 ක් සිදු කරන ලදී.

රැකියා මාවතෙහි එක තැන පල්වීම හඳුනාගැනිම සඳහා අප ආරම්භ කළ මූලික වැඩ සටහන් 2012 වර්ෂයේදීද නොවෙනස්ව දිගටම පවත්වා ගෙන යන ලදී. වෘත්තීය ඉදිරි ගමනට අදාල සේවක දුක්ගැනවිලි විසඳීම සඳහා නව යෝජනා ක්‍රමයක් කළමනාකාරීත්වය විසින් අනුමත කරන ලදී. ඒ අතර 2012 වර්ෂය තුල 2011 වර්ෂයේ අනුමත කළ කාර්යමණ්ඩල පාර්ශව සඳහා උසස් වීම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන ලදී. නව උසස්වීම් යෝජනා ක්‍රම මගින් අර්ධ පුහුණු මෙහෙයුම් අධීක්ෂණ සහ තාක්ෂණික ශ්‍රේණිවල සේවකයින් 809 කගේ ගැටලු විසඳන ලදී.

**සේවක කාර්ය සාධනය**

පොදු කළමනාකරණ, මෙහෙයුම් කළමනාකරණ, අධීක්ෂණ, ලිපිකරු සහ ආශ්‍රිත, පුහුණු සහ අනෙකුත් ශ්‍රේණි සම්බන්ධ කණ්ඩායම් ආවරණය කොට වර්ෂය තුල සේවකයින් 3295 ක් සම්බන්ධයෙන් ලබා ගත් කාර්යසාධන ඇගයීම් මගින් මානව සම්පත් අංශය සේවක කාර්යසාධනය ඇගයීමට ලක් කරන ලදී.

2012 තුල අවසාන කාර්යසාධන ඇගයීම මගින් අප සේවකයින්ගෙන් 97% ක් සංයුක්ත අරමුණු පිළිබඳ කාර්යසාධන ඉලක්ක සාර්ථක ලෙස අත්පත් කර ගෙන ඇති බව පෙන්වා දී ඇත. මෙය පහත සඳහන් වගුවෙන් පැහැදිලි කර තිබේ.

| වර්ගය | ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| විධායක | 227 | 7% |
| අධීක්ෂක වරු/තාක්ෂණ නිලධාරී/විකුණුම් සහකරුවන් | 319 | 9% |
| ලිපිකරු සහ ආශ්‍රිත | 634 | 18% |
| පුහුණු /අර්ධ පුහුණු කම්කරු | 1,725 | 50% |
| සුලු සේවක සහ නුපුහුණු | 540 | 16% |
| සේවක මුලු ගණන | 3,445 | 100% |

**"... පුහුණු ශ්‍රමිකයින් අවශ්‍ය වූ තැන පාර්ශවීය උසස්වීම් ලබා ගත හැකි වන පරිදි පවත්නා කාර්යමණ්ඩලයට ප්‍රමුඛත්වය දෙන ලදී. ඒ අනුව වර්ෂය තුල එවැනි උසස්වීම් 70 ක් ක්‍රියාත්මක කරන ලදී."**

2012 - වාර්ෂික වර්ධනයන්




කාර්යමණ්ඩල ශක්තිය



## හැකියාවන් ගොඩ නැගීම

ගුගුසේ සමාගම එහි ජයග්‍රහණයන් තම කාර්යමණ්ඩලයේ නිපුණතා සහ දක්‍ෂතා වල ප්‍රතිඵලයක්ය යන්න විශ්වාස කරයි. සංවිධානයේ අරමුණු අත්පත් කර ගැනීම විශේෂිත ප්‍රමාණාත්මක මිනුම් සහ පාර්ශවීය මට්ටමේ අරමුණු අතර සම්බන්ධයක් ලෙස සලකන විට, පුහුණු කිරීම සහ සංවර්ධනය ඉලක්ක ගත අත්පත් කර ගැනීමේ සහ වර්තමාන කාර්යසාධනය අතර පරතරය සම්බන්ධ කරන උත්ප්‍රේරකය ලෙසින් සලකයි.

එමනිසා කාර්යමණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය උදෙසා සැලකියයුතු අරමුදල් ප්‍රමානයක් වෙන් කරන ලදී. 2011 වර්ෂයේ දේශීය සහ විදේශීය පුහුණුව ලැබූ 1365 ක කාර්යමණ්ඩලය සමග සසඳන විට 2012 දී එම අවස්ථා ලබාගත් ගණන 1751 ක් දක්වා වර්ධනයක් විය. 2012 දී මේ සඳහා ආයෝජනය කළ මුලු ප්‍රමාණය රු මිලියන 66 ක් විය.

සෑම සේවකයෙකු සම්බන්ධයෙන්ම පුහුණු වාර්තාවක් පවත්වා ගැනීම සහ එය අඛණ්ඩව යාවත්කාලීන කිරීම සිදු කෙරේ. එසේම නිසි කාලපරතරයක් තුල අවශ්‍ය දැනුම සහ කුසලතා අධීක්‍ෂණය කරන්නේද යන්නත් අවශ්‍ය පුහුණුව ලබා දීම සඳහා පියවර ගන්නේද යන්නත් සහතික කිරීම පිණිස ඒවා විශ්ලේෂණය කරනු ලබයි. අයවැය ප්‍රතිපාදන වලට අනුකූලව සැලසුම් සහගත ලෙස පිළියෙල කළ පුහුණු ලේඛන මාර්ගයෙන් මේවා ක්‍රියාත්මත කරනු ලබයි.

## දේශීය පුහුණුකිරීම

පෞද්ගලික සංවර්ධනය, පිළිගැනීම් නිපුණතා, භාෂා නිපුනතා වර්ධනය කිරීම තුලින් බාහිර පාරිභෝගිකයින්ගේ තෘප්තිය වැඩි දියුණු කිරීමේදී විශේෂ අවධානයක් යොමුවන පිලිගැනීම් නිලධාරි කාර්යමණ්ඩල වැනි කණ්ඩායම් පුහුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය වශයෙන් පුහුණු කල කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ ගණන වැඩි වී ඇත. වෙනත් අවධානය යොමු කළ කණ්ඩායම් වූයේ තාක්‍ෂණික ශ්‍රේණි, ශිල්පීය ශ්‍රේණි සහ මධ්‍ය කළමනාකරන ශ්‍රේණින්ය. 2012 වර්ෂයේදී පුහුණු අයවැය ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම සඳහා පිරිවැය අඩු ක්‍රම පිළිබඳව සැලකිල්ල යොමු කරන ලදී. ඒ අනුව අභ්‍යන්තර පුහුණු කිරීම් ප්‍රමාණය වැඩි කළ අතර සන්සන්දනාත්මකව බාහිර ප්‍රමාණය අඩුකරන ලදී. අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා අදාල ක්‍ෂේත්‍ර පිළිබඳ වෘත්තීය නිපුණත්වයක් ඇති සම්පත් දායකයින් හට ආරාධනා කරන ලදී. බාහිර පුහුණුවකට යැවීමට වඩා මෙය පිරිමැසුම්දායක වූවා සේම පුහුණු කටයුතු අපගේ පරිසරයට ගැලපෙන ඒවා වූ නිසා කාර්යමණ්ඩලයටද එය ප්‍රයෝජනවත් විය.

කාර්යමණ්ඩලය බාහිර පුහුණුව සඳහා යැවිය යුතුය යන්න අප විශ්වාස කරන බැවින් එවැනි පුහුණුවක් අවශ්‍ය වූ කාර්යමණ්ඩල වෙත එවැනි වැඩ සටහන් සංවිධානය කරන ලදී.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ සවි කිරීමට නියමිත නවීන උපකරණ භාවිතා කිරීම පිළිබඳව තාක්‍ෂණික කාර්යමණ්ඩල වෙත අවශ්‍ය වූ විස්තීර්ණ ප්‍රයෝගික පුහුණුවක් එතෙරදී ලබා දෙන ලදී. පවත්නා සහ ඉදිවෙන ගුවන් තොටුපලවල් සංවර්ධනය කිරීම වෙනුවෙන් ඉහළ නිපුනත්වයක් අවශ්‍ය ශ්‍රේණි වන ශිල්පීය ශ්‍රේණි පුහුණු කිරීම සඳහා විශේෂ අවධානය යොමු කරන ලදී. කාර්මික විද්‍යාලවල සහාය ඇතිව ශිල්පීය ශ්‍රේණි සඳහා තාක්‍ෂණ පුහුණුව ලබා දීම විශේෂයෙන් සංවිධානය කරන ලදී.

කාර්යමණ්ඩල පුහුණුකිරීම් - දේශීය 2012






පිළිගැනීමේ නිළධාරී කාර්ය මංඩලය දුරකථන කුසලතා පිළිබඳ පුහුණුවක් ලබමින්

| වාර්තා කිරීමේ මට්ටම | පුහුණු කළ කාර්යමණ්ඩල සාමාජිකයින් ගණන | |
|---|---|---|
| | 2012 | 2011 |
| ශිල්පීය ශ්‍රේණි සහ ආශ්‍රිත කේඩර | 19 | 33 |
| පිළිගැනුම් නිලධාරි සහ මාණ්ඩලික කේඩර | 1,069 | 903 |
| කණිෂ්ඨ කළමනාකරනය | 175 | 89 |
| මධ්‍ය කළමනාකරනය/තාක්‍ෂණික වෘත්තිකයින් | 214 | 193 |
| ජ්‍යේෂ්ඨ කළමනාකරනයට වාර්තා කරන්නන් | 25 | 6 |
| එකතුව | 1,502 | 1,224 |

සමාගම "රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහනක්" සහ "වාහන විමෝචන ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම" පිළිබඳ වැඩසටහනක් නමින් රියදුරන් වෙනුවෙන් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙය සාර්ථක කර ගැනීම සඳහා සමාගම, මෝටර් රථ දෙපාර්තමේන්තුව, ගමනාගමන මූලස්ථානය සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වැනි ආයතන වලින් සම්පත් දායකයින් ලබා ගන්නා ලදී. මාර්ග ආරක්ෂාව පිළිබඳ නවීනතම දැනුම, රියදුරු චර්යා ධර්ම සහ සැහැල්ලු වාහන වල සිට බර වාහන දක්වා වාහන 300 ක පමණ පද්ධතියක් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම වැනි කරුණු තුලින් තම දැනුම සන්නද්ධ කර ගැනීමට මෙම වැඩ සටහන තුලින් රියදුරන්ට හැකි විය.



*රියදුරන් පුහුණු කිරීමේ වැඩසටහන අතරතුර*

2012 වර්ෂයේදී ආරම්භ කළ තවත් නවීන වැඩසටහනක් වූයේ ශ්‍රී ලංකන් ගුවන් සේවා ටෝස්ට් මාස්ටර් සමාජය සමග එක්ව විධායකයින් සඳහා පැවැත්වූ කථන කුශලතා වැඩමුළුවයි. වැඩසටහන සැසි වාර 10 කින් සමන්විත වූ අතර අන්තර් ක්‍රියාකාරි සහ දැඩි කැපවීමක් තිබූ මෙම වැඩසටහනට නම් කළ 20 දෙනෙක් සහභාගි වූහ.

## 2012 වර්ෂය තුල කාර්යමණ්ඩල සාමාජිකයින් 1751 ට අවස්ථාව ලබා දීමට අපට හැකි වුනි. කාර්යමණ්ඩල පුහුණුව සහ සංවර්ධනය උදෙසා 2012 වර්ෂය තුලදී කළ මුලු ආයෝජනය රු මිලියන 66 ක් වේ.

කාර්යමණ්ඩලය වෙත දෙනු ලැබූ විදේශ පුහුණුව නව පාඨමාලා හඳුන්වා දීමත් සමග වැඩි විය. මෙහෙයුම් මට්ටමද ඇතුලුව අදාල කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ කුශලතා වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම වැඩමුළු පවත්වන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා ගුවන් තොරතුරු කලාපය තුල අහසෙහි ගුවන්යානා සහ මගීන්ගේ ආරක්ෂාව තහවුරු කරන අතරම ජාත්‍යන්තර ප්‍රමිතීන් පවත්වා ගෙන යනු ලැබින. තවත් අරමුණක් වූයේ මගීන් සහ ගුවන් යානා වෙත ආරක්ෂාව සැපයීමට අමතරව බ.ජා.ගු / ම.රා.ජා.ගු සහ දේශීය ගුවන් තොටුපල වෙත පුළුල් සේවා පහසුකම් සැපයීමයි.

### රේඩාර් පුහුණු කිරීම / තායිලන්තයේදී සියලුම රේඩාර් පාලකයින් හුරු කිරීම

කොළඹ ගුවන් තොරතුරු කලාපය (FIR) හරහා වඩා කාර්යක්ෂම අතරමග / ක්ෂේත්‍ර රේඩාර් පාලන සේවාවක් සහතික කරනු පිණිස ගුවන් සංකරණ සේවා අංශය හා (ANS) බැංකොක් සහ තායිලන්තයේ එරෝතායි ගුවන් ගමන් පාලන (ATC) මෙහෙයුම් මධ්‍යස්ථාන වලදී රේඩාර් පාලනය පිළිබඳ මතකය අලුත් කරන වේගවත් පුහුණු වැඩසටහන් සාර්ථක ලෙස පවත්වන ලදී. කාර්යබහුල ගුවන් තොටුපල වල සහ ගුවන් අවකාශය තුල ගුවන් යානා පාලනයට සහ කළමනාකරණයට භාවිතා කරන නවීනතම ශිල්පීය කුසලතා දැනගැනීමට අපගේ පාලකවරුන් හට මෙම වැඩ සටහන මහෝපකාරී විය.

මෙම ප්‍රයත්නය විසින් අපගේ අනුග්‍රාහකයින්ගේ එනම් ගුවන් සේවාවල සහ මගීන්ගේ සුවිසල් ප්‍රයෝජනයක් වූ ආරක්ෂාව සහ කාර්යක්ෂමතාවය අතින් ගුවන් නාවික සේවා වල සමස්ථ හැකියාව වැඩි දියුණු කරන ලදී.

### සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානයේ (CATC)අභ්‍යන්තරික පුහුණුව

2012 ඔක්තෝබරයේදී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් CATC TRAINAIR තත්වයේසිට TRAINAIR Plus තත්වයට උසස් කිරීම සඳහා තක්සේරුවක් කරන ලදී. මෙය CATC වෙත ලැබුනු වැදගත් අවස්ථාවකි. පුහුණු කළමනාකාරිත්ව

**විදේශ පුහුණුව**

| වාර්තා කිරීමේ මට්ටම | පුහුණු කළ කාර්යමණ්ඩල සමාජිකයින් ගණන | |
|---|---|---|
| | 2012 | 2011 |
| පිළිගැනුම් නිලධාරීන් / මාණ්ඩලික කේඩරය | 20 | 1 |
| කණිෂ්ඨ කළමනාකරණය | 64 | 42 |
| මධ්‍ය කළමනාකරණය / තාක්ෂණික වෘත්තිකයින් | 132 | 77 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට වාර්තාකරන්නන් | 28 | 18 |
| ජ්‍යෙෂ්ඨ නායකත්වය/ජ්‍යෙෂ්ඨ නායකයින් / ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 5 | 4 |
| එකතුව | 249 | 142 |
| | | |

පද්ධතිය සහ අනෙකුත් තීරණාත්මක ක්ෂේත්‍ර නිරීක්ෂණය කිරීම මගින් තම ජාත්‍යන්තර සහායකයින් ගේ තත්වයට සමාන වන අයුරින් දියුණු වීමේ මහඟු අවස්ථාවක් මෙමගින් CATC වෙත ලැබුනි.

ශ්‍රී.ශු.සේ සමාගමේ සේවකයින්ගේ සුනම්‍ය කුසලතා දියුණු කිරීමේ තම උත්සාහය අඛණ්ඩව පවත්වා ගනිමින් CATC පුහුණු පැය 2832 කින් යුක්ත කෙටිකාලීන පුහුණු වැඩසටහන් 25 ක් පවත්වන ලදී. CATC මුලු පුහුණු ප්‍රයත්නය 2012 වර්ෂයට පුහුණු පැය 62,889 ක් විය. සමාගමට අලුතින් බඳවා ගත් සේවකයින් උදෙසා පැය 36,960 ක පුහුණු වැඩසටහන් 6 ක් එහි අන්තර්ගත විය.

පුහුණු කිරීම් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| ක්ෂේත්‍රය | පුහුණු පැය ගණන |
|---|---|
| සුනම්‍ය කුසලතා සංවර්ධනය | 2,832 |
| නව බඳවා ගැනීම් සඳහා පුහුණුව | 36,960 |
| රැකියා සංවර්ධනයට යොමු වූ වැඩසටහන් | 5,994 |
| උපදේශක පුහුණුව | 615 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | 810 |
| මතකය අළුත් කිරීමේ වැඩසටහන් | 4,608 |
| බාහිර පාර්ශව පුහුණු කිරීම් | 11,070 |
| එකතුව | 62,889 |

වර්ෂය තුල CATC ආසන්න වශයෙන් රු 1,879,948 ක ආදායමක් උපයා ඇත. එය විදේශීය කොටස තුල ඇතුලත් වී ඇත.

**කාර්යමණ්ඩල සුභසාධනය**

සමාගම සේවකයින් වෙත සපයන ප්‍රධාන සුභසාධන පහසුකම වනුයේ සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයයි. මුළු සේවක ජනගහණයෙන් 3,020 ක් ප්‍රතිලාභී යෝජනාක්‍රම 4 ක් යටතේ ප්‍රතිලාභ ලැබීමට මෙහි සාමාජිකත්වය ලබා ඇත. 2011 දී ප්‍රතිලාභ වැඩි දියුණු කළ අතර 2012 වර්ෂය තුල රු. මිලියන 106 ක් වටිනා ප්‍රතිලාභ සේවකයින්හට ලැබී ඇත.

සමාගමේ දායකත්වය ඇති මරණාධාර යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය 2012 දෙසැම්බර් 31 දිනට 2,716 ක් විය. මරණයකදී සේවකයින්ට සහ ඔවුන්ගේ ළඟම පවුල් සාමාජිකයන් වෙත ප්‍රතිලාභ ගෙවයි. ප්‍රතිලාභ ලැබීමේ කඩිනම් ක්‍රමයක් පවතින අතර 2012 වසරේ දී මරණ වෙනුවෙන් ගෙවූ මුළු ප්‍රමාණය රු මිලියන 5.3 ක් විය.

ශ්‍රී.ශු.සේ සමාගමේ සේවකයින් විවිධ ප්‍රදේශ වලින් පැමිණෙන අතර ඔවුන්ගේ ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන්ද සමාගම අවධානය යොමු කර ඇත. සේවක ගමනාගමනය පහසු කිරීමේ අරමුණින් සමාගම බජාගු සහ රත්මලාන වෙත මාර්ග 26 ක ගමනාගමන සේවාවක් පවත්වා ගෙන යනු ලැබේ. වර්තමානයේදී මෙම පහසුකම 2,000 කට ආසන්න සේවක සංඛ්‍යාවක් විසින් භුක්ති විඳිනු ලබන අතර ඒ සඳහා දරනුයේ නාමමාත්‍රික පිරිවැයක් පමණි. මෙම සේවාව සැපයීම වෙනුවෙන් සමාගම දැරූ වාර්ෂික පිරිවැය රු.76,047,805 ක් විය.

වර්ෂය තුල වැඩ සම්බන්ධ ප්‍රධාන අනතුරු හෝ සෞඛ්‍යමය ව්‍යසන වාර්තා වී නොමැත. නීතිය මගින්, කම්කරු නීතිය මගින් සහ ගුවන් සේවා නෛතික අංශ විසින් ප්‍රකාශිත ආරක්ෂණ ප්‍රමිතීන් සේවකයින් වෙනුවෙන් අනුගමනය කර ඇත.

**නිවාඩු සංචාරක බංගලා පහසුකම්**

නුවරඑළියේ පිහිටි නිවාඩු බංගලා පහසුකම් නිවාස 5 කින් යුක්ත වන අතර පිදුරුතලාගල කඳු පාමුල පිහිටා ඇත. මෙය පාසැල් නිවාඩු කාලවලදී සහ දිගු නිවාඩු කාලවලදී අප සේවකයින් විසින් පූර්ණ වශයෙන් ප්‍රයෝජනයට ගනී. සම්පූර්ණ නිවාස සංකීර්ණය සහ එහි ඇති නේවාසික පහසුකම් 2011 වර්ෂයේදී වැඩි දියුණු තත්වයට පත් කරන ලදී

2012 වර්ෂයේදී මෙම නිවාඩු බංගලා සමාගමේ සේවකයින් 1049 දෙනෙක් විසින් ප්‍රයෝජනයට ගන්නා ලදී.

පිදුරුතලාගල කඳු පාමුල වූ මෙම නිවාඩු බංගලාවේ උද්‍යානය නුවරඑළිය නගරසභාව විසින් පළමුවරට සංවිධානය කළ April Blooms Garden Show වැඩසටහනේ දී දෙවන ස්ථානය දිනා ගන්නා ලදී. "රාජ්‍ය ආයතනවල මහා පරිමාණ ගෘහ උද්‍යාන" වැඩ සටහන යටතේ මෙය පවත්වන ලදී.



සම්මාන දිනූ නුවරඑළියේ නිවාඩු නිකේතන ගෙවත්ත



සම්මාන දිනූ නුවරඑළියේ නිවාඩු නිකේතන ගෙවත්ත

**සමාගම දැනට බ.ජා.ගු සහ රත්මලාන තොටුපලවල් වෙත මාර්ග 26 කින් ක්‍රියාත්මක වන පරිදි ප්‍රවාහන යෝජනාක්‍රමයක් හඳුන්වා දී ඇත. මෙම පහසුකම 2000 කට ආසන්න සේවක පිරිසක් විසින් භුක්ති විඳිනු ලබන අතර එය නාමික මිලකට සපයනු ලබයි.**

### වෙනත් පුද්ගල උපනයනයන්

පෙර වර්ෂ වල මෙන් ගුවන් තොටුපල ක්‍රියාකාරිකයින්ගේ වගකීම් හා බැඳුනු අවදානම් රක්ෂණය සඳහා රු මිලියන 42 ක සාධාරණ රක්ෂණ වාරිකයක් ලබා ගැනීමට මානව සම්පත් අංශය නායකත්වය ගන්නා ලදී. මෙයට අමතරව 350 කට ආසන්න වාහන පද්ධතිය රක්ෂණය සඳහා රු.මිලියන 7.3 ක වාර්ෂික වාරිකයකට ශ්‍රී ලංකා රක්ෂණ සමාගම සම්බන්ධ කර ගැනීමට ද හැකි විය.



*සම්මාන දිනූ නුවරඑළියේ නිවාඩු නිකේතන ගෙවත්ත*



*සම්මාන දිනූ නුවරඑළියේ නිවාඩු නිකේතන ගෙවත්ත*

කළමනාකාරිත්වය සහ මානව සම්පත් අංශය යහපත් වැඩ පරිසරයක් සඳහා ඇල්ම ඇති කණ්ඩායම් වල පැවැත්ම අවශ්‍යය යන්න විශ්වාස කරන බැවින් සියලුම වෘත්තීය සමිති සමග නිරතුරුව මිත්‍රශීලී සංවාදයක් පවත්වා ගෙන යයි. කළමනාකාරිත්වය සහ මානව සම්පත් අංශය සාමාන්‍ය වෘත්තීය සමිති 26 ක් සමගද දේශපාලනික පදනමක් සහිත වෘත්තීය සමිති 3 ක් සමගද දෙපාර්ශවයේ යෝජනා බෙදා හදා ගනිමින් සේවක දුක් ගැනවිලි විසඳීම සඳහා වාර සාකච්ඡා පවත්වා ඇත. මෙයට අමතරව පොදු යහපත සඳහා බෞද්ධ සංගමය, ක්‍රිස්තියානි සංගමය සහ සේවා වනිතා අංශය වශයෙන් පුණ්‍ය කටයුතු සඳහා වෙන්වුනු ආයතන 3 ක් ඇත.

කාර්යමණ්ඩල සහයෝගිත්වය සහ සෞඛ්‍ය සම්පන්න සේවක පිරිසක් වර්ධනය කිරීම සඳහා ක්‍රීඩා සුහසාධන සහ විනෝද කටයුතු සමාජය වැදගත් භූමිකාවක් ඉටු කරයි. ක්‍රීඩා සුහසාධන සහ විනෝද කටයුතු සමාජයේ මග පෙන්වීමෙන් සංවිධානය කල වාර්ෂික සුහද හමුව අප සමාජ කටයුතු පිළිබඳ කැලැන්ඩරයේ වැදගත් සමාජමය සිද්ධියක් විය.

### ගු.ගු.සේ සමාගමේ කාර්යමණ්ඩලය වෙනුවෙන් සංවිධානය කළ අනෙකුත් සමාජමය ක්‍රියාකාරකම්

ආගමික පූජකතුමන්ලාගේ ආශීර්වාද මධ්‍යයේ වැඩ බලන සභාපති කමල් රත්වත්ත මහතාගේ අනුග්‍රහය ඇතිව ගුගුසේ සමාගමේ



*2012 අළුත් අවුරුද්ද භුක්තිවිඳිමින්*

කාර්යමණ්ඩලය බජාගු තොටුපලේදී 2012 නව වර්ෂය උදාවීම උත්සවාකාරයෙන් සමරන ලදී. බ.ජා.ගුහි ක්‍රියාත්මක වන විවිධ සංවිධාන වලට සම්බන්ධවන දෙපාර්තමේන්තු ප්‍රධානින් සහ නිලධාරීන් මෙම අවස්ථාවට සහභාගි වූහ.




*ගු.ගු.සේ සමාගමේ කාර්ය මණ්ඩලය මඟීන් සමඟ 2012 සිංහල හා දෙමළ අළුත් අවුරුද්ද සමරමින්*



ගූ.ගූ.සේ සමාගමේ කාර්ය මණ්ඩලය මඟීන් සමඟ 2012 සිංහල හා දෙමළ අළුත් අවුරුද්ද සමරමින්

සිංහල දෙමළ අලුත් අවුරුද්ද 2012 අප්‍රේල් 13 දින පූ භා 7.20 ට උදා විය. බජාගුහි සේවක කොටස් සහ මගීන් සුභ මොහොතට අනුව පහන් දල්වමින් පළමු ආහාරය භුක්ති විඳි ආකාරයත් අලුත් අවුරුදු සම්ප්‍රදායන් රැකි ආකාරයත් පහළ පින්තූර මගින් දැක්වේ.

2012 මැයි 11 දින බ.ජා.ගු පර්යන්ත ගොඩනැගිල්ලේ පවත්වන ලද වෙසක් බැති ගී පූජෝපහාරය ගු.ගු.සේ සමාගමේ බෞද්ධ



බෞද්ධ සංගමය විසින් සංවිධානය කරන ලද 2012 වෙසක් භක්ති ගී

සංගමය විසින් සංවිධානය කරන ලදී. ගු.ගු.සේ සමාගමේ සභාපති ප්‍රසන්න වික්‍රමසූරිය, උප සභාපති කමල් රත්වත්ත මහත්වරුන්ද කළාකරුවන් වන දීපිකා ප්‍රියදර්ශනී, ඉෂාක් මොහිදීන් බෙග්, ප්‍රදීපා ධර්මදාස යන මහත්ම මහත්මීන්ද මෙම අවස්ථාවට සහභාගි වන ලදී.




ක්‍රිස්තියානි සංගමය විසින් සංවිධානය කරන ලද 2012 නත්තල් කැරොල් ගායනා

2012 දෙසැම්බර් 20 දින වාර්ෂික ක්‍රිස්තියානි වැඩසටහන සේද මාවතේ දී උත්සවාකාරයෙන් පවත්වන්නට යෙදුනි.

2012 පෙබරවාරි 18 දින විහාරමහා දේවි උද්‍යානයේදී ගු.ගු.සේ සමාගමේ කාර්ය මණ්ඩලයේ විශාල කොටසකගේ සහභාගිත්වයෙන් වාර්ෂික සුහදහමුව උත්සවාකාරයෙන් පවත්වන ලදී. සෞම්‍ය රාත්‍රි නම් සංගීතමය වැඩ සටහන 2012 මැයි 19 වන දින බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී.



ක්‍රීඩා හා සුභසාධක සංගමයේ විසින් සංවිධානය කරන ලද 2012 වාර්ෂික සුහද හමුව



“සෞවය රාත්‍රී” 2012 සංගීතමය වැඩසටහන

**ඉදිරිමඟ**

අනාගතය මානව සම්පත් පිළිබඳ නව අභියෝගයන් අප වෙත ඉදිරිපත් කරයි. තාක්ෂණික සංවර්ධනයන්, ව්‍යාපාර පුළුල්වීම් සහ වියපත් ශ්‍රම බලකාය අප විසින් සැලකිල්ලට ගතයුතු බලවේග වෙයි. අනාගතය සාර්ථක ලෙස භාර ගැනීම පිණිස නායකයන් පුහුණු කිරීම අද දවසේ කාර්යය වේ.





# තිරසාර පැවැත්ම කළමනාකරණය

ඒ කෙසේද යත්;
“තිරසාර පැවැත්ම මනා කළමනාකරණය ඇවැසි වන්නේ මහ පොළව අප විසින් අපගේ මුතුන් මිත්තන්ගෙන් උරුම කර නොගෙන අපගේ දරුවන්ගෙන් ණයට ගත්තක් බැවිනි.”

# තිරසාර පැවැත්ම කළමනාකරණය

පසුගිය වසර කිහිපය තුල ආයතනික තිරසාර පැවැත්ම යන සංකල්පය සැලකිය යුතු පරිනාමයකට පත්වී නවීන ආයතනික සංවර්ධන උපායමාර්ග ඉදිරියෙන් පවතී. මෙම ගම්‍යතාවේ ප්‍රතිඵලයක් ලෙස සේවකයින්ට සහ උනන්දු පාර්ශවයන්ට දිගුකාලීන තිරසාර පැවැත්මක් ප්‍රවර්ධනය කර අවසානයේ වඩා යහපත් විසඳුම් කරා එළඹිය හැකි නිරන්තර ගමනක යෙදෙයි. ගු.ගු.සේ සමාගමේ තිරසාර පැවැත්ම පිළිබඳ සිද්ධාන්තය සරල "හරිත ප්‍රතිපත්තියෙන්" එපිටට විහිදෙයි. මෙහිදී අපි පරිසරයද ආයතනයේම ස්ථිර පාර්ශවකරුවකු ලෙස ලෙස හඳුනා ගනිමු.

## ගුගුසේ සමාගමේ තිරසාර පැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය




කල් පවතින අගයක් ඇති කළ හැක්කේ වඩා පුළුල් ආයතනික දෘෂ්ඨිකෝණයකින් බව අපි විශ්වාස කරමු. ආයතනය වෙත බලපාන සමාජයීය සහ සංස්කෘතික අංගවල වැදගත්කම අප ප්‍රවේශය තුලින් හඳුනා ගැනෙයි. අපගේ මෙහෙයුම් වෙත සැලකිය යුතු බලපෑමක් ඇති කරන ආර්ථික පරිසරය පිළිබඳව අපි දනිමු. ඒ හෙයින් අප සැලසුම් සහ උපායමාර්ග තුලින් මෙම අංගවල ධනාත්මක භාවය එක්රැස් කර ආයතනය සහ සියලු උනන්දු පාර්ශවයන් වෙනුවෙන් කල් පවතින අගයක් ඇති කිරීම සඳහා එය යොමු කෙරෙයි.

**විමෝචන පාලනය**

පරිසර සංරක්ෂණය සඳහා වැඩිපුර පියවරක් ගනිමින් ගුගුසේ සමාගම ඒ සඳහා තම කැපවීම තහවුරු කරයි. ස්වාභාවික පරිසරයට මුදා හරින සියලු ද්‍රව්‍ය නිරන්තරව සමාගම ඇගයීමට ලක් කරයි. ඒ තුලින් විමෝචනය අවම කර හරිතාගාර බලපෑම පාලනය වේ. අපගේ පරිසර ක්‍රියාකාරකම් සියල්ලක්ම ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් අනුමත කර ඇත.

**පවත්නා මළ අපද්‍රව්‍ය පිරිපහදු පිරියතය (STP)**

මළ අපද්‍රව්‍ය පිරිපහදු පිරියතය ආරම්භ කරන ලද්දේ පරිසරයට මුදාහරින අපද්‍රව්‍ය වල විෂද්‍රව්‍ය ප්‍රමාණයන් පාලනය කිරීම සඳහාය. එය ඉදි කරන ලද්දේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මතය. CEA විසින් ලබා දී ඇති මගපෙන්වීම් වලට අනුකූලව මළ අපද්‍රව්‍ය පිරිපහදු පිරියතයෙන් නිකුත් වන පිරිපහදු කළ සියලු අපද්‍රව්‍ය මුදා හැරීමට පෙර දැඩි ලෙස පරීක්ෂණ වලට භාජනය කෙරේ. දෛනිකව අභ්‍යන්තරව කෙරෙන නියැදි පරීක්ෂණ වලට අමතරව සෑම කාර්තුවක් පාසාම කාර්මික තාක්ෂණ ආයතනය (ITI) විසින්ද පරීක්ෂණයට ලක් කෙරේ. මෙම සියලු ප්‍රතිඵල මධ්‍යම පරිසර අධිකාරියේ ගොනු ගත කර තිබේ.

**ඝන අපද්‍රව්‍ය භාණ්ඩකය සහ අපද්‍රව්‍ය කළමනාකරණය**

කාර්මික අපද්‍රව්‍ය කළමනාකරණය මධ්‍යම පරිසර අධිකාරියේ අධීක්ෂණය යටතේ පවතී. ගු.ගු.සේ සමාගමේ අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍රයට (EPL) අනුව ඉදිකරන ලද ඝන අපද්‍රව්‍ය ඉවත්කිරීමේ නවීනතම දවනයකි. CEA නිර්නායක මත එම බලපත්‍රය නිකුත් කිරීමට පෙර දවනයෙන් ඉවත ලන සියලු අපද්‍රව්‍ය ITI ආයතනය විසින් පරීක්ෂා කරන ලදී. බලපත්‍රය අලුත් කරනු ලබන්නේ කාලීනව පවත්වන පද්ධති සමාලෝචනයකින් සහ අඛණ්ඩව පවත්වන නියදි පරීක්ෂණ සාර්ථක වීමෙන් පසුවය. ඉවතලන කඩදාසි, වීදුරු, ප්ලාස්ටික්, වානේ සහ කාබනික ද්‍රව්‍ය මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කරන ලද අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීය කෙරෙන පිටස්තර ආයතනයකට යොමු කෙරේ. සියලු හරිත අපද්‍රව්‍ය කොම්පෝස්ට් පොහොර පිළියෙල කිරීම සඳහා යොදා ගැනෙන අතර අනෙකුත් අපද්‍රව්‍ය සියල්ලක්ම දවා ලනු ලැබේ. දවනය හේතුවෙන් අපද්‍රව්‍ය වල ඇති සියලු රෝග කාරක බැක්ටීරියා සහ වෛරසයන් විනාශ වේ.

**බ.ජා.ගු තොටුපලෙහි පරිසර හිතෛෂී ගුවන් තොටුපල**

බජාගු තොටුපලෙහි දැනට පවතින අපද්‍රව්‍ය එකතු කිරීමේ සහ ඉවතලීමේ ප්‍රවාහය පහතින් දැක්වේ.




ගුවන් යානා කුටිතුලින් ඉවතලන ආහාර අපද්‍රව්‍ය බජාගු තොටුපල භූමියේ පිහිටුවා ඇති ශ්‍රී ලංකන් කේටරින් සමාගම මගින් සත්වාහාර බවට පත් කරනු ලබයි.

**කළමනාකාරීත්ව සැලසුම (EMP)**
ගුගුසේ සමාගමේ EMP සැලසුම සම්පත් භාවිතය උපරිම කිරීම, අපද්‍රව්‍ය මුදා හැරීම, පරිසරය වැඩි දියුණු කිරීම (වාතාශ්‍රය ශබ්දයේ සහ ජලයේ ගුණාත්වය), ස්වාභාවික පරිසරය ආරක්‍ෂා කිරීම සහ EMP වලට අදාල තොරතුරු සහ ක්‍රියාවලිය මහජනයා වෙත හෙළිදරව් කිරීම වැනි ක්‍රියාකාරකම් රැසක් ආවරණය වන පුලුල් අවකාශයක් සංගටනය කරන්නාවූ කළමනාකරණ මෙවලමකි,

අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේද සැලසුම්කර ක්‍රියාත්මක කිරීමට බලයලත් කණ්ඩායම ලෙස 2010 දී බජාගු පාරිසරික කමිටුව පත් කරන ලදී. මෙම කමිටුව සැලසුම් කළ ඉලක්ක සපුරා ගනු පිණිස ගුවන් තොටුපල කළමනාකරණ සැලසුම කාලීනව සමාලෝචනය කිරීම පිළිබඳ වගකීම දරයි. මෙම පරිසර කමිටුවේ මග පෙන්වීම යටතේ ශක්තිමත් වූ සමහර මුලපිරීම් වූයේ සේවකයින්ගේ දැනුවත් කම වැඩි කිරීම පවිත්‍රතා සේවකයින් හට සියලු මෙහෙයුම් කටයුතු සඳහා ජල කළමනාකරණය පිළිබඳ අවබෝධයක් දීම සහ ජල කළමනාකරණය පිළිබඳ 3R (අඩුකිරීම, ප්‍රතිචක්‍රීයකරනය කිරීම, යලි භාවිතය) පරිචයන් ප්‍රවර්ධනය ආදිය වේ.

**වායුගෝලයට බැහැර වන කාබනික ප්‍රමාණය අවම කිරීම**
**බලශක්ති සංරක්‍ෂණය**
ගු.ගු.සේ සමාගමේ බලශක්ති පරිභෝජනයෙන් 74% ක දැවැන්ත ප්‍රතිශතයක් බජාගු මගී පර්යන්ත ගොඩනැගිල්ල විසින් අත්පත් කරගෙන ඇත. බලශක්ති විගණනයක් තුලින් වැඩිම වැයවීම ඇති කේන්ද්‍රස්ථාන හඳුනා ගැනීමත් මිනුම් කිරීමත් සිදු කෙරේ. විගණනයේ අරමුණ වන්නේ බලශක්ති වැයවීම සඳහා විශාල වශයෙන් දායකවන්නන් හඳුනා ගැනීමයි. පරිභෝජනය වන බලශක්ති ප්‍රමාණය වෙත සැලකිය යුතු ලෙස දායක වන්නේ වායු සමීකරණ පද්ධතිය සහ විදුලි ආලෝක පද්ධතිය බව හඳුනා ගෙන ඇත.

බලශක්ති කාර්යක්‍ෂමතා පරිචයන් අනුගමනය කිරීමේ වැදගත්කම පිළිබඳව සේවකයින් දැනුවත් කිරීම සඳහා ගු.ගු.සේ සමාගම ඒකාග්‍ර උත්සාහයක් දරන ලදී. වසර තුලදී නිවා දැමීමේ ප්‍රතිපත්තිය බලශක්ති විගණන වල පරාමිතියක් ලෙස වැඩියෙන් යොදා ගන්නා ලදී.

ගු.ගු.සේ සමාගම විසින් බල ශක්ති කළමනාකරණ පරිචයන් කල් පවතින විසඳුම් රැසක් තුලින් ක්‍රියාත්මක කරන ලදී.

- පවතින ගොඩනැගිලි වල බලශක්ති කාර්යක්‍ෂම විදුලි ආලෝක පද්ධති, ආලෝක පාලන පද්ධති සහ මෝටර් පාලන පද්ධති සවි කරන ලදී. (උදාහරණ - ටී5 ප්ලෝරසන්ට් උපකරණ , C-Bus පාලන පද්ධති, AHUs සහ PAUs සඳහා ධාවක)
- නව ශීතාගාර පද්ධති දැනට පවතින ශිතාගාර සඳහා වූ ගොඩනැගිලි කළමනාකරන පද්ධතිය සමග ඒකාබද්ධ කිරීම
- නවීකරණ ව්‍යාපෘතිවලදී විද්‍යුත් ස්ථායිතා සහ විදුලි බල්බ යොදා ගැනීම
- ගොඩනැගිලි තුල වායු සමීකරණ ඒකක විචල්‍ය වේග මෙහෙයුම් සහ මෘදු ආරම්භක පාලක යොදා උසස්කිරීම
- උණු වතුර පද්ධති සඳහා සූර්යතාපක යොදා ගැනීම
- වහල මත සවිකළ ජනේල මගින් හිරු එළිය ලබා ගනිමින් ස්වාභාවික ආලෝක පරිහරණය උපරිම කිරීම හා විදුලි එළිය අඩුකිරීමේ පාලක යොදා ගැනීම
- මගී පර්යන්ත ගොඩනැගිල්ල තුල චලක සංවේදක සහ නිරතවීම තහවුරු කිරීමේ සංවේදක යොදා ගැනීම

- බලශක්ති සාධකය නිවැරදි කිරීම සංක්‍රමණ හෝටලය තුල යතුරු පුවරු මගින් ක්‍රියාකරන පාලක ස්විචයන් යෙදීම
- ආහාර උණුසුම් කිරීම සඳහා උණුසුම් කිරීමේ උදුන් වෙනුවට සූක්ෂ්ම තරංග උදුන් වලට මාරු වීම සහ එමගින් දිනකට කි වො පැය 4 ක බලශක්ති ඉතිරියක් කර ගැනීම
- කාර්යාල වේලාවලින් පසුව හා සති අන්ත වලදී වායු සමීකරන යන්ත්‍ර වෙනුවට පාදස්තල විදුලි පංකා යොදා ගැනීම

විශාලතම මගී සහ ගුවන් සංචලන සංඛ්‍යාව වාර්තා වීමත් නොසලකා 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වසර තුල විදුලි බිල සුළුවශයෙන් වැඩිවීම තුලින් පැහැදිලි වන්නේ මෙම මුල් පිරීම් විශාල වශයෙන් සාර්ථක වූ බවයි.

**එක් මගියකු සඳහා විදුලි බලශක්ති පරිභෝජනය (2007 සිට 2012 දක්වා)**

| වර්ෂය | කි.වො.පැ / මඟියකුට |
|---|---|
| 2007 | 7.30 |
| 2008 | 7.59 |
| 2009 | 7.78 |
| 2010 | 6.29 |
| 2011 | 5.99 |
| 2012 | 5.27 |

අපගේ සාර්ථකත්වයන් තුලින් අපි විශාල වශයෙන් දිරි ගැන්වී සිටින අතර දැනට ගුවන් පථය සඳහාද ගුවන් තොටුපල තුල බාහිර විදුලි ආලෝකය සඳහාද බලශක්ති සංවර්ධන ක්‍රියාවලිය දිගු කරමින් කාර්යක්ෂම කිරීමට විකල්ප සොයමින් සිටිමු. දැනට පවතින හැලජන් ලාම්පු වෙනුවට ගුවන් පථ ප්‍රවේශ මාර්ගය බලශක්තිය අතින් කාර්යක්ෂම ලෙඩ් (LED) ලාම්පු යොදා ආලෝකමත් කිරීමේ ව්‍යාපෘතිය මේවන විට අත්හදා බැලීමේ අදියරක පවතී.

එක් මඟියකු සඳහා විදුලි බලශක්ති පරිභෝජනය :2007 සිට 2012 දක්වා:




**අපගේ ප්‍රවේශය සංවිධානයට බලපෑ හැකි සමාජමය සහ සංස්කෘතිකමය අංග වල වැදගත් කම හඳුනා ගෙන ඇත.**

**ස්වාභාවික සම්පත් ප්‍රතිජනනයට ආධාර දීම**

ගෝලීයකරණය සහ වගකීමෙන් තොර පරිභෝජනය නිසා ලොව සීමිත ස්වාභාවික සම්පත් මිනිය නොහැකි පීඩනයකට ලක්ව ඇත. ශීඝ්‍රයෙන් පිරිහී යන පාරිභෝගික සමතුලිතතාවය මිනිය නොහැකි වුවද ඉන් ඉස්මතු වන්නේ මෙම පීඩනය නිවාරණය කිරීම සඳහා ප්‍රායෝගික විසඳුම් වල අවශ්‍යතාවයයි. ගු.ගු.සේ සමාගම මෙම අභියෝගය භාර ගෙන ආයතනික අවශ්‍යතාවයන් සඳහා ස්වාභාවික සම්පත් කෙරේ රඳා පැවතීමට සහයක් දීම පිණිස විකල්ප සම්පත් සොයමින් ප්‍රතිජනන ක්‍රියාවලියට සහාය ලබා දෙයි. පවත්නා අර්බුදයේ බැරෑරුම් කාරණා වලට ප්‍රායෝගික විසඳුම් සෙවීමට අපි උත්සාහ දරන්නෙමු.

**ජල සංරක්ෂණය**

අපගේ ජල සංරක්ෂණ සහ කළමනාකරණ වැඩ සටහන එවන් මුල පිරීමකි. බජාගු තොටුපලේ දෛනික අවශ්‍යතාවය වන ඝන මීටර් 2200 ක පානීය ජල ප්‍රමාණයෙන් 50% ක් (ඝන මීටර් 1200 ක් පමණ) ලබා ගන්නේ භූමිය තුලම හාරා ඇති නල ළිං වලිනි. මෙම ජලය පරිභෝජනයට සුදුසු වනසේ අවශ්‍ය ප්‍රමිතීන්ට අනුව සකස් කරනු ලැබේ. අපගේ ජල සංරක්ෂණ ක්‍රියාවලියන් මුල්පිරීම් රැසකින් පෝෂණය වෙයි. මගී පර්යන්ත ගොඩනැගිල්ලේ සංවේදන කරාම භාවිතය, ජල පරිභෝජනය අඩු කිරීම සඳහා ද්විත්ව සිස්ටන් යෙදීම, මගී පර්යන්ත ගොඩනැගිල්ලේ කැසිකිලි සඳහා ඡායා විද්‍යුත් සංවේදන යොදා ගැනීම ඉන් සමහරක් වේ. ජල පාලන ක්‍රම සහ විධි ප්‍රශස්ථ අන්දමින් ක්‍රියා කරන බව තහවුරු කර ගැනීමටත් දුර්වලතා හඳුනා ගැනීමටත් අඛණ්ඩව ඇගයීම් පැවැත්වේ. අවශ්‍යතා අනුව අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු වලට ප්‍රමුඛතාවය දෙනු ලබයි.

**ඉන්ධන ඉතිරි කිරීම**

**ICAO INSPIRE වැඩ කණ්ඩායම් මගින් පරිශිලක රුචි මං ඔස්සේ ගුවන් යානා වලින් කාබන් විමෝචනය අවම කිරීම**

විමෝචන අවම කිරීමේ ඉන්දියන් සාගර උපාය මාර්ග හවුල (INSPIRE) නමින් හැඳින්වෙන ICAO හි ආසියා පැසිපික් සහ අප්‍රිකානු කලාපීය ගුවන් නාවික සේවා වෘත්තිකයින්ගෙන් සැදුම් ලත් වෘත්තික කණ්ඩායමක් හරිත ගෝලීය සංකල්පය යටතේ ගුවන් ගත වූ යානා මගින් කාබන් විමෝචනය වීම අවම කිරීම සඳහා ව්‍යතිරේකී මාර්ග සංවර්ධනය කිරීමේ උතුම් කටයුත්තක නිරත වී ඇත. මෙම වැඩ කණ්ඩායමේ ආරම්භයේ සිට ගු.ගු.සේ සමාග මෙහි ගුවන් නාවික සේවා අංශය එහි සුවිසල් ප්‍රගාමී භූමිකාවක් නිරූපනය කරන ලදී.

මෙම සංකල්පය පියාසර ගුවන් යානා වලට අඛණ්ඩ ඉහළ නැංවීම් සහ ගොඩබැසීම් ආකෘති සහ අඩු දූෂණ සහිත ගුවන් යානාමය වායු ගෝලයක් ඇති වන ගුවන් අවකාශ සහතික කරන සීමාවෙන් පිට විසඳුම් පෙලක් සපයයි. එමගින් ගුවන් යානා පියාසර කාලය අඩුකරන අතර ගුවන් සේවා ආදායමද වැඩි කරයි.

මෙම ප්‍රයත්නයේදී ශ්‍රී ලංකාවේ සම්බන්ධය ජාත්‍යන්තර UPR ගුවන් අවකාශය මැද පිහිටා ඇති බව පහත දැක්වෙන පින්තූර මගින් පැහැදිලි වේ.

2012 වර්ෂය තුල INSPIRE වැඩ කණ්ඩායමේ ක්‍රියාකාරී සහකරුවෙක් ලෙස ගුවන් යානා කාබනික විමෝචනය අඩුකිරීම සඳහා ANS අංශය දැක්වූ සුවිශේෂී දායකත්වය හේතුවෙන් 2013 මුල් භාගයේදී ගෝලීය විශිෂ්ඨතා සම්මානය ලබා ගන්නා ලදී.




ASIOACG/7 INSPIRE/3WP/10




UPR trajectories for South Asia – South Africa




2013 ගුවන් ගමන් පාලන ගෝලීය විශිෂ්ඨතා සම්මානය

**මානව තිරසාර පැවැත්ම කෙරේ වූ බාධක ඉවත් කිරීම**

**2012 දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය - අනුරාධපුර - ඔයාමඩුව**

2012 වර්ෂයේදී සමරනු ලැබූ 64 වන නිදහස් සමරු උළෙලට සමගාමීව ගු.ගු.සේ සමාගම අනුරාධපුර ඔයාමඩුවේ දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ ප්‍රදර්ශන කුටියක් පවත්වන ලදී. රටෙහි සමාජ ආර්ථික ධාවක වලින් ප්‍රදර්ශනය සමන්විත වූ අතර විශාල සංඛ්‍යාවක් එයට සහභාගි විය. ගුගුසේ සමාගමේ ප්‍රදර්ශන කුටිය මගින් බ.ජා.ගු සහ ඉදිවෙමින් පැවති මත්තල හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපලේ මෙහෙයුම් කටයුතු ප්‍රදර්ශනය කරන ලදී. සහභාගි වූ කණ්ඩායම් අතර පාසැල් සිසුන් විශාල ප්‍රමාණයක් වූ අතර ඔවුන් ගුගුසේ සමාගමේ ප්‍රදර්ශන කුටියේදී ශ්‍රී ලංකා ගුවන් ප්‍රවාහන කටයුතු සහ එයින් ලැබෙන ආර්ථිකමය ප්‍රතිලාභ පිළිබඳව අවබෝධයක් ලබා ගන්නට ඇත. ගු.ගු.සේ සමාගම විසින් සංවිධානය කොට තිබූ තෑගි සහ සිහිවටන උනන්දුවෙන් පැන විමසූ සහභාගිවන්නන් හට බෙදා දෙන ලදී.

**වැසීයාමේ තර්ජනයකට මුහුණ පා සිටි පාසැලකට හදිසි වාසනාව පෑදේ**

දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව අනුරාධපුරයේ අධිරානිගම විද්‍යාලය රු මිලියන 1.5 ක වියදමෙන් අලුත්වැඩියා කරන ලදී. පාසැලේ සිසුන් ප්‍රමාණය 80 ක් පමණ වූ අතර පිරිසිදු නොකිරීම සුව පහසු මද කම සිසුන්ට සෞඛ්‍යසම්පන්න වටපිටාවක් නොතිබීම හේතුවෙන් මෙම විද්‍යාලය වැසී යාමට ආසන්නව තිබුනි. අත්හැර දමා තිබූ ගොඩනැගිල්ලක වහලය අලුත්වැඩියා කරමින් සහ අලුතෙන් සකස් කරමින්, ගුරු නිවාසය (ගැමියන් විසින් පොහොර ගබඩාවක් ලෙස පාවිච්චි කොට ඇත) අලුත්වැඩියා කරමින් පාසැල සම්පූර්ණයෙන්ම යථා තත්වයට පත් කරන ලදී. එසේම ජල සැපයුම් පද්ධතිය, වගා ළිඳ, පානීය ජල ළිඳ, වැසිකිළි සහ පාසැල වටා තිබූ වැට ආදිය යළි සකස් කරන ලදී. එමෙන්ම අඩුවක්ව පැවති මහජන ඇමතුම් පද්ධතියද සම්පූර්ණ කරන ලදී. මෙම පාසැලෙහි සිසුන්ට සහ ගුරු භවතුන්ට වඩා හොඳ පරිසරයක් ගොඩ නැගීම සඳහා ගුගුසේ සමාගමේ කාර්යමණ්ඩලය මෙම කාලය තුල වෙහෙස නොබලා කටයුතු කරන ලදී.

## සමාගම ස්වාභාවික පරිසරය වෙත මුදා හරින සියලුම ද්‍රව්‍ය අඛණ්ඩව අගයයි. එමගින් විමෝචනය අවම කිරීමත් හරිතාගාර බලපෑම පාලනය කිරීමත් සිදු කරයි.

ව්‍යාපෘතිය ආරම්භයේ පාසැලට නොපැමිණීමේ අනුපාතය 56% ක්ව තිබූ අතර අලුත්වැඩියා කටයුතු අවසන් වීමත් සමග එය 25% දක්වා සීඝ්‍ර ලෙස පහත වැටුනි.

**දැයට කිරුළ යටතේ සංවර්ධනය වූ පාසැල් සඳහා තවදුරටත් ආධාර**

2012 වසරේදී දැයට කිරුළ යටතේ සංවර්ධනය වූ නාච්චදූව අලුත්වැව කුමාර විද්‍යාලයට ලී බඩු පරිත්‍යාග කරන ලදී. රු.120,000/- ක පිරිවැයකින් යුතුව පරිත්‍යාග කළ ලී බඩු අතර පුස්තකාල කබඩ් 3 ක්, පුස්තකාල මේස තුනක් සහ පුටු 6 ක් විය.

**හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසැල් 32 ක් අතර පැවැත්වූ "සිත්තරා" චිත්‍ර තරඟය**

2012 අගෝස්තු 3 වන දින ගුගුසේ සමාගමේ අලෙවිකරන අංශය විසින් හම්බන්තොට, සූරිය වැව, ලුණුගම්වෙහෙර සහ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල තෝරාගත් පාසැල් 32 ක් අතර 'සිත්තරා' නමින් වූ චිත්‍ර ප්‍රදර්ශනයක් පවත්වන ලදී. එය ලුණුගම්වෙහෙර මහා විද්‍යාලයේදී පැවැත්වූ අතර සිවිල් ගුවන් සේවා සහ එමගින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව පුළුල් දැනුමක් චිත්‍ර මගින් සිසුන්ට ලබා දීම මෙහි අරමුණ විය.

ජ්‍යෙෂ්ඨ සහ කණිෂ්ඨ ලෙස අංශ දෙකක් සඳහා සිසුන් 80 දෙනෙක් තරඟයට සහභාගි වූහ. අංශ දෙකෙන්ම 1, 2, 3 ලෙස ජයග්‍රාහකයින් 6 දෙනෙකු තෝරා ගන්නා ලදී. මෙම වැඩසටහනට ලංකා බැංකුව අනුග්‍රහය දැක්වූ අතර පළවන, දෙවන සහ තුන්වන ජයග්‍රාහකයින්හට පිළිවෙලින් රු.50,000/-, 35,000/-, 25,000/- ලෙස මූලික තැන්පතුවක් සහිත රන් කැකුළු ළමා ඉතුරුම් ගිනුම් ප්‍රදානය කරන ලදී. එසේම සහභාගි වූ සියලු දෙනට වටිනා තෑගි පිරිනමන ලදී.



*2012 දැයට කිරුළෙන් පාසැල් සංවර්ධන කටයුතු*

**ආගමික කටයුතු**

බෞද්ධාගම ස්ථාපිත වීමත් සමග ශ්‍රී ලංකාවේ බහුතරයක පිළිගැනීම මත ඇති වූ බුද්ධ සාශනය ආරක්ෂා කිරීමේ මිනුමක් ලෙස රාමඤ්ඤ මහා නිකායේ 68 වන උපසම්පදා උත්සවය වෙනුවෙන් රු.500,000/- ක පරිත්‍යාගයක් කරන ලදී. මෙය සාම්ප්‍රදායිකව වසර දෙකකට වරක් පැවැත්වෙන අතර අප විසින් කරනු ලැබූ පරිත්‍යාගය අඛණ්ඩව තුන්වන වරට කළ එකකි. 2012 ජූනි මාසයේදී පවත්වනු ලැබූ මෙම උත්සවයේදී බෞද්ධ හිමිවරු 400 නමක් පැවිදි බිමට පත් විය.

බුදුන් වහන්සේගේ පූජනීය සර්වඥ ධාතු 2012 සැප්තැම්බර් 12 වන දින ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගමට අයත් විශේෂිත ගුවන් යානයකින් ඉන්දියාවට වැඩම කරවන ලදී. ගු.ගු.සේ සමාගම ධාතු වන්දනාවට පැමිණි භික්ෂූන් 500 නමකට සහ මෙහෙණින් වහන්සේලා 50 නමකට දානය සූදානම් කරන ලදී. මහජනයා ධාතු වන්දනා කළ මුළු කාලය තුල මෙම භික්ෂූන් වහන්සේලා සහ මෙහෙණින් වහන්සේලා පිරිත් සජ්ජායනා කරන ලදී.




*ගු.ගු.සේ. සමාගමේ සභාපතිතුමා සභාව අමතමින්*



*සිත්තරා සිතුවම් තරඟයේ ජයග්‍රාහකයින් සමග ගු.ගු.සේ. සමාගමේ සභාපතිතුමා*

**සංස්කෘතික වැඩසටහන්**

ශ්‍රී ලංකාවේ දීර්ඝ ඉතිහාසය එහි සංස්කෘතිය සමග සැමවිටම බැඳී පවතී. රට වෙතට සංචාරකයින් ආකර්ෂණය කිරීමට මෙම අංග දැඩි ලෙස ක්‍රියාකරයි. අපගේ සංස්කෘතික වැඩ සටහන් ශ්‍රී ලංකාවේ සැබෑ වටිනාකම් සහ චාරිත්‍ර ඉස්මතු කිරීමට උත්සාහ කරයි. වසර තුලදී රටපුරා පැවැත්වෙන සැලකිය යුතු සංස්කෘතික උත්සව රාශියකට දායක වීමට ගු.ගු.සේ සමාගම උත්සාහ දරා ඇත. ශ්‍රී දළදා මාලිගාවේ ඇසළ පෙරහැර, කෝට්ටේ රජමහා විහාරයේ වාර්ෂික දළඳා පෙරහැර, හන්දෙස්ස ලංකාතිලක ශ්‍රී විෂ්ණු දේවාලයේ ඇසළ පෙරහැර 2012, කැළණි දුරුතු උත්සවය, ඇසල උත්සවය සුරිඳුනි කතරගම - 2012, බුද්ධ රශ්මි ජාතික වෙසක් උත්සවය 2012, තිස්සමහාරාමය රුහුණු පොසොන් මහ පෙරහැර 2012, ඇසළ මහා පුජෝත්සවය සිත්තම් ගල්ලෙන රජමහ විහාරය වලස්මුල්ල, හම්බන්තොට ආදී උත්සව සඳහා සමාගම දායකත්වය සපයා ඇත. රු.3,970,000/- ක මුදලක් මෙම උත්සව සඳහා සමාගම වැය කොට තිබේ.



බුදුන්වහන්සේගේ පුජනීය ධාතුන් පිළිගැනීමේ කටයුතු කරමින්



පන්සියයක් භික්ෂූන්වහන්සේලාට දන් පිළිගැන්වීම

**අපගේ මාතෘ භූමිය සුරැකීම සඳහා සටන් වැදුනු හමුදා භටයන් ගු.ගු.සේ සමාගම විසින් පිළිගනියි.**

දශක තුනක යුද්ධයෙන් පසු රටට සාමය ළඟා කරදුන් විරුවන්ට ගෞරව කිරීමේ වැඩසටහන්වලට අපි දායක වූයෙමු. පසුගිය වසර කිහිපය තුල ඔවුන්ගේ පැවැත්මේ අරමුණු සහ තම සාමාජිකයින් වෙත ප්‍රතිලාභ බෙදාහැරීම විශ්ලේෂණය කළ ගුගුසේ සමාගම ආයතන කිහිපයක් තෝරා ගෙන ඇත.

ගජබා රෙජිමේන්තුවේ විශ්‍රාමික භට සංසදය සහ ආරක්ෂක අමාත්‍යාංශයේ සේවා වනිතා ඒකකය එවැනි ආයතන දෙකකි. ගජබා රෙජිමේන්තුවේ විශ්‍රාමික භට සංසදය සංවිධානය කළ 11 වන සාංවත්සරික සමුළුවට සමාගම අනුග්‍රහය දක්වමින් රු.250,000/- ක මුදලක් පරිත්‍යාග කරන ලදී. එම සංසදයේ අරමුණ ප්‍රධාන වශයෙන්ම වෛද්‍ය හේතු මත නියම කාලයට පෙර විශ්‍රාම ගිය එනිසාම විශ්‍රාමික වැටුප අහිමි 50% කට වැඩි විශ්‍රාමික හෝ ආබාධිත තත්වයට පත් තම සාමාජිකයින්ගේ මානසික සුවය සංවර්ධනය කිරීම කෙරේ යොමු වී ඇත. එමනිසා මෙම ආයතනය තම සාමාජිකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව 30 කට වඩා ප්‍රදානය කිරීම සහ තම සගයන් සඳහා රු.මිලියන 1.18 ක කෘත්‍රිම අවයව ලබා ගැනීම ආදී කාර්යයන් ගණනාවක් වෙනුවෙන් පියවර ගෙන ඇත.

අපි රු.500,000/- ක පරිත්‍යාගයක් කරමින් ආරක්ෂක අමාත්‍යාංශයේ සේවා වනිතා ඒකකය සංවිධානය කළ "විරු දන ගී සර" නම් වූ රණවිරු සුභසාධන ව්‍යාපෘතියට අනුග්‍රහය දැක්වූයෙමු. 2009 වර්ෂයේ සිට මෙම වැඩ සටහනට අපි දායක වූයෙමු. ඒ අනුව අපි එහි රිදී අනුග්‍රාහකයා බවටද පත් වීමු. මෙම ප්‍රසංගයෙහි අරමුණ වූයේ යුද විරුවන්ගේ නිවාස, වෛද්‍යාධාර සහ ශිෂ්‍යත්ව ආදී සුභ සාධන ව්‍යාපෘති සඳහා අරමුදල් වර්ධනය කිරීමයි.

හමුදාභටයින් ස්වයං රැකියා සඳහා දිරිගැන්වීමට සහ ශ්‍රී ලංකා යුද හමුදාවට ගුණාත්මක නිලඇඳුම් නිෂ්පාදනය කිරීමට වෘත්තීය පුහුණු ආයතනයක් ලෙස පිහිටවූ ශ්‍රී ලංකා යුදහමුදාවේ පුනරුත්ථාපන ව්‍යාපෘතියක් වන රණවිරු ඇපරල්ස් ආයතනය සඳහාද අපි රු.50,000/- ක් පරිත්‍යාග කළෙමු.

# යහ පාලනය

"යහපාලනය සහ නායකත්වය යනු සාර්ථක සංවිධානයන්හි සියළු යහපත් කාන්තා සහ පුරුෂාර්ථ මූලධර්මයෝ වෙති. යහපාලනය නොමැතිව නායකත්වය පමණක් ඔබට ඇත්නම් ඔබ හිතුවක්කාරී, වංචාකාරී සහ බලහත්කාරී වෙයි. නායකත්වය නොමැතිව යහපාලනය පමණක් ඔබට ඇත්නම් ඔබ වැහැරුනු නිලධාරීවාදයට යටවුනු උදාසීන පුද්ගලයෙක් වෙයි."





# යහ පාලනය

ආයතනයේ තරඟකාරිත්වයට වර්ධනයට තිරසාර පැවැත්මට පදනම් වන මූලධර්මය යහපත් යහ පාලනය ලෙස දකිමු. "සමාගම මෙහෙයවන සහ පාලනය කරන පද්ධතිය" යහපාලනය ලෙස නිර්වචනය වී ඇත. උනන්දු පාර්ශවයන් අතර රුචි අරුචි කම් වල ගැටුම් අවම කිරීම, වගකිවයුතුබව සහ ආර්ථික කාර්යක්ෂමතාවය ඒ තුල අඩංගු වෙයි.

රාජ්‍ය වාණිජ ආයතන කාණ්ඩ යටතේ මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මග පෙන්වීම් සමාගම විසින් අනුගමනය කරනු ලබයි.

| වගන්තිය | අදාල නීතිය | අනුකූලවීම |
|---|---|---|
| **අධ්‍යක්ෂ මණ්ඩලය** | | |
| 3.2 | මණ්ඩල සංයුතිය | සාංගමික ව්‍යවස්ථාවලියේ 71 වගන්තිය සඳහන් පරිදි සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලැබේ.<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය 9 දෙනෙකුගෙන් සමන්විත වන අතර තිදෙනෙක් විධායක අධ්‍යක්ෂවරුන්ද ඉතිරිය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ද වේ. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු පත්කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයෙනි.<br><br>අධ්‍යක්ෂවරුන්ගේ පවුලෙහි සාමාජිකයින් කිසිවෙක් අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සේවය නොකරන නිසා ඔවුන්ගේ රාජකාරී කටයුතු ඉටුකිරීමේදී ස්වාධීනත්වයට බලපෑමක් ඇති නොවේ. |
| 3.3, 3.5 සහ 3.6 | අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් | ධාරිතා දෙකක් යටතේ ප්‍රකාශිතය<br><br>නායකත්ව භූමිකාව තුල<br>• ආයතනික මෙහෙවර සහ එය කොටස් කරුවන්ගේ සහ උනන්දු පාර්ශවයන්ගේ අවශ්‍යතා වලට කොතරම් දුරට සේවය කරන්නේද යන්න තීරණය කිරීම<br>• සියලුම නෛතික සහ ව්‍යවස්ථාමය අවශ්‍යතාවයන් සපුරාලන බවට වගබලා ගැනීම සහ සංස්ථාපිත පණත සාංගමික සංස්ථාපත්‍රය සහ ව්‍යවස්ථාවලියට අනුකූලව මෙහෙයුම් කටයුතු කෙරෙන බව සහතික කිරීම<br>• කළමනාකාරිත්වය විසින් ක්‍රියාත්මක කරනු ලැබීමට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම<br>• මහජන ප්‍රතිපත්ති අභිප්‍රායන් කලින් කලට සමාලෝචනය කිරීම හා අනාගත වර්ධනය උදෙසා දීර්ඝ කාලීන ඉලක්ක සහ අභිප්‍රායන් සැකසීමට උපාය මාර්ගික මගපෙන්වීමක් ලබා දීම(ශු.ගු.සේ සමාගමේ අධ්‍යක්ෂවරු බාහිර පරිසරය විශ්ලේෂණය කිරීමට සහ බාහිර සහක්‍රියා හඳුනා ගැනීමට සංවිධානය කළ බුද්ධි කලම්බන වැඩසටහන් තුලින් උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලියට සම්බන්ධ වේ).<br>• බාධාරහිත මෙහෙයුම් ප්‍රවාහයක් සහතික කර ගනු පිණිස අරමුණු සහ ඉලක්ක සැපිරීමට අවශ්‍ය මූල්‍ය අවශ්‍යතා ලබා ගැනීම තීරණය කිරීම<br>• ප්‍රමාණවත් ගිණුම් පොත් සහ වාර්තා පවත්වා ගනිමින් වගකිවයුතුබව සහතික කිරීම<br><br>අධීක්ෂණ භූමිකාව තුල<br>• අධ්‍යක්ෂමණ්ඩල ප්‍රතිපත්ති ඒවා සකස් කළ ආකාරයටම ක්‍රියාත්මක කිරීම සහ ආයතනයේ සහ මුළු මහත් සමාජයේම යහපත සඳහා ඒවා ක්‍රියාත්මක කිරීම සහතික කිරීම<br>• කළමනාකරණ තොරතුරු වාර්තා කාර්යසාධන ඇගයීම් මගින් කළමනාකාරිත්වයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම<br>• අරමුණු අත්පත් කර ගත් බව සහතික කරනු පිණිස අපේක්ෂිත අරමුණු වලින් බැහැර වූ අවස්ථාවලදී ඒවා නිවැරදි කිරීමට නොපමාව පිළියම් යෙදීම<br>• කළමනාකරුවන් ලෙස දක්ෂ පුද්ගලයින් බඳවා ගැනීම, ඔවුන්හට විධිමත් ලෙස බලය පැවරීම, සහතික කිරීම, ස්වාධීනව කටයුතු කරගෙන යාමටහැකි වාතාවරණය සලස්වමින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අතර කණ්ඩායම් හැඟීම සහතික කිරීම<br>• වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන් වෙත වාර්තා කිරීම සහ පොදු ව්‍යාපාර කාරක සභාවේ රැස්වීම් වලට සහභාගී වීම |

| වගන්තිය | අදාල නීතිය | අනුකූලවීම |
|---|---|---|
| 4.1 සහ 4.2 | අධ්‍යක්ෂවරුන්ගේ තීරණ ගැනීම | ඉහළම තීරණ ගන්නා යාන්ත්‍රණය ලෙස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් උපායමාර්ගික තීරණ ගැනීමේ වැදගත් වේදිකාවක් ලෙසින් සේවය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරව සාකච්ඡා කරන අතර සාමූහික තීරණ ගනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 68 පිටුවේ වගුවෙන් දක්වා ඇත. |
| 3.7.1 | සභාපති /ප්‍රධාන විධායක නිලධාරී | සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි. උප සභාපති ලෙස පත්වීමේ සිට වර්තමාන සභාපති වර්ෂ පහකට ආසන්න කාලයක් අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සේවය කර ඇති අතර ගතික මෙන්ම වෘත්තීයමය විලාශයෙන් නායකත්වය සපයමින් සහ උපාය මාර්ගික මෙහෙයවීම් කරමින් විධායක කාර්යභාරයක් ඉටු කරයි. |
| 3.8 | සමාගම් ලේකම් | බාහිර සහ අභ්‍යන්තර තොරතුරු සමාගම් ලේකම් වෙත ලබා දීමට සහ එම තොරතුරු වෙත පිවිසීමට අධ්‍යක්ෂවරු වෙත හිමිකම් ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාපටිපාටීන් අනුගමනය කළ බවට සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සම්බන්ධ නෛතිකමය අවශ්‍යතා සඳහා මග පෙන්වූ බවට සමාගම් ලේකම් සහතික විය යුතුය.<br><br>මෙයට අමතරව සමාගම් ලේකම් නිසි තීරණ ගැනීමට හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දැන්වීම් වාර්තා මාණ්ඩලික පත්‍රිකා සහ අනෙකුත් අදාල ලියවිලි අධ්‍යක්ෂවරුන් වෙත ලබා දිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත ක්‍රියාත්මක වූ ආකාරය සොයා බැලීමද සමාගම් ලේකම් කළ යුතුය. |
| **වගවියයුතුබව** | | |
| 2.2 | රජයට වගවියයුතු බව | අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කොටස්කරු වශයෙන් රජයට කෙළින්ම වගකිව යුතු අතර ඒ සඳහා පහත සඳහන් අධිකාරීන් වෙත වාර්තා කළ යුතුය. ප්‍රධාන උනන්දු පාර්ශවය ලෙස රජයට වගකිව යුතුබව යන ශීර්ෂය යටතේ 69 පිටුවේ විස්තර දක්වා තිබේ.<br><br>• පාර්ලිමේන්තුවට<br>• කැබිනට් ඇමති වරුන්ට<br>• අදාල අමාත්‍යවරයාට/අමාත්‍යාංශයට<br>• විගණකාධිපතිට |
| 6.3 | මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම | සමාගම සම්බන්ධයෙන් පවත්වා ගනු ලබන ඒකාබද්ධ ගිණුම්, රඳවා ගත් ඉපයුම් අරමුදල්, වැය අරමුදල් ගිණුම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ 2007 අංක 7 දරන සමාගම් පණතට අනුකූලව පිළියෙල කර ඇති බවට අධ්‍යක්ෂවරුන් සහතික වෙයි. 18 වන පිටුවේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ අදාල ප්‍රකාශනය දක්වා ඇත. |
| **පාලන පද්ධති සහ කමිටු** | | |
| 7.1 | පාලන යාන්ත්‍රණ | විගණන සහ කළමනාකරණ කමිටුව සමාගමට අදාල හොඳම පරිචයන්ට අනුකූලවූ අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය පිළිබඳ ස්ථාවර පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දෙයි. එසේම අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණාත්මක බව සහ කාර්යක්ෂම බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාලීනව සමාලෝචනය කරනු ලබයි. |
| 7.4.1 | විගණන කමිටුව | කරුණාකර මෙහි යට දැක්වෙන විගණන සහ මූල්‍ය කමිටුව යටතේ එන විස්තර බලන්න |
| 7.4.3 | ටෙන්ඩර් මණ්ඩලය | භාණ්ඩ හා සේවා සැපයීමේදී රජයේ ටෙන්ඩර් ක්‍රියාපටිපාටියෙහි මඟපෙන්වීම් වලට අනුකූලවීම. මෙය ගනුදෙනු වල විනිවිදභාවය පවත්වා ගන්නා අතරම සැපයුම් සම්බන්ධ වඩා හොඳ පරිචයන් ලබා දෙයි. විවිධ සැපයුම් කමිටු වල අධිකාරී සීමා පහත සඳහන් පරිදි වේ.<br>රු.මිලියන 1 සිට රු.මිලියන 5 දක්වා ටෙන්ඩර් මණ්ඩල 2<br>රු.මිලියන 5 සිට රු.මිලියන 50 දක්වා ටෙන්ඩර් මණ්ඩල 1<br>රු.මිලියන 50 සිට රු.මිලියන 100 දක්වා අමාත්‍යාංශය මගින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව<br>රු.මිලියන 100 වැඩි කැබිනට් මණ්ඩලය මගින් පත් කරනු ලැබූ ප්‍රසම්පාදන කමිටුව<br>(රු.100,000/- ට අඩු වියදම් අංශ ප්‍රධානීන් විසින්ද රු.100,000 සිට රු මිලියන 1 දක්වා වියදම් සභාපතිතුමා විසින් අනුමත කරනු ලබයි.) |
| 7.4.4 | පුහුණුකිරීමේ කමිටුව | සභාපතිතුමා මූලාසනය දරන ශ්‍රී.ගු.සේ සමාගමේ පුහුණු කිරීමේ කමිටුව මානව සම්පත් ප්‍රධානී, මූල්‍ය ප්‍රධානී සහ විධායක අධ්‍යක්ෂවරයාගෙන් සමන්විත වේ. මෙම හතර දෙනාගෙන් යුත් කමිටුව සමාගමේ පුහුණු අවශ්‍යතා ඇගයීමට ලක් කරන අතර දේශීය සහ විදේශීය වෙනස් වීම් වලට අනුව මානව සම්පත් පවත්වා ගැනීමට හැකි වන පරිදි දේශීය සහ විදේශීය පුද්ගලයින් තෝරා ගැනීමේ වැඩ පිළිවෙලවල් සකස් කරයි. තම කාර්යය කිරීමේදී කමිටුව අංශ ප්‍රධානීන්ගේ අදහස් සහ නිර්දේශ ලබා ගන්නා අතර නීති සහ ක්‍රියාපටිපාටි ආශ්‍රිතව දැනට ව්‍යාප්තව පවතින දැනුම් යාන්ත්‍රණයද වැඩි දියුණු කරයි. |

| වගන්තිය | අදාල නීතිය | අනුකූලවීම |
|---|---|---|
| **උනන්දු පාර්ශව සමග සම්බන්ධතාවය** | | |
| | ආයතන සහ ව්‍යවස්ථාපිත මණ්ඩල | සමාගම ප්‍රධාන පාර්ශවය වූ රජයද ඇතුලුව සියලු නීත්‍යානුකූල උනන්දු පාර්ශව වෙත තම නෛතික සහ අනෙකුත් බැඳීම් හඳුනා ගෙන ඇත. එසේම ගුවන් සේවා සමාගම මගින් සහ ගුවන් තොටුපල ව්‍යාපාර පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාරික ප්‍රජාව ලෙස ගැනෙන ගුවන් තොටුපල පරිශීලනය කරන්නන් වන අනෙකුත් උනන්දු පාර්ශවයන්ද, සැපයුම්කරුවන්, සේවා සපයන්නන් මෙන්ම සමස්ථයක් වූ සමාජය වෙතද ඇති බැඳීම හඳුනා ගෙන ඇත. |
| | සේවකයින් | සංවිධානයේ දැක්ම, වටිනාකම් සහ සංයුක්ත අරමුණු සියලුම සේවකයින් වෙත සන්නිවේදනය කර ඇත, සමාගමේ ඉලක්ක වලට අනුරූප වීම තහවුරු වන පරිදි සුදුසු මට්ටමට ආංශික සහ පුද්ගල අරමුණුද එකින් එකට සන්නිවේදනය කර ඇත. ආයතන මෙහෙයුම් සහ මූල්‍යමය කාර්යසාධනයන් පිළිබඳ සත්‍ය තත්වය සේවකයින්හට දැනුවත් කර ඇත. ආරක්ෂිත වැඩ පරිසරයක් සමග සුභසාධන ප්‍රතිලාභ සහිත තරඟකාරී පාරිශ්‍රමික පැකේජයක් සියලුම සේවකයින්ට ලබා දී ඇත. ආචාර ධර්ම සංග්‍රහයක් සියලුම සේවකයින්හට ලබාදී ඇති අතර විෂමාචාර ක්‍රියා සම්බන්ධව දඬුවම් හෝ දඩ ඇතුලත් චක්‍රලේඛයක්ද නිකුත් කර ඇත. |
| | පරිසරය | පරිසරයේ තිරසාර පැවැත්ම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළින්ම කැප වී ඇත.ඒ අනුව පරිසර හිතකාමී පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රමිතීන්ට අනුකූලවන බව සහ ඒවා පිළිපදින බව සහතික කරයි. සමාගම විසින් යොදා ගනු ලබන පරිචයන් තිරසාර පැවැත්ම කළමනාකරණය යටතේ විස්තර කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ තිරසාර පැවැත්ම පිළිබඳ ප්‍රතිපත්ති සමග අපගේ සැලසුම් උනන්දු පාර්ශවයන්ගේ අගය වැඩි දියුණු කිරීම සඳහා එම හඳුනාගත් අංග දෙසට මෙහෙයවා ඇත. |

**අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීම**

| අධ්‍යක්ෂවරු | රැස්වීම්වලට පැමිණීම | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | එකතුව |
| ප්‍රසන්න ජේ වික්‍රමසූරිය මහතා | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 8 |
| කමල් රත්වත්ත මහතා | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 8 |
| යොහාන් ජයරත්න මහතා | 1 | - | 1 | - | 1 | 1 | 1 | 1 | 6 |
| කෝසල වික්‍රමනායක මහතා | 1 | - | - | 1 | 1 | 1 | 1 | 1 | 6 |
| ආනන්ද ගුණතිලක මහතා | 1 | 1 | 1 | 1 | 1 | - | 1 | 1 | 7 |
| යෝගා පෙරේරා මහතා | 1 | 1 | - | 1 | 1 | 1 | 1 | 1 | 7 |
| ශානිකා ගොපල්ලව මෙනවිය | 1 | - | 1 | 1 | 1 | 1 | - | 1 | 6 |
| ආචාර්ය ඩී එස් ජයවීර මහතා | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | - | 7 |
| ජේ.ආර්.යූ ද සිල්වා මහතා | 1 | - | - | 1 | - | 1 | 1 | 1 | 5 |

**විගණන සහ කළමනාකරන කමිටුව(AMC)**

භාණ්ඩාගාර චක්‍රලේඛ PF/PE 3 - 19 /11 /1999 අනුව යමින් පිහිටවූ විගණන සහ කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සිය සහය ලබා දෙයි. මෙම කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන්ද ගුවන් සේවා අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීගෙන්ද අභ්‍යන්තර විගණන සහ තත්ව සහතික කිරීමේ ප්‍රධානි ගෙන්ද සමන්විත වේ. සියලුම සාමාජිකයින් පසුගිය වර්ෂයේ සිට නොවෙනස්ව පැවතුනි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන ආචාර්ය ඩී.එස් ජයවීර (සභාපති), ජේ.ආර්.යූ ද සිල්වා සහ යෝගා පෙරේරා යන මහත්වරුන් සමාලෝචිත වර්ෂය තුල සේවය කළ අය වූහ.

අධිකාරි විෂය පථය තුල නිර්වචනය කෙරුනු කොන්දේසි ඇතුලත් විශේෂිත වගකීම් කමිටුවට පවරා ඇත. අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිර්වචනය කිරීම, වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කිරීම, ඒකකයේ සියලු ක්‍රියාකාරකම් සඳහා වූ අභ්‍යන්තර පාලන ක්‍රම ඇගයීම සහ සමාලෝචනය, පිරිවැය සූක්ෂමභාවය ඇති කිරීම සහ නාස්තිකාරී වියදම් නැති කිරීම එම වගකීම් අතර වෙයි. අනෙකුත් කරුණු අතර බාහිර විගණකවරුන් සමග සම්බන්ධතා පැවැත්වීම, විගණකාධිපති සහ බාහිර විගණක විසින් නිකුත් කරනු ලැබූ කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් වාර්තා කිරීම, ව්‍යවස්ථාවන්, නීතිරීති හා චක්‍රලේඛ අනුව කටයුතු කරන බව නිශ්චය කිරීම, ගණකාධිකරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීම සහ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය, පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුව විසින් කරන ලද නිර්දේශ සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචනය කිරීම වැනි වගකීම් ද වේ.

වර්ෂය තුල AMC රැස්වීම් තුනක් පවත්වා ඇත. ජේ.ආර් යූ ද සිල්වා, යෝගා පෙරේරා යන මහත්වරුන් රැස්වීම් දෙකකට සහභාගි වූ අතර කමිටු කටයුතු පිළිබඳ වාර්තා බෙදා හැරීම් මගින් ඔවුන් දැනුවත් කරන ලදී. ඒ අතරතුර සියලු වැදගත් කරුණුවලදී ඔවුන්ගේ උපදේශනය ලබා ගන්නා ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තා සටහන් සොයා ගැනීම් සහ නිර්දේශ ලබාගනියි. තීරණ ගැනීමට අධිකාරී බලයක් නොමැති නිසා සියලු නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලබයි. කමිටුවේ සභාපති විසින් කමිටු රැස්වීම් වල ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර එම ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා වල අන්තර්ගත කරනු ලබයි.

| AMC සමාජික නම | දරන තනතුර | | පැමිණීම |
|---|---|---|---|
| | ශ්‍රී.ශ්‍රී.සේ සමාගම | වි.ක කමිටුව | |
| ආචාර්ය ඩී.එස් ජයවීර මයා | අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත (මුදල් අමාත්‍යාංශය) | සභාපති | 3/3 |
| ජේ.ආර්.යු ද සිල්වා මයා | අධ්‍යක්ෂ | සාමාජික | 2/3 |
| යෝගා පෙරේරා මයා | අධ්‍යක්ෂ | සාමාජික | 1/3 |
| එස්.එම් චන්ද්‍රපාල මයා | ප්‍රධාන ගණකාධිකාරී (ගුවන්සේවා අමාත්‍යාංශය) | සාමාජික | 3/3 |
| සී.වන්නිගම මයා | අභ්‍යන්තර විගණන සහ තත්ව පාලන ප්‍රධානී | සාමාජික/කැඳවුම්කරු | 3/3 |

**ප්‍රධාන කොටස්කරු ලෙස රජයට වගකිව යුතු බව**

**පූර්ණ හිමිකම රජය වෙත ඇති සමාගමක් ලෙස රජය වෙත ඇති වගකීම ක්‍රියාත්මක කෙරෙන යාන්ත්‍රණය පහත සඳහන් පරිදි වේ.**

**පාර්ලිමේන්තුව**

2002 මැයි 24 දිනැති අංක PE/PF 21 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව මූල්‍ය වර්ෂය අවසානයේ සිට දින 150 ක් ඇතුලත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සමාලෝචනය සඳහා සමාගමේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

**පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව (COPE)**

ව්‍යාපාරය නිසි ඉලක්කයන් සපුරාලන ප්‍රමාණය සහ සිය සමාජයීය වගකීම ඉටුකරන ප්‍රමාණය නිශ්චය කර ගැනීම උදෙසා රාජ්‍ය ව්‍යවසාය වල කාර්යසාධනය සමාලෝචනය කිරීමේ බලය පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවට පවරා ඇත. කෝප් කමිටුව මගින් කැඳවීම් කරනු ලැබූ විට සභාපති, අධ්‍යක්ෂවරු, ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් කැටුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ලෙස අමාත්‍යාංශයේ ලේකම් එහි පෙනී සිට සමාගමේ කටයුතු පිළිබඳ සියලු විමසුම් වෙනුවෙන් ප්‍රතිචාර දැක්විය යුතුය. වර්ෂය තුල එක් රැස්වීමක් සඳහා සමාගම කැඳවන ලදී.

**පාර්ලිමේන්තු උපදේශක කමිටුව (PCC)**

ගුවන් සේවා පිළිබඳ පාර්ලිමේන්තු උපදේශක කමිටුව (PCC) ට සමාගමෙහි සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් සහ පාර්ශවයන්ට ආයතනයේ මෙහෙයුම් සම්බන්ධයෙන් වැදගත් විමසීම් පැහැදිලි කිරීම සඳහා රැස්වීම් වලට සහභාගි වන ලෙස දැනුම් දීමට බලය ඇත.

**මුදල් ඇමති / මහාභාණ්ඩාගාරය**

රාජ්‍ය ව්‍යවසාය ඇතුලුව රාජ්‍ය අංශයේ මූල්‍ය විනය සම්බන්ධයෙන් වගකිවයුතු වන්නේ මුදල් ඇමති හෝ ඔහු වෙනුවෙන් රාජ්‍ය භාණ්ඩාගාරයයි. ඒ අනුව කාර්යසාධනය අධීක්ෂණය කිරීමටත් ව්‍යවස්ථා නීති රීති සහ රෙගුලාසි අනුගමනය කරන බව සහතික කර ගැනීම සඳහාත් වැදගත් කරුණු අමාත්‍යවරයාට වාර්තා කිරීම සඳහාත් භාණ්ඩාගාර නියෝජිතයකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලබයි.

සමාලෝචිත වර්ෂය තුල ආචාර්ය ඩී.එස් ජයවීර භාණ්ඩාගාර නියෝජිත ලෙස කටයුතු කරන ලදී.

රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය කළමනාකරණය සහ පාලනය සම්බන්ධ වගකීම රැඳී පවතින්නේ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව වෙතය.

**ගුවන් සේවා අමාත්‍යාංශය**

ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ලෙස සමාගමේ මූල්‍ය පරිපාලනය සහ කාර්යසාධනය සම්බන්ධයෙන් රජයට වගකිවයුතුය. ඒ අනුව පහත සඳහන් කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය සමග නිරන්තරයෙන් සමාලෝචනයට භාජනය කරයි.

1. සංයුක්ත සැලසුම සහ වාර්ෂික අයවැය
2. ජංගම වර්ෂයේ භෞතික සහ මූල්‍ය කාර්යසාධනය
3. විගණකාධිපති වාර්තා (වැය ශීර්ෂ අරමුදලෙහි ගිණුම් පිළිබඳ) සහ කළමනාකරණ ලිපි (සමාගමෙහි සහ රඳවා ගත් ආදායම් ගිණුම් පිළිබඳ)
4. වසර තුල භාරගත් සංවර්ධන ක්‍රියාකාරකම්
5. රාජ්‍ය ව්‍යවසාය කමිටු (COPE) රැස්වීම් වලදී පැන නගින කරුණු





# අවදානම් කළමනාකරණය සමාලෝචනය

ඒ කෙසේද යත්;
"ගනු ලබන සියලු ක්‍රියාමාර්ග අවදානම් සහිත වේ. එමනිසා විචක්ෂණභාවය යනු අවදානම වැලැක්වීම නොව (එය කළ නොහැකිය) අවදානම තක්සේරු කිරීම සහ තීරණාත්මක ලෙස ක්‍රියා කිරීම වේ. අලසකම නිසා නොව අභිලාෂයන් වෙනුවෙන් වැරදි කරන්න. වේදනා විඳීමට නොව නිර්භීත ක්‍රියා කිරීම සඳහා ශක්තිය ගොඩ නගන්න."

# අවදානම් කළමනාකරණය

රට තුල සියළු ගුවන් තොටුපලවල් ගඟන යාත්‍රාංගන කළමනාකරණය කිරීමට බලයලත් රජයේ නියෝජිතයා ලෙස ගුවන් තොටුපල සහ ගුවන් සේවා සමාගම ආයතනයේ දෛනික මෙහෙයුම් සහ මූල්‍යකාර්යසාධනයට තර්ජනයක් වන අවදානම් වලට පමණක් නොව රටෙහි ප්‍රතිරූපයට විශාල ලෙස හානි වන අනේකවිධ අවදානම්වලටට උරදෙයි. ගුවන්යානා, ගුවන් මගීන්, ගුවන් බඩු කුමන රටක් සතු වේද යන්න නොසලකා කොළඹ ගුවන් තොරතුරු කලාපය හරහා ගමන් කිරීමේදී එහි ගුවන් ගමන් හසුරුවන්නා වන ගු.ගු.සේ සමාගමේ පරාසයට ඒවා හසු වෙයි. මෙසේ පහත දැක්වෙන ලැයිස්තුවේ සඳහන් ආකාරයට ප්‍රධාන මෙහෙයුම් වල සෑහෙන ප්‍රමාණයක් සහ සුවිශාල ගගන නාවික වත්කම් ප්‍රමාණයක් පහසුවෙන් අවදානමට ලක් විය හැකි බව හඳුනාගෙන ඇත.

- ගුවන් තොටුපල / ගුවන් සේවා / ගුවන් භාණ්ඩ ගනුදෙනුකරුවන්
- ගුවන් තොටුපල / ගුවන් සේවා / කර්මාන්ත සේවකයින්
- ගුවන් තොටුපල සහ ගුවන් සේවා වල උනන්දු පාර්ශවයන්
- සමාගම සතු දේපල (උදා: ගුවන් සේවා කාර්යාල)
- බුද්ධිමය දේපල
- ගුවන් තොටුපල සහ ගුවන් සේවා කොන්ත්‍රාත් කරුවන් (උදා: ගොඩබිම හැසිරවීමේ නියෝජිතයින් )
- ස්පෘශ්‍ය (උදා: ගුවන් තොටුපල පහසුකම්) සහ අස්පෘශ්‍ය වත්කම් (සංවිධානයේ ප්‍රතිරූපය)

අපගේ අවදානම් කළමනාකරන පද්ධතියේ පිටුපස ඇති ප්‍රධාන වටිනාකම වන්නේ කාලීනව, ප්‍රමාණවත්ව මැදිහත් වීම සහ නිරවද්‍ය ලෙස තක්සේරුවයි.

අවදානම අවදානමට භාජනය වීමේ හැසියාව සමග ඒකාබද්ධවූ තර්ජනයේ ප්‍රතිඵලයක් බැවින් තර්ජනය සහ අවදානමට ලක් වීමේ හැකියාව තක්සේරු කිරීමේ අංග අපගේ අවදානම් කළමනාකරන චක්‍රයේ කොටස් බවට පත්වේ. එය පහත සඳහන් සටහනෙන් දැක්විය හැකිය.

## අවදානම් කළමනාකරණ චක්‍රය




අවදානමට බඳුන්වීම අවම කිරීම සඳහා ගුගුසේ සමාගම විසින් ගනු ලබන සැලකිය යුතු මට්ටමේ ප්‍රතික්‍රියාමාර්ග පහතින් දැක්වේ.

| කර්මාන්තය/රටෙහි අවදානම |
| --- |
| **විස්තර කිරීම /අවදානමේ ස්වභාවය**<br>**ජාතික ගුවන් සේවය මත විශාල ලෙස යැපීම**<br>බ.ජා.ගුහි මගී පරිමාවෙන් 55% ක කොටසක් දරන ශ්‍රී ලංකා ගුවන් සේවය ගු.ගු.සේ සමාගමේ ප්‍රධාන පාරිභෝගිකයා වේ. එය ජාතික අඩු පිරිවැය ගුවන් සේවාව වන මිහින් ලංකා සමාගම සමග එක්ව 60% ක මගී පරිමාවකට වග කියනු ලැබේ. මේසා විශාල රඳාපැවැත්මක් හේතුකොට ඇඳුනු ගණනය කළ නොහැකි සාධක වල ප්‍රතිඵලයක් ලෙස සැලකියයුතු ප්‍රමානයක අවිනිශ්චිත තත්වයක් හා අනුසංගිකව වෙළඳපල සහ ගනුදෙනුකරුවන් මත පදනම් වූ සැකැස්මේ ඉහළ අවදානමකට ගු.ගු.සේ සමාගම මුහුණ පා ඇත.<br><br>**ප්‍රති ක්‍රියාමාර්ග**<br>ආයතනයක් ලෙස මෙම අවදානම පාලනයට ගු.ගු.සේ සමාගමට අපහසු වී ඇත. කෙසේ වුවද රටෙහි ගුවන් සේවා ප්‍රධාන සැලැස්මෙන් පාලනය කරනු ලබන නිදහස් විවෘත අහස ප්‍රතිපත්තිය යටතේ මෙම ජාතික ගුවන් සේවා දෙකට රැකවරණය සැලසීමේ උපායයීය සැලසුම් අඩංගු වේ. කෙසේ නමුදු 2012 ගිණුම් වර්ෂයේ ගු.ගු.සේ සමාගම හා ජාතික ගුවන් සේවය ව්‍යාපාර සැලසුම් කිරීමෙහිලා අති සාර්ථක වසරක් ලෙස ඔප්පු කර ඇත. ආරම්භ කළ මුල පිරිම් සහ මිනුම් දඬු කළමනාකරණ තීරණ සහ විශ්ලේෂණ යටතේ දැක්වෙන උනන්දු පාර්ශව සහභාගිත්වය මගින් විස්තර කොට ඇත. |

**කර්මාන්තය/රටෙහි අවදානම**- ඉදිරියට.

**විස්තර කිරීම සහ අවදානමේ ස්වභාවය**
ගුවන් සේවා වත්කම් නැතිවීම හෝ හානිවීම

**ප්‍රතික්‍රියාමාර්ග**
සුදුසු ආරක්ෂණ සහ ගිනි නිවාරණ මිනුම් වලට අමතරව නිරන්තර පදනමින් ක්ෂණික සැලසුම් පුහුණු කරන ලදී. රක්ෂණ ප්‍රතිපත්තිය මගින් අවදානම තෙවන පාර්ශවයකට පැවරීම කළයුතුම කාර්යයක් ලෙස සලකන ලදී.

**විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**
ඉල්ලුම් පුරෝකථන අවදානම
රටෙහි එකම ජාත්‍යන්තර ගුවන් තොටුපල බ.ජා.ගු නිසා තීරණ ගැනීමේ සහ සැලසුම් කිරීමේ අරමුණ සඳහා භාවිතා කිරීමට ඉල්ලුම් පුරෝකථන අවදානම් සහිත විය.

**ප්‍රතික්‍රියාමාර්ග**
ඉල්ලුම් පුරෝකථන කිරීම සඳහා ජපන් ගුවන් තොටුපල උපදේශකයින් නම් වූ සංවිධානයක් සේවයේ යෙදවූයෙමු. ඔවුන් 2010 සිට 2025 දක්වා පශ්චාත් යුද කාලය ආවරණය වන පරිදි තම අධ්‍යයන කටයුතු සිදු කරන ලදී. කාල ප්‍රවණතා ඉකොනොමෙට්‍රික්ස්, ආකෘති සිතුවම්පට, වෙළඳපල සමීක්ෂණ, අනුපාත තීරණ, පර්යන්ත ක්ෂේත්‍ර පුරෝකථන, ගුවන් සේවා කර්මාන්ත සංයුතියේ වෙනස් වීම්, මාර්ග ජාලයේ වෙනස් කම් ආදිය භාවිතයට ගන්නා ලදී. ඉල්ලුම් පුරෝකථන කරන විට ශුභවාදී නැවත සකස්කිරීම් සහ අශුභවාදී සිතුවම් සපයන ලදී. වර්තමානයේ ගු.ගු.සේ සමාගමේ උපායමාර්ගික සැලසුම් ගුවන් යානා සහ මගීන් අතර සම්බන්ධතාවය ලෙසට මගී සංචලතාව සඳහා නැවත සකස් කල පුරෝකථන මත පදනම් වී ඇත.

**විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**
දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපලේ වෙළඳ පල සංවර්ධන අවදානම

අලුතෙන් ඉදි කළ ගුවන් තොටුපලවල් නිතරම ගනු දෙනුකාර පදනමේ අවදානම කැටිව යයි. මරාජාගු තොටුපලද මෙම පොදු සූත්‍රයෙන් බැහැර නොවේ.

**ප්‍රතික්‍රියාමාර්ග**
ගුගුසේ සමාගමේ අලුතෙන් පිහිටවූ අලෙවිකරණ අංශය එහි ආරම්භයේ සිටම ම.රා.ජා.ගු සඳහා වෙළඳපල හැකියාවන් හඳුනාගැනීම සහ පුළුල් කිරීම දෙසට පූර්ණවශයෙන් යොමුවිය. විවිධ උනන්දු පාර්ශවයන් ගේ අභිමතයන් සමාන කිරීම අවශ්‍යවූ බැවින් වර්ෂය තුල භූමිය බැලීමට යාමත් සාකච්ඡා පැවැත්වීමත් සිදුවිය. සිතුවම් පට විශ්ලේෂණ සහ පුරෝකථන, වාහන තදබදය පිළිබඳ පුරෝකථන, මාර්ග සම්බන්ධ පුරෝකථන, පෝෂක ප්‍රදේශ විශ්ලේෂණ ආදිය සංචාරක සහ ගුවන් යානා කණ්ඩායම්හි සාම්ප්‍රදායිකව ගනු ලැබූ ප්‍රවර්ධන ක්‍රියාමාර්ග වලට අමතරව අලෙවිකරණ කණ්ඩායම විසින් වර්ෂය තුල ක්‍රියාත්මකකරනු ලැබූ සුවිසල් පියවරයන් විය.

**නීති අවදානම**

**විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**
බණ්ඩාරණායක ගුවන් තොටුපල සහ රත්මලාන ගුවන් තොටුපල භාවිතයේදී මගීන්ට හා මහජනතාවට සිදුවන මරණ /හානි සම්බන්ධයෙන් ඇතිවන අවදානම

**ප්‍රතික්‍රියාමාර්ග**
පර්යන්ත ගොඩනැගිලි සහ යාබද ප්‍රදේශවල සිදුවන අනතුරු ආවරණය කිරීම සඳහා වගකීම් රක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී. ගුවන් යානා මෙහෙයවන්නන් හට තීරු බදු රහිත සාප්පු සංකීර්ණ හා අනෙකුත් සහන ලාභීන් සඳහා ඔවුන් සමග ගිවිසුම් වලට එළඹීමේදී ඔවුන්ගේ කොන්ත්‍රාත්තුවට යටත් වූ ප්‍රදේශයන්හි තුන්වන පාර්ශවයකට වන අනතුරු හා මරණ සම්බන්ධව ඇතිවන නෛතික අවදානම ආවරණය කිරීමට පොදු මහජන වගකීම් රක්ෂණ ප්‍රතිපත්තිය අනිවාර්ය අංගයක් බවට පත් කරන ලදී. ගුවන් තොටුපල තුල ඉදිකිරීම් කොන්ත්‍රාත්තු හා බැඳුනු අවදානම ආවරණයට සෑම කොන්ත්‍රාත් කරුවෙක්ම ගුගුසේ සමාගම සමග කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹෙන අවස්ථාවේදීම සියලු අවදානම් ආවරණය වන රක්ෂණ ප්‍රතිපත්තියක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වීම තවත් එක් ආවරණයක් විය. අපගේ සියලු කොන්ත්‍රාත් ගිවිසුම් වල නෛතිකමය හෝ මැදිහත්කරුවකු වෙත යාමට පෙර මිත්‍රශීලි එකඟතාවයකට පත්වීමට අවශ්‍ය කොන්දේසි අඩංගු වේ. මෙම වගන්ති හඳුන්වා දෙනු ලැබුවේ නෛතික අවදානම මත දැරිය යුතු ඉහළ පිරිවැය අවම කිරීමට පෙළඹවීමක් ලෙසය.

**විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**
පාරිසරික ප්‍රමිතීන්ට එකඟ නොවීම

**ප්‍රති ක්‍රියාමාර්ග**
ප්‍රදේශයට අදාලවන සමහර පාරිසරික ආරක්ෂණ නීතිද සමහර නීතිමය අවදානම් වලට හේතුවක් වේ. තිරසාර පැවැත්ම පිළිබඳ කළමනාකරණයෙහි විස්තර කරන ලෙසට මධ්‍යම පරිසර අධිකාරිය ට අවශ්‍ය වන ලෙසින් පාරිසරික ප්‍රමිතීන්වලට අනුකූලව ගු.ගු.සේ සමාගම සියලු ප්‍රදේශයන්ට අදාල වන මෙම අවදානම් වලක්වමින් ක්‍රියාකරයි. තොරතුරු හුවමාරුවේදී මැදිහත්වීමේ ක්‍රියාවලිය (උදා: දෙවන ධාවන පථය, දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල -ම.රා.ජා.ගු) දේශීය පුරවැසියන්ගේ මැදිහත් වීමෙන් හෝ අසල්වැසි උපදේශාත්මක කමිටුවක් මගින් සිදුකරයි.

| මෙහෙයුම් අවදානම් |
|---|
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>පරිඝණක පද්ධතියට හිතා මතා කෙරෙන හානි සහ අවදානම්<br><br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>අපගේ රහස්‍ය සංවේදක සහ ආරක්ෂිත තොරතුරු සොරා ගන්නවුන්ගෙන් සහ වෛරස් වලින් වන හානි වලට එරෙහිව ඵලදායි ගිනිකඩන තාක්ෂණය ස්ථාපනය කරන ලදී. අනවසර පරිඝණක භාවිතා කරන්නන් අනීතිමය මැදිහත් වීම් වලින් පද්ධතිය මුදා ගැනීමට හඳුන්වා දුන් ආරක්ෂා කිරීම් වලට අමතරව ජාල පිවිසුම් පාලනය අනවසර මැදිහත්වීම් සොය ගැනීම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් උසස් පද්ධති අනුමත කිරීමේ පාලනයක්ද ක්‍රියාත්මක කෙරේ. |
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>විශාල ප්‍රාග්ධන ආයෝජනය නිසා ඉහළ මට්ටමේ මෙහෙයුම් තෝලනයක් ප්‍රදර්ශනය වීම<br><br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>ව්‍යාපෘති පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් කරමින් සියලු ප්‍රධාන ආයෝජන තීරණ ගනු ලබයි. වැඩි වශයෙන් භාවිතා කරනු ලබන ශිල්පීය ක්‍රම වන්නේ CFROI, පිලිගෙවුම් කාලය, ශුද්ධ වර්තමාන අගය, EVA සහ IRR වේ.<br><br>ප්‍රාග්ධනය කපා හැරීම හෝ ප්‍රාග්ධන වත්කම්හි ආයෝජනය සීමාකිරීම දිගුකාලීන ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීමට හැකි වන පරිදි සහ යහපත් ද්‍රවශීල තත්වයක් පවත්වා ගත හැකි වන පරිදි වාර්ෂික අයවැය ක්‍රියාවලිය හරහා සිදුවෙයි. යෝජිත ප්‍රාග්ධන වත්කම් වල හෝ ව්‍යාපෘතියෙහි ව්‍යාපාරයට ඇති වැදගත් කම සැලකිල්ලට ගෙන ප්‍රාග්ධන කපාහැරීමේ ක්‍රියාවලිය සිදුවේ. ගු.ගු.සේ සමාගමේ වියදම් වැඩසටහන තීරණය වන්නේ ද්‍රවශීල සහ තෝලන අනුපාත මගින් තීරණය වී ඇති ඉහළ සීමා සැලකිල්ලට ගනිමිනි. එසේම අනෙකුත් ව්‍යාපෘති සම්බන්ධයෙන් මෙම ඉහළ සීමා බාහිර මූලාශ්‍ර මගින් සොයා ගනු ලබයි. |
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>වංචා, අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටි බිඳ වැටීම<br><br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>දැනට දැඩි අභ්‍යන්තර පාලන පද්ධතියක්, ප්‍රමිතිකරණය කරන ලද මූල්‍ය පටිපාටි සහ ISO සහතික කරන ලද තත්ව කළමනාකරණ විගණන පද්ධතියක් ක්‍රියාත්මක වේ. (අනුකූලතා විගණනය)<br><br>අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන කාලීන සමාලෝචන සහ ඵලදායි අභ්‍යන්තර පාලන පවත්වා ගැනීමට ඌණ පූරක සේ සංවිධානය තුල නිරන්තරයෙන් අභ්‍යන්තර කණ්ඩායම් විසින් කරගෙන යනු ලබන කළමනාකරණ විගණනද පවතී. |
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>පද්ධති බිඳ වැටීම<br><br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>පද්ධති බිඳ වැටීම් වලක්වා ගනු වස් හා අවම කිරීමේ අරමුණ ඇතිව පූර්ව මෙන්ම පසු අනාවරණ පද්ධති ස්ථාපිත කර ඇත. මධ්‍යගත දෝෂ අධීක්ෂණ පද්ධතිය පූර්ව දෝෂ අධීක්ෂණ පද්ධතිය ලෙස වර්තමාන තත්වය හා දෝෂ ප්‍රස්ථාරිකව හා අනාගත බිඳ වැටීම් පිළිබඳ අනතුරු ඇඟවීම් විදහා දක්වයි. හානි හා අලාභ අවම කරන අතරතුර දෝෂ අප්‍රමාදව හඳුනාගත හැකි පරිදි ගිනි අනාවරණ පද්ධති හා අවිනිශ්චිත තත්වයන් සඳහා වූ සැලසුම් ස්ථාපිත කර ඇත.<br><br>ගුවන් තොටුපල දත්ත මධ්‍යස්ථානය network virtualization, sever virtualization, consolidation and storage virtualization යන දියුණු තාක්ෂණයන්ගෙන් සහය ලබයි.<br><br>ගු.ගු.සේ සමාගම වර්තමානයේ සැබෑ තාක්ෂණික සේවාවක් සමග ආපදා ප්‍රතිස්ථාපන පද්ධතිය කටුනායක බ.ජා.ගු තොටුපලේ පිහිටුවීම මගින් අක්‍රිය කාල සීමාව අවම කරමින් අඛණ්ඩ සේවාවක් ලබා දෙමින් සිටී. ආපදා ප්‍රතිස්ථාපන පද්ධතිය අනාගතයේදී මරාජාගු හි ද ස්ථාපිත කෙරෙනු ඇත. |
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>බ.ජා.ගු තොටුපලෙහි උපයෝගී සේවාවලට බාධා වීම්<br><br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>ප්‍රධාන ජල සැපයුම් පද්ධතිය මත විශාල ලෙස රඳා පැවතීම අවම කර බ.ජා.ගු තොටුපලට අඛණ්ඩ ජල සැපයුම් පද්ධතියක් තහවුරු කිරීමට අමතර නළ ලිං මගින් භූගත ජල අස්වැන්න නෙලා ගැනීම වැඩි දියුණු කර ඇත.<br><br>විදුලි ඇණ හිටීමකදී ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි අවශ්‍ය ධාරිතාවෙන් යුත් ප්‍රමාණවත් විදුලි ජනන යන්ත්‍ර ප්‍රමාණයක් යොදවා තිබේ. |

| ආරක්ෂක සේවාවේ අවදානම් |
|---|
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>ගුවන් සේවාව හා බැඳුනු අවදානම් නම් වශයෙන් ගත් කළ ගෝලීය ත්‍රස්තවාදය, මත්ද්‍රව්‍ය ජාවාරම, හානිකර ද්‍රව සහ ඝන, නිරෝධායනය නොකළ සත්ව සහ පැලෑටි, නීති විරෝධී මගීන් සහ තහනම් භාණ්ඩ ආදිය වේ.<br><br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>රේගු, ආගමන විගමන, ගුවන් හමුදා සහ පොලීසිය යන බ.ජා.ගුභි සුපරීක්ෂක සම්පත් සමග සුසංයෝගීව ගු.ගු.සේ සමාගමෙහි ගුවන් තොටුපල ආරක්ෂක පිරිස ඉහත සිදුවීම් අවම කිරීමට හැකිවන පරිදි තම රාජකාරී කටයුතු ඉටු කරයි. |
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>ප්‍රභව හා බැඳුනු අවදානම්<br><br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>මිලදී ගැනීම් පටිපාටිවලට තදින්ම අනුගත වීමෙන් නිරන්තරයෙන් මුහුණ දීමට සිදුවන අවදානම් වලින් අප නිරාවරණය වේ.<br><br>සැපයුම් කරුවන් ඇගයීමට පත්කළ තාක්‍ෂණික ඇගයීම් කමිටු මගින් මිළ ඉදිරිපත්කිරීමේ දී ඉදිරිපත් කළ තොරතුරු තවෙකක් සමග ගලපා පරීක්‍ෂා කිරීමෙන්ද ස්වාභාවික වෙළඳපල පරීක්‍ෂා මගින්ද ඔවුනට අප සමග ව්‍යාපාර කිරීමේ හැකියාව පිළිබඳ සොයා බැලීමට අපි ඉතා විමසිලිමත් කටයුතු කරන්නෙමු. අඛණ්ඩ සැපයුම තහවුරු කිරීමට අප ඔවුන්ගේ පද්ධති ක්‍රියාවලින් මූලාශ්‍ර පරිසරයට වන බලපෑම් සහ පරිසරයෙන්වන බලපෑම් පරීක්‍ෂා කරන්නෙමු. නිසිකලට සැපයීම, අනුකූලවීම, තිරසාර බව හා ඔවුන්ගේ මූල්‍ය විශ්වාසදායි බවටද අප එක හා සමාන වැදගත් කමකින් සලකන්නෙමු. අපගේ අරමුණු පැහැදිලිව ටෙන්ඩර් පත්‍රිකා වල සඳහන් වන අතර අපගේ විවෘතභාවය ඉහළ නැංවීම සඳහා කොන්දේසි ඇතුලත් කර ඇත. බාහිර පාර්ශවයන්ට ප්‍රදානය කිරීම, අඛණ්ඩ සැපයුම හා නිසිකලට බෙදා හැරීම් විකිණීමෙන් පසු සේවා යන අංශ ආශ්‍රිතව ඇති අවදානම පාලනයෙහිලා කොන්ත්‍රාත් එකඟතා ගිවිසුම් වැදගත් මෙහෙයක් ඉටු කරයි.<br><br>අවශ්‍යතාවය සම්පූර්ණ කළ හැකි පාරිභෝගිකයින් සහ සැපයුම්කරුවන් සුදුසු කම් ලබා අපගේ අභ්‍යන්තර හා බාහිර සැපයුම් ජාලයේ කොටස් කරුවකු ලෙස ප්‍රදානය ලැබූ විගස සැපයුම්කරුවන් තම කාර්යය නොකර සිටීමේ අවදානම ආවරණය කිරීම බැංකු ඇපකර වලට අනුව නිකුත් කළ කාර්යසාධන බැඳුම්කර හා මිල බැඳුම් කර කොන්දේසි වලින් ආවරණය වන අතර ගෙවීම් පැහැර හැරීමේ අවදානම අවම කිරීම සඳහා බැංකු ඇපකර ලබාගනුයේ මුදල් ගෙවීම පැහැර හැරීමෙන් වන මූල්‍ය පාඩුව ආවරණය කිරීමට ප්‍රමානවත් පරිද්දෙනි.<br><br>ගු.ගු.සේ සමාගමේ ලියාපදිංචි සැපයුම් කරුවන්ගේ ශක්‍යතාව වාර්ෂිකව සමාලෝචනය කරන අතර පැහැර හැරීම් නිසා අසමත් වන්නවුන් ඔවුන්ගේ අසුබවාදී ක්‍රියාකාරිත්වය මත අපකීර්තිමත් සැපයුම් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කරනු ලැබේ. |

| ආරක්‍ෂණ අවදානම |
|---|
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>කොළඹ ගුවන් තොරතුරු කලාපයේ ගුවන් යානා සිදුවීම්/අනතුරු<br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>විය හැකි අනතුරු අඛණ්ඩව අඩුවන පරිදි අවසානයේ දී අනතුරු ශූන්‍ය ඉලක්කයක් කරා ළඟාවීම අරමුණු කොට ගෙන අපගේ ගුවන් ගමන් පාලකවරු තම මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේදී උපරිම අවධානයක් යොමු කරයි. සුරක්ෂිතභාවය, පුද්ගලික බලපත්‍ර, ගුවන් යානා මෙයෙහයුම්, ගගන යාත්‍රාංගන, ගුවන් ගමන් පාලන සේවාව අනතුරු විභාග කිරීම හා පරිසරයට අදාල පොදු පිලිගත් ප්‍රමිත සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලවීමට වාරිකව සුපරීක්ෂාකාරී විගණනයන් විධිමත් අධිකාරීන් මගින් කරනු ලබයි. කුරුළු උවදුර සහ ගුවන් අනතුරු අවදානම පාලනය කිරීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලයීය සත්ව විද්‍යා දෙපාර්තමේන්තුවට අනුබද්ධ ශ්‍රී ලංකා පක්ෂි අධ්‍යයන කණ්ඩායම 2009 දී කළ අධ්‍යයන මගින් ඉදිරිපත් කළ නිර්දේශයන් ක්‍රියාත්මක කරන ලදී. කළමනාකරණ විග්‍රහය සහ විශ්ලේෂණය යටතේ විස්තර කරන ආයතනය තුල ඇති 'සුරක්ෂිතභාවය කළමනාකරණ පද්ධතිය' සුරක්ෂිතබව සම්බන්ධ අවදානම අවම කිරීම සඳහා වූ අපගේ එළඹුම තවදුරටත් ප්‍රතිඵලදායි කරවීය. |

| **මූල්‍ය අවදානම්** |
|---|
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>අහිතකර විනිමය අනුපාත උච්චාවචනය සහ ද්‍රවශීලතාවයේ අවදානම<br><br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>අභ්‍යන්තරිකව ගැලපුම් ශිල්පක්‍රමය යොදා ගනිමින් වටිනාකම අඩුවීම සඳහා ඇවුරුම (හැකි සෑම අවස්ථාවකදීම වත්කම් සහ වගකීම් විදේශ මුදලින් සම කිරීම)<br><br>ගෙවීම පැහැර හැරීම නිසා ඇතිවන ද්‍රවශීලතා අවදානම රාජ්‍ය සුරැකුම් වෙනුවෙන් වර්තමාන ණය අනුපාතය ඉක්මවූ අනුපාතයකට පැහැර හැරීමේ පොළී ආදායමක් අය කිරීම මඟින් අවම කරන ලදී. |
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>අහිතකර පොළී අනුපාත උච්චාවචනයන්<br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>පොළී අනුපාත අවදානම අවම කිරීම අරමුණු කර දිගුකාලීනව සහ කෙටිකාලීනව කල් පිරෙන බැඳුම්කර ආවලියක් මිලදී ගනිමින් ආදායම් වර්ධනය කරගනී. අපගේ සියලුම දෛනික ශේෂයන් ස්වයංක්‍රීයව පොළී උපයන ඇමතුම් තැන්පතු ගිණුමට මාරු කරනු ලබයි. |
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>ණයගැතියන් පැහැර හැරීම නිසා ඇතිවන අවදානම<br><br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>පැහැර හැරීමේ අවදානම ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් ණය මට්ටමකට අවසර දීමකදී හෝ දිගු කිරීමට පළමුව සෑම ණය ගැතියෙකුගෙන්ම බැංකු ඇපකරයක් ලබා ගනියි. ආවරණය කර ගත නොහැකි මට්ටමට යම් ණයගැතියෙකුගේ සීමාව ඉක්මවයි නම් සේවා සැපයුම හෝ ගුවන් තොටුපලෙහි වාණිජ ඉඩකඩ සඳහා කොන්ත්‍රාත්තු අවලංගු කිරීම වෙනුවට තවත් නියමයන් සහ විධානයන් ගු.ගු.සේ සමාගම සතුවේ.<br><br>බ.ජා.ගු හි සහන ලාභීන් උපයාගනු ලබන පිරිවැටුම මත ප්‍රකාශිත අවම පරාමිතීන් සමග කාර්ය සාධන ඇප කොන්ත්‍රාත්තු වලට එළඹේ. ද්‍රවශීලතා හානි දඩකාලය හා නිදහස් කිරීමේ පටිපාටි ආවරණය වන පරිදි ගිවිසුමෙහි බැංකු ඇපකරද සංයුක්ත කරනු ලැබේ. |

| **මානව සම්පත් අවදානම** |
|---|
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>පුහුණු වූ හා නිපුන සේවකයින් අහිමිවීම සහ බුද්ධි ගලනය<br><br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>සාධාරණ හා අපක්ෂපාතී වැටුප් සැකැස්ම තුල වෘත්තීය සුදුසුකම් ලත් පිරිස රඳවා තබා ගැනීමට වෘත්තීය අධ්‍යාපනික හා තාක්ෂණික සුදුසුකම් මත විශේෂ දීමනාවක් ලබා දෙයි.<br>වැටුප් රහිත කොන්දේසි මත සහ බැඳුම්කර මත විදේශයන්හි සේවයේ යෙදීමට හා අනාවරණය වීමේ අවස්ථා ප්‍රදානය කෙරේ. |
| **විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**<br>දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපලට අවශ්‍ය සුදුසුකම් සහිත නිපුන කාර්යමණ්ඩලයක් බඳවා ගැනීමට නොහැකිවීමේ අවදානම සහ 2013 වාණිජ කටයුතු ආරම්භ කිරීමට සූදානම් කිරීම සඳහා ම.රා.ජා.ගු වෙත බ.ජා.ගු කාර්යමණ්ඩලය මාරුකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුල කාර්යමණ්ඩල හිඟයක් ඇති වීමේ අවදානම<br><br>**ප්‍රතික්‍රියාමාර්ග**<br>එකම ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුගමනය කිරීම නිසා බ.ජා.ගුහි වර්තමාන කාර්යමණ්ඩලයෙන් කොටසක් පළවෙනි අවුරුදු කිහිපය තුල ම.රා.ජා.ගු වෙත යොදවන අතර ම.රා.ජා.ගු වෙනුවෙන් බඳවා ගන්නා නව කාර්යමණ්ඩලය අවශ්‍ය පුහුණුව ලැබීම සඳහා බ.ජා.ගු හි නිරත කරනු ලැබේ. අපගේ පුහුණු මධ්‍යස්ථානය 2011 වර්ෂයේ සිට නව බඳවා ගත්තවුන් සඳහා පුහුණු කටයුතු ක්‍රියාත්මක කරන ලදී. එමනිසා පලමු වසරේදී අලුත් අය සහ බ.ජා.ගුහි පුහුණු කාර්ය මණ්ඩලයේ මිශ්‍ර වීමක් සිදුවුනත් පසුව එය ක්‍රමයෙන් වෙනස් වනු ඇත. |

**මානව සම්පත් අවදානම - Contd.**

**විස්තර කිරීම/අවදානමේ ස්වභාවය**

**අයෝග්‍ය වෘත්තීය සංගම් ක්‍රියාකාරකම්**

**ප්‍රතික්‍රියාමාර්ග**

අත්‍යාවශය හිතකර විසඳුම් සඳහා වෘත්තීය සංගම් සමග ඵලදායි සංවාද හා එකඟ වීම් හරහා සුහද සම්බන්ධතාවයක් පවත්වා ගෙන යයි.

මහජනයාට බලපෑමක් ඇති වන ආයතනය තුල සිදුකෙරෙන වෙනස් කම් වලදී විනිවිදභාවයෙන් යුතුව දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වයි.

මානව සම්පත් කළමනාකරණය යටතේ විස්තර කරන දක්‍ෂතා යෙදවීම් හා සංවර්ධන මුලපිරීම් ගු.ගු.සේ සමාගම ඇතුලත වෘත්තීය සමිතිවල අහිතකර ක්‍රියාකාරීත්වය ඵලදායි ලෙස ව්‍යර්ථ කිරීමට හැකියාව ලබාදේ.


4.76230
5.32958
3.25032
7.32090
2.64058
5.32597
3.25409
3.53523
9.02953




# විගණනය කළ ගිණුම්

*“අවසානයේ ........ ගෝලීය මිනුම් දණ්ඩක් ලෙස”*

# විගණකවරුන්ගේ වාර්තාව

pwc

**සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ කොටස් හිමියන් වෙත, ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව**

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ වාර්තාව**

**1** අප විසින් 86 සිට 117 දක්වා පිටුවල දැක්වෙන සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඊට සම්බන්ධිත විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සමග සුවිශේෂීවූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ද විගණනය කළෙමු.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ වගකීම**

**2** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඉදිරිපත් කිරීම සඳහා කළමනකරණය වගකීමෙන් බැඳේ. මෙම වගකීම තුළ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍යතාවයන්ගෙන් තොරව පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීමටත්, මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම සැළකිය යුතු ඇස්තමේන්තු හා තක්සේරු කිරීම් වලට අනුකූලවත් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවත් පිළියෙළ කොට වැරදි හා වංචා වලින් තොරව ඉදිරිපත් කිරීමටත් අදාල පරිදි අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටීන් සැළසුම් කිරීම, ක්‍රියාවේ යෙදවීම හා ඒකාකාරීව පවත්වාගෙන යාම අඩංගු වේ.

**විගණනයේ විෂය පථය සහ මතයේ පදනම**

**3**අපගේ වගකීම වන්නේ, අපගේ විගණනය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමයි. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව අපි අපගේ විගණනය කරගෙන ගියෙමු. ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍යතාවයන්ගෙන් තොරදැයි සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට අප විසින් විගණනය සැළසුම් කිරීම එම ප්‍රමිතීන් මඟින් අවශ්‍ය කෙරේ.

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන වල අගයන් හෙළිදරව් කිරීමට උපකාර වන සාක්ෂි නියැදි පදනමක් මත පරීක්ෂා කිරීම, යොදාගත් ගිණුම්කරණ මූලධර්ම සහ කළමනාකරුවන් විසින් කරන ලද සැළකිය යුතු ඇස්තමේන්තු තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීම සහ ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කොට ඉදිරිපත් කර ඇත්දැයි නිශ්චය කිරීම විගණනයට ඇතුළත් වේ.

අපගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව අපගේ විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් අපි ලබා ගතිමු. එම නිසා අපගේ විගණනය අපගේ මතය සඳහා සාධාරණ පදනමක් වන්නේ යයි අප විශ්වාස කරමු.

**මතය**

**4** අපගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම නිසි ගිණුම් පොත්පත් පවත්වාගෙන ඇති අතර, ගිණුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වනසේ පිළියෙළ කර ඉදිරිපත් කර ඇති බවත් 2012 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය සහ සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බවත් අපගේ මතය වේ.

**කරුණු අවධාරණය**

**5** අපගේ මතය තත්ත්වාගනනය නොකර ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන සහ රඳවා ගත් ආදායම් අරමුදල් සම්බන්ධයෙන් සමාගමේ සහ ගුවන් තොටුපලේ මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ කිරීමේ පදනම් විස්තර කෙරෙන මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 2.1.1 ට අවධානය යොමු කරන්නෙමු.

2011 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ රඳවා ගත් ආදායම් අරමුදල් වෙනත් විගණන සමාගමක් විසින් විගණනය කර ඇති අතර 2012 ජූනි 12 දාතම ඔවුන්ගේ මතය දැක්වෙන වාර්තාව අනුව සමාගම 2005 දී ලබාගත් කැබිනට් අනුමතියට අනුව වත්කම් සහ වගකීම් ඒකාබද්ධ කිරීම 2.1.1 සටහනෙන් හෙළිදරව් කර ඇති බව දක්වා තිබේ.

**වෙනත් නීති රීති සහ රෙගුලාසි වලට අදාළ වාර්තාව**

**6** අපගේ මතය අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 (2) වගන්තියේ අවශ්‍යතාවන්ට යටත්ව පිළියෙළ කර ඇත.

PricewaterhouseCoopers

**වරලත් ගණකාධිකාරීවරු**
ප්‍රයිස්වෝටර්හවුස් කූපර්ස්
2013 ජූනි 19
කොළඹ

*PricewaterhouseCoopers, P. O. Box 918, 100 Braybrooke Place, Colombo 2, Sri Lanka*
*T: +94 (11) 771 9838, 471 9838, F: +94 (11) 230 3197,* www.pwc.com/lk

**Partners** **Y. Kanagasabai FCA, D.T.S.H. Mudalige FCA, C.S. Manoharan FCA, N.R. Gunasekera FCA, S. Gajendran FCA, Ms. S. Hadgie FCA, Ms. S. Perera ACA, T.U. Jayasinghe ACA**

PricewaterhouseCoopers is a member firm of PricewaterhouseCoopers International Limited, each member firm of which is a separate legal entity.

# ආදායම් ප්‍රකාශනය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|---|
| **ආදායම්** | 14 | 10,687,381,356 | 8,959,271,572 |
| වෙනත් ආදායම් | 15 | 426,332,095 | 331,037,860 |
| | | 11,113,713,451 | 9,290,309,432 |
| පරිපාලන ආයතනික සහ අලෙවිකරණ වියදම් | 16 | (6,224,903,211) | (5,733,112,956) |
| මූල්‍ය ආදායම් | 17 | 704,524,415 | 516,415,647 |
| මූල්‍ය පිරිවැය | 17 | (1,734,681,104) | (1,933,883,522) |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | 17 | (1,030,156,689) | (1,417,467,875) |
| **බදු පෙර ලාභය** | | 3,858,653,552 | 2,139,728,601 |
| බදු වියදම | 18 | (1,121,112,099) | (751,113,467) |
| **වර්ෂයේ ලාභය** | | 2,737,541,453 | 1,388,615,134 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂක ගණනයේදී මතුවූ වාසි හෝ පාඩු | 11 | 205,037,774 | 115,632,060 |
| **මුලු වෙනත් විස්තීර්ණ ආදායම්** | | 205,037,774 | 115,632,060 |
| **මුලු විස්තීර්ණ ආදායම්** | | **2,942,579,227** | **1,504,247,194** |
| කොටසක මූලික ඉපැයුම | 19 | 13,687.57 | 6,943.01 |

පිටු 86 - 117 දක්වාවූ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම බැදුනු කොටසක් වේ.

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 81 පිටුවේ

# ශේෂ පත්‍රය

| 2012 දෙසැම්බර් 31 දිනට | | 31 දෙසැම්බර් | | 1 ජනවාරි |
|---|---|---|---|---|
| | සටහන | 2012 | 2011 | 2011 |
| | | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 5 | 39,237,879,476 | 22,799,663,530 | 14,769,417,308 |
| විලම්බිත බදු වත්කම් | 18.2 | 505,784,614 | 547,035,271 | 537,309,175 |
| | | 39,743,664,090 | 23,346,698,801 | 15,306,726,483 |
| **දිගුකාලීන ආයෝජන** | | | | |
| ණයකර වල ආයෝජන | 6 | 2,300,000,000 | 2,300,000,000 | 300,000,000 |
| | | 2,300,000,000 | 2,300,000,000 | 300,000,000 |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | 7 | 274,910,750 | 295,251,328 | 242,014,764 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 8 | 2,787,562,137 | 6,115,098,314 | 7,074,820,194 |
| භාණ්ඩාගාර බිල් පත්වල ආයෝජන බැඳුම්කර මිලදී ගැනීම් ගිවිසුම් සහ ස්ථාවර තැන්පතු | 20 | 4,009,746,027 | 3,943,331,461 | 6,756,450,615 |
| මුදල් සහ බැංකු ශේෂ | 20 | 415,329,515 | 271,415,893 | 271,349,932 |
| | | 7,487,548,429 | 10,625,096,996 | 14,344,635,505 |
| **මුලු වත්කම්** | | **49,531,212,519** | **36,271,795,797** | **29,951,361,988** |
| **ස්කන්ධ සහ වගකීම්** | | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධන හිමියන්ගේ ස්කන්ධ දායකත්වය** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 9 | 20,000,200 | 20,000,200 | 20,000,200 |
| සංචිත | 10 | 892,726,769 | 892,726,769 | 892,726,769 |
| රඳවාගත් ඉපයුම් | | 3,304,317,084 | 361,737,857 | 963,906,263 |
| | | 4,217,044,053 | 1,274,464,826 | 1,876,633,232 |
| **ජංගම නොවන වගකීම් සහ විලම්බිත ආදායම්** | | | | |
| ණය ගැනීම් | 21 | 37,574,198,744 | 27,235,423,554 | 21,511,150,323 |
| විශ්‍රාම පාරිතෝෂික බැඳීම් | 11 | 2,160,743,758 | 2,160,443,789 | 2,019,270,343 |
| විලම්බිත රජයේ ප්‍රදාන | 12 | 1,398,500,574 | 1,590,602,425 | 1,850,921,782 |
| | | 41,133,443,076 | 30,986,469,768 | 25,381,342,448 |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 13 | 2,281,092,148 | 1,808,366,723 | 894,488,536 |
| ණය | 21 | 1,265,000,000 | 1,780,281,966 | 1,517,381,400 |
| ආදායම් බදු වගකීම | | 634,633,242 | 422,212,514 | 281,516,373 |
| | | 4,180,725,390 | 4,010,861,203 | 2,693,386,309 |
| **මුළු වගකීම්** | | 45,314,168,466 | 34,997,330,971 | 28,074,728,756 |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | | **49,531,212,519** | **36,271,795,797** | **29,951,361,988** |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පණතේ විධිවිධානයන්ට අනුකූලබව සහතික කරමි.

**මූල්‍ය ප්‍රධානී**

මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කොට ඉදිරිපත් කිරීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය වගකීම් දරයි. 2013 ජුනි 17 දින අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන වලට අත්සන් තබන ලදී.

**අධ්‍යක්‍ෂ** **අධ්‍යක්‍ෂ**

2013 ජුනි 17 දින අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

පිටු 86 - 117 දක්වාවූ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම බැඳුනු කොටසක් වේ.

ස්වාධීන විගණනවරුන්ගේ වාර්තාව 81 පිටුවේ

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

| | සටහන | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. | වෙනත් සංචිත රු. | රඳවාගත් ඉපයුම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| **2011 ජනවාරි 01 දිනට ශේෂය** | | 20,000,200 | 892,726,769 | 963,906,263 | 1,876,633,232 |
| ගෙවූ ලාභාංශ | 23 | - | - | (2,106,415,600) | (2,106,415,600) |
| වර්ෂයේ ලාභය | | - | - | 1,388,615,134 | 1,388,615,134 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - | - | 115,632,060 | 115,632,060 |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | 20,000,200 | 892,726,769 | 361,737,857 | 1,274,464,826 |
| **2012 ජනවාරි 01 දිනට ශේෂය** | | 20,000,200 | 892,726,769 | 361,737,857 | 1,274,464,826 |
| වර්ෂයේ ලාභය | | - | - | 2,737,541,453 | 2,737,541,453 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - | - | 205,037,774 | 205,037,774 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | | 20,000,200 | 892,726,769 | 3,304,317,084 | 4,217,044,053 |

පිටු 86 - 117 දක්වාවූ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම බැඳුනු කොටසක් වේ.
ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 81 පිටුවේ

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2012 රු. | 2011 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ/(යෙදූ) මුදල් ප්‍රවාහ** | | | |
| ආදායම් බදු වියදම් වලට පෙර ශුද්ධ ලාභය | | 3,858,653,552 | 2,139,728,601 |
| ■ **ගැලපීම්** | | | |
| ක්ෂය කිරීම් | 5 | 1,010,594,589 | 1,134,589,318 |
| විනිමය වාසි /පාඩු | | 1,439,583,076 | 1,652,276,673 |
| ආයෝජන ආදායම් | | (693,098,267) | (505,156,796) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබූ (ලාභය)/අලාභය | | (40,050,005) | (7,555,160) |
| දේපළ, පිරියත හා උපකරණ ලියාහැරීම්/ගැලපීම් | | 8,649,388 | 14,351,064 |
| රජයේ විලම්බිත ප්‍රදානයන් ක්‍රමක්ෂය | 12 | (159,553,262) | (276,841,358) |
| මූල්‍ය පිරිවැය | | 295,098,028 | 281,606,849 |
| පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම සඳහා වෙන් කිරීම | 11 | 340,486,491 | 351,641,091 |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර මෙහෙයුම් ලාභය | | 6,060,363,589 | 4,784,640,282 |
| තොග (වැඩිවීම) / අඩුවීම | | 20,340,578 | (53,236,564) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වල (වැඩිවීම) / අඩුවීම | | 3,326,331,346 | 959,721,880 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වල වැඩිවීම / (අඩුවීම) | | 472,725,424 | 913,878,188 |
| මෙහෙයුම් වලින් ජනිත මුදල් | | 9,879,760,938 | 6,605,003,785 |
| පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම යටතේ ගෙවීම් | 11 | (135,148,748) | (94,835,585) |
| ගෙවූ පොළී | | (295,098,028) | (281,606,849) |
| ගෙවූ ආදායම් බදු | | (867,440,719) | (620,143,420) |
| මෙහෙයුම් ක්‍රියාකරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | 8,582,073,443 | 5,608,417,931 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබූ /(යෙදූ) මුදල් ප්‍රවාහ** | | | |
| දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | (17,457,459,919) | (9,179,744,187) |
| ණයකර ආයෝජන | 6 | - | (2,000,000,000) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබූ මුදල් | | 41,254,836 | 8,112,741 |
| ලැබුණු පොළී | | 693,098,267 | 505,156,796 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබූ /යෙදූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | (16,723,106,816) | (10,666,474,650) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබූ/(යෙදූ) මුදල් ප්‍රවාහ** | | | |
| ගෙවූ ලාභාංශ | | - | (2,106,415,600) |
| ණය ලැබීම් | 21 | 10,164,192,115 | 5,840,884,562 |
| ණය ගෙවීම් | 21 | (1,768,888,004) | (1,509,648,260) |
| වර්ෂය තුළ ලැබූ ප්‍රදාන | | - | 16,522,000 |
| වර්ෂය තුල මහා භාණ්ඩාගාරයට ගෙවීම් | | (32,548,588) | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබූ/යෙදූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | 8,362,755,523 | 2,241,342,702 |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | | 221,722,150 | (2,816,714,017) |
| **වර්ෂ ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | 20 | 4,203,353,392 | 7,020,067,408 |
| **වර්ෂ අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | 20 | 4,425,075,542 | 4,203,353,392 |

පිටු අංක 86 සිට 117 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වලම බැඳුනු කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**1. ආයතනික තොරතුරු**

**1.1 පොදු කරුණු**

සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ නිත්‍ය වාසික සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ පිහිටා ඇත.

**1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය**

ජාත්‍යන්තර පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව ගුවන් තොටුපළ කළමනාකරණය, ශ්‍රී ලංකාව තුළට පැමිණෙන සහ ශ්‍රී ලංකා ගුවන් ගමන් තොරතුරු කලාපය (FIR) තුළින් පියාසර කරන ගුවන් යානා සඳහා ගගන නාවික සේවා සැපයීම සහ ගුවන් තොටුපළ භාවිතා කරන්නන්ට අවශ්‍ය වෙනත් පහසුකම් සැළසීම වර්ෂය තුළ දී සමාගමේ මූලික ක්‍රියාකාරකම් විය.

**1.3 ප්‍රසිද්ධ කිරීම සඳහා අනුමැතිය දුන් දිනය**

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අනුව 2013 ජුනි 17 දින අනුමැතිය ලබා දී තිබේ.

**2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහතින් දකවා ඇත. විශේෂයෙන් සඳහන් කර නොමැති නම් මෙම ප්‍රතිපත්ති සියලුම වර්ෂවල අඛණ්ඩව යොදා ගෙන තිබේ.

**2.1 පිළියෙළ කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව ඊට අනුකූලවන සේ පිළියෙල කොට ඇත. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇති අතර සමහර මූල්‍ය වත්කම් සහ වගකීම් වල සාධාරණ වර්තමාන අගය දැක්වෙන පරිදි අවශ්‍ය සංශෝධන කර තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට සහ පළමු වරට ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවන ලෙස සකස් කර ඇත.

ශ්‍රී ලංකා වාර්තා කරන ප්‍රමිතීන් සහ ගිණුම්කරණ අනුගමනය කිරීමේදී පරිවර්තනය නිසා සමාගමේ මූල්‍ය තත්වයට, කාර්යසාධනයට සහ මුදල් ප්‍රවාහයට වූ බලපෑම කෙසේද යන්න මූල්‍ය ප්‍රකාශන වලට එකතු කර ඇති ඇමුණුම් 1 යටතේ පැහැදිලි කොට ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන්ට අනුකූල වන සේ මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීමට සිදු වෙයි. එසේම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදා ගැනීමේදී කළමනාකාරිත්වය තම තීරණ ක්‍රියාත්මක කළ යුතුවේ. මූල්‍ය ප්‍රකාශන සඳහා වැදගත් වූ උපකල්පන සහ ඇස්තමේන්තු යොදා ගත් ක්ෂේත්‍ර පිළිබඳව සටහන් අංක 4 යටතේ හෙළිදරව් කර ඇත.

මෙම ගිණුම්වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 7 දරන සමාගම් පණතට අනුකූලව සිදු කර ඇත.

**2.1.1 ඒකාබද්ධ කිරීම**

මෙම මූල්‍ය ප්‍රකාශන

(අ) 1971 අංක 38 දරන මුදල් පණතේ 14 (2) (ජ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති විසින් විගණනය කළ ප්‍රාග්ධන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන නියෝජනය කරන වැය ශීර්ෂ අරමුදල් සහ

(ආ) නීතිපතිගේ තීරණය ලැබීමට නියමිත පසුගිය වසර දක්වා වෙනම පිළියෙල කොට ඉදිරිපත් කළ රඳවා ගත් ආදායම් අරමුදල් ඇතුලුව සමාගමේ ඒකාබද්ධ තත්වය ඉදිරිපත් කරයි.

2005 අගෝස්තු 17 දිනැති කැබිනට් පත්‍රිකාවේ 3.5 ඡේදයට අනුව ගුවන් තොටුපළේ වත්කම් සහ වගකීම් සමාගමේ වත්කම් සහ වගකීම් සමඟ ඒකාබද්ධ කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීමක් ලෙස සමාගම ගුවන් සේවා අමාත්‍යාංශයට ඉදිරිපත් කළ ඉල්ලීමක් පදනම් කර ගනිමින් සිවිල් ගුවන් සේවා අධිකාරිය නීතිපතිගේ මතය විමසා තිබේ. ඇත.

කලින් තිබූ ගුවන් තොටුපල අධිකාරිය විසින් දරන ලද වත්කම් වලින් කොටසක් 1983 දී සමාගමට මාරු කිරීමත් සමග අධිකාරිය විසුරුවා සමාගම පිහිටුවීම හේතුවෙන් ඉතිරි වත්කම් සහ වගකීම් ඉහත සඳහන් අරමුදල් දෙකෙහි පැවතීම නිසා කැබිනට් පත්‍රිකාව මගින් එය නිරාකරණය කළ යුතුව තිබුනි.

සමාගමේ සභාපති 2013 ජුනි 4 දින සමාගම තම වත්කම් පමණක් නොව ඉහත සඳහන් අරමුදල් දෙකේම වූ වත්කම් සමාගමේ ආර්ථික ප්‍රතිලාභ වෙනුවෙන් පරිහරණය කරන බැවින් මෙම ඒකාබද්ධ කිරීම අනුමත කරන ලදී.

**2.1.2 අනුකූලතා ප්‍රකාශනය**

2012 දෙසැම්බර් 31 දිනට සමාගමේ ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සමඟ ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් ද ("මූල්‍ය ප්‍රකාශන") ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුකූලව පිළියෙළ කර තිබේ.

### 2.1.3 සන්සන්දනාත්මක තොරතුරු

වෙනත් ආකාරයකින් සඳහන් නොවුනේ නම් හැර සමාගම පසුගිය වර්ෂ වල උපයෝගි කර ගත් ගිණුම් ප්‍රතිපත්ති ඒකාකාරීව අනුගමනය කර ඇත.

### 2.1.4 ගිණුම්කරණ ප්‍රතිපත්තියේ සහ හෙළිදරව් කිරීම් වල වෙනස් වීම්

නව ප්‍රමිතීන් සංශෝධන සහ අර්ථනිරූපන නිකුත් වූ නමුත් 2012 ජනවාරි 1 දිනෙන් ආරම්භවූ මූල්‍ය වර්ෂය පටන් ගැන්මේදී ඒවා බල නොපාන ලදී.

ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිති 9 'මූල්‍ය උපකරණ' මගින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ග කිරීම මැනීම සහ හඳුනා ගැනීම ගැන කථා කරයි. මෙම ප්‍රමිත 9 මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මැනීම ගැන කථා කළ ගිණුම්කරණ ප්‍රමිත 39 කොටසක් ලෙස සම්පාදනය කොට ඇත. ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිත 9 යටතේ මූල්‍ය වත්කම් සාධාරණ අගයක් ලෙස මනින ලද සහ ක්‍රමක්ෂය පිරිවැය ලෙස මනින ලද වශයෙන් කොටස් දෙකකට වර්ගීකරණය කරයි. තීරණය කිරීම මූලික පිළිගැනීම මත කෙරී ඇත. වර්ගීකරණය රඳාපවතින්නේ තම මූල්‍ය උපකරණ සහ මුදල් ප්‍රවාහ ස්වභාවය පාලනය කිරීම සඳහා වූ ආයතනයේ ව්‍යාපාරික ආකෘතිය අනුවය. මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ප්‍රමිතිය බොහෝ දුරට ගිණුම්කරණ ප්‍රමිත 39 මතම රැඳී සිටියි. සාධාරණ අගය යන පදනම මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ගනු ලබන අවස්ථාවක ආයතනයේ ණය අවදානමක් නිසා ඇතිවූ වෙනසින් කොටසක් ආදායම් ප්‍රකාශනයේ දක්වනවා වෙනුවට ගිණුම්කරණමය අයෝග්‍යතාවයක් මතුනොවන්නේ නම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වාර්තා කරයි. ප්‍රධාන වෙනස මෙයයි. සමාගම තවදුරටත් ශ්‍රී ලංකා වාර්තාකරන ප්‍රමිත 9 හි පූර්ණ බලපෑම ඇස්තමේන්තු කරමින් සිටින අතර 2015 ජනවාරි 1 දිනෙන් ඇරඹෙන වර්ෂයේ සිට මෙය යොදා ගැනීමට අදහස් කරයි.

සාධාරණ අගය මැනීම මත වූ වාර්තාකරන ප්‍රමිත 13 ඉලක්ක කොට ඇත්තේ සාධාරණ අගය යන්නට නියත නිර්වචනයක් සැපයීම සාධාරණ අගය මැනීමේ එක් මූලාශ්‍රයක් ඉදිරිපත් කිරීම හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සැපයීම මගින් සංකීර්ණභාවය අඩුකිරීමට සහ සංගතභාවය වැඩි දියුණු කිරීමටත්ය. මෙම ප්‍රමිතියේ සම්පූර්ණ බලපෑම කළමනාකාරිත්වය විසින් තවදුරටත් ඇස්තමේන්තු කරමින් සිටියි.

සමාගම වෙත ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරන වෙනත් ප්‍රමිතීන් සංශෝධනයන් හෝ අර්ථ නිරූපනයන් නොමැත.

## 2.2 විදේශ විනිමය පරිවර්තන

(අ) භාවිත සහ ඉදිරිපත් කරන මුදල් ඒකකය

මූල්‍යමය ප්‍රකාශන තුල ඇතුලත්වන්නාවූ අයිතමයන් සමාගම මෙහෙයවන ප්‍රාථමික ආර්ථික පරිසරයක මුදල් පදනම් කරමින් මැන තිබේ. (භාවිත මුදල්) මූල්‍ය ප්‍රකාශන සමාගමේ භාවිත සහ ඉදිරිපත් කිරීමට භාවිතා වූ මුදල් ඒකක ශ්‍රී ලංකා රුපියල් වලින් පිළියෙල කොට ඇත.

(ආ) ගණුදෙනු සහ ශේෂ

විදේශ විනිමය ගනුදෙනු, එම ගනුදෙනු සිදු වූ අවස්ථාවේ තිබූ විනිමය හුවමාරු අනුපාතයට ගළපා ඉදිරිපත් කර තිබේ. එවැනි ගනුදෙනු පියවීමේ දී ඇතිවූ විදේශ විනිමය වාසි හෝ පාඩු ආදායම් ප්‍රකාශනයේ හඳුන්වා දී ඇත. විලම්බිත විස්තීර්ණ ආදායම් මුදල් ප්‍රවාහ සීමා සහ ආයෝජන සීමා යටතේ දක්වා තිබේ.

ණය සම්බන්ධ විදේශ විනිමය පාඩු හෝ වාසි සහ මුදල් හා මුදල් සමාන දෑ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම් හෝ මූල්‍ය පිරිවැය යටතේ ඉදිරිපත් කර ඇත. අනෙකුත් සියලු විදේශ විනිමය වාසි හෝ පාඩු ආදායම් ප්‍රකාශනයේ වෙනත් පාඩු හෝ වාසි - ශුද්ධ යටතේ දක්වා ඇත.

විකිණීම සඳහා ඇති විදේශ මුදල් වල හඳුන්වා ඇති මුදල් සුරැකුම් වටිනාකමෙහි වෙනස්කම් ක්‍රමක්ෂය පිරිවැයෙහි වෙනස්වීම සහ සුරැකුම් ධාරන වටිනාකමෙහි වෙනස්වීම ලෙස විශ්ලේෂණය කර ඇත. ක්‍රමක්ෂය පිරිවැය වෙනස් වීමට අදාල වෙනස්කම් ආදායම් ප්‍රකාශනයේ හඳුන්වා දී ඇති අතර ධාරන අගයේ වූ වෙනත් වෙනස් වීම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වා ඇත.

මුදල්මය නොවන වත්කම් සහ වගකීම් වල පරිවර්තනීය වෙනස්කම් සාධාරණ වටිනාකමේ වූ පාඩු හෝ වාසි ලෙස හඳුනාගෙන ඇත. විකිණීම සඳහා ඇති ස්කන්ධ වැනි මුදල්මය නොවූ මූල්‍ය වත්කම් වල සිදුවූ පරිවර්තන වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වා තිබේ.

## 2.3 ප්‍රවර්තන සහ විලම්බිත ආදායම් බදු

කාලපරිච්ඡේදය සඳහා බදු වියදම ප්‍රවර්තන සහ විලම්බිත බදු වලින් යුක්ත වේ. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුවම ස්කන්ධ වල හඳුනා ගත් අයිතම් හැර බදු ආදායම් ප්‍රකාශනයේ දක්වා ඇත. මේ තත්වය යටතේ බදු පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුව ස්කන්ධ යටතේත් හඳුන්වා ඇත.

ප්‍රවර්තන ආදායම් බදු පවත්නා බදු නීති හෝ ශේෂ පත්‍ර දිනය වනවිට සම්පාදනය කළ නීති මත ගණනය කර ඇත.

කළමනාකාරිත්වය අදාල කර ගත යුතු බදු නීති සමග බදු වාර වාර්තා කාලීනව ඇගයීමකට බදුන් කරයි. ඒ අනුව බදු අධිකාරීන් වෙත ගෙවිය යුතු බදු සඳහා ප්‍රතිපාදන සලසවයි.

විලම්බිත ආදායම් බදු ප්‍රතිපාදන සළසා ඇත්තේ වගකීම් ක්‍රමයට අනුව වත්කම් සහ වගකීම් වල බදු පදනමේ සහ මූල්‍ය වාර්තා වල ධාරන වටිනාකමේ අතර ඇති තාවකාලික වෙනස්කම් හඳුනාගනිමිනි. කෙසේ වුවද කීර්තිනාමය හඳුනා ගැනීමේදී මතුවන්නක් නම් විලම්බිත බදු සඳහා වෙන් කිරීමක් නොමැත. ව්‍යාපාර සංයෝජනයක් සිදු නොවන අවස්ථාවක දී හඳුනා ගන්නා ලද මූලික වත්කම් හා වගකීම් මත සහ ගණුදෙනු සිදුවන අවස්ථාවේ දී ගිණුම්කරන හෝ බදු ලාභයට බලපෑමක් ඇති නොකරන අවස්ථාවන්හි දී හැර බද්දට යටත් තාවකාලික වෙනස්කම් මත ඇතිවන විලම්භිත බදු වගකීම හඳුනාගත යුතුය. විලම්බිත ආදායම් බදු වත්කම් හා වගකීම් ගණනය කර ඇත්තේ වර්ෂය තුළ දී උපලබ්ධි වූ වත්කම් හා නිදහස් කරන ලද වගකීම් සඳහා අදාළ කර ගැනීමට බලාපොරොත්තු වන ශේෂ පත්‍ර දිනට පනවන ලද හෝ පැනවීමට ඉදිරිපත් කර ඇති බදු අනුපාතයන් (සහ බදු නීතිය) භාවිතා කරමින්ය.

විලම්බිත ආදායම් බදු වත්කම් හඳුනාගෙන ඇත්තේ තාවකාලික වෙනස්කම් මත බදු අයකළ හැකි අනාගත ලාභ ප්‍රමාණය අනුවය. ප්‍රවර්තන වත්කම් ප්‍රවර්තන වගකීම් වලට එරෙහිව පියවීමට හැකි නීති ඇති විට සහ එය එකම බදු අධිකාරියට සම්බන්ධ වූ විට විලම්බිත බදු වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් කළ හැකිය.

## 2.4 තොග

යල්පැන ගිය සහ සෙමින් සංචලනය වන තොග සඳහා ගැළපීම් කිරීමෙන් පසු, තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකන් අඩු අගයට ගණනය කර ඇත.

2003.12.31 දිනට පෙර මිල දී ගත් ගිනි නිවීම් උපකරණ වල අමතර කොටස් සහ පරිභෝජන ද්‍රව්‍ය තක්සේරු කළ වටිනාකමට දක්වා ඇති අතර, ඉන් පසුව භරිත සාමාන්‍ය ක්‍රමයට අගය කර තිබේ.

ඉන්ධන ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයට අගය කර ඇති අතර, අනිකුත් තොග වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දැරූ සියලු පිරිවැය භරිත සාමාන්‍ය ක්‍රමය භාවිතා කරමින් ගිණුම්ගත කර තිබේ.

වසර 10 කට වඩා සංචලනය නොවූ තොග සඳහා සමාගම ප්‍රතිපාදන සළසා තිබේ.

## 2.5 වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ සාධාරණ අගයකට හඳුනා ගන්නා අතර පසුව හානිවීම් සඳහා අඩුකොට ඵලදායි පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැය ට හඳුනාගෙන ඇත.

වෙනත් ලැබිය යුතු දෑ බොල් හා අඩමාණ ලැබිය යුතු දෑ වෙනුවෙන් ගැලපීම් කිරීමෙන් පසු පිරිවැයට ගිණුම්ගත කර ඇත.

## 2.6 මුදල් සහ මුදල් සමාන දෑ

අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයක් ඇති කෙටි කාලයක් තුළ අගය වෙනස්වීමේ අවම අවදානමකට ලක් විය හැකි මුදල් ප්‍රමාණයකට පහසුවෙන් පරිවර්තනය කළ හැකි දෑ මුදල් හා මුදල් සමාන දෑ ලෙස නිර්වචනය කෙරේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ වල අඩංගු වන්නේ බැංකු අයිරාව අඩුකළ ශුද්ධ බැංකු ශේෂ, බැංකු තැන්පතු සහ අතැති මුදල්ය. කෙටි කාලීන ආයෝජන, එනම් අත්පත් කර ගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු ආයෝජන ද මුදල් හා මුදල් සමාන දෑ ලෙස සළකා ඇත.

## 2.7 දේපළ, පිරියත හා උපකරණ

සියළු දේපළ පිරියත සහ උපකරණ පිරිවැයට දක්වා ඇති අතර එයින් සමුච්චිත ක්ෂය වටිනාකම අඩු කර පෙන්වා ඇත. වත්කම් සෘජුව අත්පත් කර ගැනිමේ පිරිවැය සහ අයිතමයන් ගලවා ඉවත්කිරීම සඳහාවූ පිරිවැය සහ ඒවා ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වැය කරන ලද පිරිවැය මෙන්ම එම අයිතමය අත්පත් කර ගැනීමේදී හෝ අදාල කාලය තුල තොග වශයෙන් හැර එය භාවිතා කිරීම වෙනුවෙන් දැරූ යම් දෙයක් ඇත්නම් එයද ඓතිහාසික පිරිවැය තුල ඇතුලත් වේ.

ඉදිකළ වත්කම් වල වටිනාකම සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සුදුසු පොදු කාර්ය වියදම් වලින් සමන්විත වේ.

වත්කමේ ධාරන අගයට පසුව පිරිවැයක් එකතු වුයේ නම් එය සුදුසු පරිදි වෙනම වත්කමක් ලෙස හඳුනා ගන්නේ අනාගත ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හැකියාවක් ඇති සහ එය විශ්වාසයෙන් යුතුව මැනිය හැකි විට පමණි. ප්‍රතිසම්පාදනය කළ කොටසේ ධාරන අගය වෙනම හඳුනා ගනී. සියලුම අලුත්වැඩියා සහ නඩත්තු වියදම් එය සිදු කළ මූල්‍ය වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරයි.

දීර්ඝකාලීන ප්‍රාග්ධන ව්‍යාපෘති පිරිවැය අදාල වත්කම ප්‍රයෝජනයට ගත හැකි තත්වයට පත්වන තුරු නොනිමි ප්‍රාග්ධන ව්‍යාපෘති ලෙස ඉදිරියට ගෙන යයි.

දේපළ පිරියත සහ උපකරණ එම වත්කම් වල ප්‍රයෝජනයට ගැනීම ආරම්භ කළ තැන් සිට ඉවත් කරන තුරු එම වත්කම අක්‍රියව පැවතුනත් ක්ෂය කිරීම පටන් ගනියි.

දේපළ පිරියත සහ උපකරණ වල සෑම කොටසකම පිරිවැය මුලු වියදමට අනුව ගත්කළ වැදගත් වේ නම් ක්ෂය කිරීම සඳහා වෙනම කොටසක් ලෙස සලකයි.

ඉඩම් ක්ෂය කරනු නොලබයි. අනෙකුත් වත්කම් සඳහා ක්ෂය සරලමාර්ග ක්‍රමයට අනුව ගණනය කරන අතර ඒවායේ පිරිවැය ප්‍රයෝජනවත් ජීවිත කාලයෙන් පසු සුන්බුන් වටිනාකම ආදිය සටහන් අංක 5.2 යටතේ විස්තර කර ඇත.

වත්කමක ධාරන අගය එහි ආවරණය කර ගත හැකි අගයට වැඩි නම් ක්ෂණිකව එහි ආවරණිත අගයට ලියා හරිනු ලැබේ.

ප්‍රධාන පරීක්ෂණ ක්‍රියාත්මක කරන විට හඳුනාගැනීමේ මිනුම් සෑහීමට පත්විය හැකි නම් එය ප්‍රතිසම්පාදනයක් ලෙස සලකයි.

දේපළ, පිරියත සහ උපකරණ විකිණීමක් මගින් ඉවත් කළ අවස්ථාවේ දී හෝ ඒවා භාවිතයෙන් හෝ විකිණීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොමැති අවස්ථාවන්හි දී ඒවා පොත් පත් වලින් ඉවත් කරනු ලැබේ. මෙසේ පොත් වලින් ඉවත් කිරීමේ දී ඇති වන ලාභය හෝ අලාභය (වත්කමේ ඉදිරියට ගෙන ආ අගය සහ ශුද්ධ විකුණුම් වටිනාකම අතර වෙනස) වත්කම් ඉවත් කළ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ගළපනු ලැබේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම, වත්කම්වල සුන්බුන් අගය, ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමය සමාලෝචනය කරන අතර යෝග්‍ය වන අවස්ථාවක දී ඊට ගැළපුම් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම සිදු කරයි.

ඉවත්කිරීමේ ලාභ හෝ පාඩු වත්කමේ ධාරන වටිනාකම සහ ලැබූ මුදල සැසඳීමෙන් තීරණය කරනු ලබන අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් හෝ පාඩු ලෙස සඳහන් වේ.

දේපළ පිරියත සහ උපකරණ හානි වීම්
දේපළ පිරියත උපකරණ වල ධාරන අගය ඒවා වෙනස් වීමකදී ආවරණය කර ගත නොහැකි විට නැවත සමාලෝචනය කරනු ලැබේ. ධාරන අගය අපේක්ෂිත යළි ලබා ගැනීමේ අගයට වැඩි වන අවස්ථාවකදී යළි ලබා ගැනීමේ ප්‍රමාණයට ලියා හරිනු ලැබේ. හානි වීමෙන් පාඩු එම වත්කමේ පූර්ව ප්‍රත්‍යාගණන අතිරික්තයන් වෙන්කර ගලපා නැත්නම් ආදායම් ප්‍රකාශනයට කපා හරිනු ලැබේ.

## 2.8 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය ලෙස වර්ග කර ඇත.

## 2.9 වෙළඳ ගෙවිය යුතු දෑ

වෙළඳ ගෙවිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී සැපයුම් කරුවන්ගෙන් ලබා ගත් භාණ්ඩ හා සේවා සඳහා ගෙවීමට වූ බැඳීමයි. වගකීම ශේෂ පත්‍රයේ වෙළඳ සහ වෙනත් ගෙවියයුතු දෑ ලෙස වර්ග කර ඇති අතර වර්ෂය තුල සමතයකට පත් කළ යුතුවේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ග කොට දක්වා ඇති වගකීම් ශේෂ පත්‍ර දිනෙන් පසුවත් ඉදිරියට පවතී.

වෙළඳ ගෙවියුතු දෑ මූලික වශයෙන් ගනුදෙනු මිල අනුව හඳුනා ගන්නා අතර පසුව සඵල පොළී ක්‍රමය මත ක්‍රමක්ෂය වියදමට මනිනු ලැබේ.

## 2.10 ණය ගැනීම්

ණය ගැනීම් ගනුදෙනුව සිදු වූ ශුද්ධ අගයට හඳුනාගෙන ඇත. ණය ගැනීම් පසුව ක්‍රමක්ෂය පිරිවැයට සඳහන් කරයි. සඵල පොළී ක්‍රමය යටතේ ශුද්ධ ගනුදෙනු පිරිවැයෙහි වෙනසක් වූයේ නම් එය විස්තීර්ණ ආදායම් යටතේ දක්වයි.

ණය පහසුකම් ලබා ගැනීම සඳහා ගෙවන ලද ගාස්තු එය සිදු විය හැකි නම් පහසුකම ලබා ගැනීමට එකතු කරයි. මෙහිදී සියලුම ලබා ගැනීම් අවසන් වන තුරු ගාස්තු විලම්භනය කරනු ලැබේ. සියලු පහසුකම් ලබා ගැනීම පිළිබඳ සාක්ෂි නොමැති විට එම පහසුකම අයත් කාල පරිච්ඡේදයේ කලින් ගෙවීමක් ලෙස ගාස්තු ප්‍රාග්ධනිත කරනු ලබයි.

## 2.11 ණය පිරිවැය

පාවිච්චිය සඳහා සූදානම් කිරීමට ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය අත්පත් කරගැනීම් ඉදිකිරීම් සහ නිෂ්පාදනය කිරීම් සඳහා වූ පොදු සහ විශේෂිත ණය ගැනීම් පිරිවැය එම වත්කම් වල පිරිවැයටම එකතු කරයි.

කෙටි කාලීන ආයෝජන මත ඉපයූ ආදායම් වෙනුවෙන් වූ වියදම් ප්‍රාග්ධනිත කල හැකි ණය පිරිවැයෙන් අඩු කොට දක්වයි.

අනෙකුත් සියලුම ණය පිරිවැය ඒවා සිදු වූ කාලපරිච්ඡේදයේදී ලාභය හෝ පාඩුව ලෙස හඳුනා

ගනියි.

## 2.12 ප්‍රතිපාදන

සමාගම විසින් ප්‍රතිපාදන ගිණුම් ගත කර ඇත්තේ ප්‍රවර්තන බැඳියාවක් ඇති පසුගිය සිදුවීමක් සම්බන්ධයෙන් සම්පත් පිටතට ගලායාමක් සහ ආර්ථික වාසි අහුරාලීමක් ඇති, ස්ථිර ලෙසම බැඳීම් නිදහස් කිරීමක් කළ යුතු හා විශ්වාස කළ හැකි ආකාරයෙන් බැඳීම් වල වටිනාකම ඇස්තමේන්තු කළ හැකි අවස්ථාවන් සඳහාය. මුදලට ඇති කාලයේ වෙනස්වීම මත ඇති බලපෑම ප්‍රමාණාත්මක නම්, අපේක්ෂිත අනාගත බදු පෙර මුදල් ප්‍රවාහයන් වට්ටමක් කර ඒ සඳහා ප්‍රතිපාදන සළසා ඇත. එයින් පිළිබිඹු වන්නේ වර්තමාන වෙළඳපොලේ තක්සේරුව මත මුදලට ඇති කාලීන වටිනාකම් පදනම් කරගෙන අවශ්‍ය තැන්හි දී වගකීම් සම්බන්ධයෙන් නියත අවදානමක් ඇත්නම් සහ වට්ටම් කිරීම සිදු කර ඇති බවය. කාලයේ වෙනස්වීම නිසා ඇතිවන බලපෑම පොලී වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ප්‍රතිපාදන වටිනාකම වැඩි වී ඇත.

## 2.13 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

**නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය**

පාරිතෝෂිකය නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ ව්‍යවස්ථාවේ කොන්දේසි ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට සමාගම බැඳී පවතී. මෙම වගකීම ඉටු කිරීම සඳහා සියළුම සේවකයින් වෙනුවෙන් සේවයේ යෙදෙන පළමු වර්ෂයේ සිටම සම්පූර්ණ කරන ලද වසරක් වෙනුවෙන්, සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම අවසන් මසක සම්පූර්ණ වැටුප පදනම් කරගත් සමාන අගයක වෙන් කිරීමක් ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙනයනු ලැබේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම ලෙස ශේෂපත්‍රයේ දක්වා ඇති වගකීම ගැලපිලි සහ හඳුනා නොගත් සේවා පිරිවැය සමග ශේෂ පත්‍ර දිනට වූ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන අගයයි.

සමාගම පොරොන්දු වූ පාරිතෝෂික ප්‍රතිලාභ වල වර්තමාන අගය සේවක ප්‍රතිලාභ නම් වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 (2006 සංශෝධිත) හි ඇමුණුම් ඊ යටතේ දැක්වෙන සූත්‍රය අනුව ඇස්තමේන්තු ගත ඒකක බැර ක්‍රමය පදනම් කොට ගෙන වාර්ෂිකව මනිනු ලබයි.

උපකල්පනයන්ගේ වෙනස් වීම් මත මතුවන වාසි හෝ පාඩු හඳුනාගත් සැණින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වයි.

**නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල**

සේවා නියුක්තියන් අදාළ ආඥා පනත් හා නියමයන්හි පෙන්නුම් කරන පරිදි සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක වීමට හිමිකම් ඇත. සමාගමේ සේවකයින්ගේ දළ වැටුපෙන් 12% ක් සේවක අර්ථ සාධක අරමුදලට හා 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට සමාගම විසින් බැර කරනු ලැබේ.

## 2.14 ප්‍රදානයන් හා සහනාධාරයන්

වත්කම් වලට සම්බන්ධ මූල්‍ය ප්‍රදාන පිරිවැය ලෙස හඳුනාගෙන ශේෂ පත්‍රයට විලම්බනය කරන අතර වත්කමේ ඵලදායි ජීවිත කාලය තුළ ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

## 2.15 මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීම

අවිනිශ්චිත ප්‍රයෝජනවත් ආයු කාලයක් ඇති වත්කම් (උදාහරණයක් ලෙස කීර්තිනාමය හෝ පාවිච්චි කිරීමට සූදානමක් නොමැති වත්කම්) වල අගය අඩුකිරීමක් හෝ ක්‍රමක්ෂය කිරීමක් අවශ්‍ය නොවේ. ක්‍රමක්ෂය සඳහා යටත් වන වත්කම් ඒවායේ ධාරන අගය නැවත ලබා ගත නොහැකි යයි හැඟෙන විට සමාලෝචනය කරනු ලැබේ. වත්කම් වල නැවත ලබා ගත හැකි අගයට වඩා ඉදිරියට ගෙන ආ අගයන්ගේ වැඩිවීමක් තිබේ නම් එම වත්කම් වල අගය අඩුවීමක් ලෙස එහි අගය නැවත ලබා ගත හැකි අගය දක්වා ලියා හරිනු ලැබේ. ඇස්තමේන්තු ගත අගය වත්කමේ සාධාරණ අගයෙන් එය විකිණීමට හෝ පාවිච්චි කිරීමේ දී දැරූ පිරිවැයට වඩා වැඩිය. අගය අඩුවීම තක්සේරු කිරීමේ අරමුණ සඳහා හඳුනා ගත හැකි මුදල් ප්‍රවාහ (මුදල් ජනිත ඒකක) අනුව පහළ මට්ටමේ සිට පෙල ගස්වනු ලැබේ. කීර්තිනාමය හැර මූල්‍ය නොවන වත්කම් වල අගය අඩු වීමක් ඇත්නම් සෑම වාර්තා කරන දිනයක් වෙනුවෙන්ම අවශ්‍ය ගැලපුම් සඳහා සමාලෝචනය කරනු ලැබේ.

## 2.16 මූල්‍ය වත්කම්

### 2.16.1 වර්ගීකරණය

සමාගම එහි මූල්‍ය වත්කම් ලාභ හෝ පාඩු මත සාධාරණ අගයකට, ණය සහ ලැබියයුතුදෑ, විකිණීම සඳහා ඇති, කල් පිරෙන තෙක් රඳවා ගත් වශයෙන් වර්ගීකරණය කරයි. මූල්‍ය වත්කම් අත්පත් කර ගන්නා අරමුණ මත වර්ගීකරණය රඳා පවතියි. මූල්‍ය වත්කම් එහි ආරම්භක හඳුනාගැනීම අනුව වර්ගීකරණය කළමනාකාරිත්වය විසින් තීරණය කරනු ලබන අතර සෑම වාර්තා දිනයකදීම එය නැවත අගය කරනු ලැබේ.

(අ) ලාභ හෝ පාඩු මත සාධාරණ අගයකට මූල්‍ය වත්කම් වර්ග කිරීම

මෙම වර්ගයට අයත් වත්කම් වන්නේ කළමනාකාරිත්වය කෙටිකාලයක් තුල විකිණීමේ අරමුණින් අතපත් කරගත් වත්කම්ය. මෙම වර්ගයේ වත්කම් ජංගම වත්කම් යටතේ පෙන්වන අතර මාස 12 ක කාලයක් ඇතුලත පියවීමට බලාපොරොත්තු වේ. එසේ නොමැති වුවහොත් ඒවා ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කරයි. මින් වෙනස් වන වර්ගද ඇවුරුමක් වී නොමැති නම් ලාභ හෝ පාඩු හරහා සාධාරණ අගයක් ලෙස වර්ග කරයි.

(ආ) ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබි යුතු දෑ යනු ක්‍රියාකාරී වෙළඳ පල තුල නොකියවෙන ස්ථාවර ගෙවීමක් සහිත වෙනස් නොවන මූල්‍ය වත්කම් වේ. වාර්තාකරන දිනයේදී පරිණත වීමට මාස 12 කට වැඩි කාලයක් ගන්නා වත්කම් හැර මෙම වත්කම් ජංගම වත්කම් යටතේ දක්වයි. පරිණත වීමට මාස 12 කට වැඩි කාලයක් ගන්නා වත්කම් ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කරයි. සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ ශේෂ පත්‍රයේ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ මුදල් සමාන දෑ යන වර්ග දෙකෙන් සමන්විත වේ.

(ඇ) විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් එක්කෝ මෙම වර්ගය යටතේ දැක්වෙන හෝ වෙනත් වර්ග යටතේ නොදැක්වෙන වත්කම් වේ. ශේෂ පත්‍රදිනයේ සිට මාස 12 ක කාලයක් තුල ඒවා විකිණීමට කළමනාකරණය තීරණය කර නොමැති නම් මෙම වත්කම් ජංගම නොවන වත්කම් යටතේ දක්වයි.

(ඈ) පරිණත වන තෙක් තබා ගන්නා ආයෝජන

පරිණත වන තෙක් තබා ගන්නා ආයෝජන ස්ථිර හෝ තීරණය කළ ගෙවීමක් සහිත වෙනස් නොවන වත්කම් වේ. ස්ථාවර පරිණත භාවය යනු පරිණත වන තෙක් තබා ගැනීමට ආයතනයට ඇති හැකියාව සහ කැමැත්තයි.

2.16.2 මූල්‍ය වත්කම් හඳුනා ගැනීම සහ මැනීම

මූල්‍ය වත්කම් වල මිලදී ගැනීම සහ විකිණීම සමාගම ඒ සඳහා සම්බන්ධ වන වෙළඳ දිනට හඳුනාගනියි. ආයෝජන ආරම්භයේ ගනුදෙනු පිරිවැය ඇතුලත් සාධාරණ අගයකට හඳුනා ගනියි. ලාභ හෝ පාඩු මත සාධාරණ අගය කීරණය කළ වත්කම් වලට අදාල ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගෙන ඇත. මූල්‍ය වත්කම් යලි අත්පත් කර ගන්නේ ආයොජන කල් ඉකුත් වී අවදානම හිමිකාරිත්වයට මාරු වූවිට පමණි. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සහ ලාභ හෝ පාඩු මතින් ඇතිවන මූල්‍ය වත්කම් පසුව සාධාරණ අගයකට ලියා හරියි. ණය සහ ලැබිය යුතු දෑ සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ලියා හරියි.

ලාභ හෝ පාඩු හරහා සාධාරණ අගයකට වර්ග කරන මූල්‍ය වත්කම් වල සාධාරණ අගයේ වෙනස නිසා ඇති වන වාසි හෝ පාඩු ආදායම් ප්‍රකාශනයේ ලාභ හෝ පාඩු - ශුද්ධ යන ශීර්ෂය යටතේ ඉදිරිපත් කරයි.

ලාභ හෝ පාඩු මතින් සාධාරණ අගයක් ලෙස සැලකෙන මූල්‍ය වත්කම් වලින් ලැබෙන ලාභාංශ ආදායම් ගෙවීම් ලැබීම තහවුරු වූවිට ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් වල කොටසක් ලෙස හඳුනා ගැනේ.

මූල්‍ය සහ මූල්‍ය නොවන සුරැකුම් වල සාධාරණ අගයේ වෙනස් වීම් විකිණීම සඳහා ඇති සේ වර්ග කොට ඇති අතර වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වා තිබේ. විකිණීම සඳහා ඇති ගනයට වර්ග කළ සුරැකුම් විකුණු හෝ අගය අඩු වූ අවස්ථාවක සමුච්චිත වටිනාකම් ගැලපීම ස්කන්ධ යටතේ හඳුනා ගන්නා අතර ආයෝජන සුරැකුම් වල ලාභ හෝ පාඩු ලෙස ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් වේ.

විකිණීම මත ඇති සුරැකුම් වල පොලිය සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ගණනය කරන අතර ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් වල කොටසක් ලෙස දැක්වේ. විකිණීම සඳහා ඇති ස්කන්ධ උපකරණ මත ලාභාංශ සමාගමට එය ලැබීමේ අයිතිය තහවුරු වූ විට ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් වල කොටසක් ලෙස හඳුනා ගනියි.

## 2.17 මූල්‍ය වත්කම් හානිකරණය

(අ) ක්‍රමක්ෂය පිරිවැයට වත්කම් පෙන්වීම

සමාගම විසින් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩ වල අගය අඩුවීමක් සිදු වී තිබේ දැයි යන්න ගිණුම් ප්‍රකාශන පිළියෙළ කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩ වල අගය අඩුවීමක් හෝ පාඩුවක් සිදු වී ඇත්නම් මූලික හඳුනා ගැනීමෙන් පසු එවැනි පාඩුවක් (පාඩු සිදුවීමක්) සහ පාඩු සිදුවීම (සිදුවීම්) ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ මත බලපාන්නේ නම් එය විශ්වාසදායි ලෙස තක්සේරු කළ හැකිය.

අගය අඩු වීමේ සාක්ෂි ලෙස ණය ගැතියන් හෝ ණයගැති කාණ්ඩ වල සැලකිය යුතු මූල්‍ය අපහසුතා පොළී හෝ මූලික මුදල විලම්බනය වීම හෝ පැහැර හැරීම බුන්වත් වීමේ සම්භාවිතාව හෝ වෙනත් අපහසුතා සහ නිරීක්ෂණය කළ දත්ත මගින් අනාගත මුදල් ප්‍රවාහ වල අඩුවීමක් දැක්වීම ආදිය ඇතුලත් වේ.

ණය සහ ලැබිය යුතු දෑ වර්ගය සඳහා පාඩු ප්‍රමාණය වත්කමේ ධාරන අගය සහ මූල්‍ය වත්කම් වල සඵල

